වාර්ෂික වාර්තාව | 2023



ශ්‍රී ලංකා වරාය අධිකාරිය

අපගේ දැක්ම

“ගෝලීය සමුද්‍රීය හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක තත්ත්වය මුදුන්පත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ගාමක ආයතනය බවට පත්වීම”

අපගේ මෙහෙවර

“සියළුම සේවාලාභී ආයතන වෙත ජාත්‍යන්තර මට්ටමේ වරාය පහසුකම් හා සේවා සැපයීම මගින් ජාතික ආර්ථික සංවර්ධනයට දායක වීම”

පටුන

අපගේ ආයතනික අරමුණු	3
අපගේ ආයතනික ක්‍රමෝපායයන්	4
අපගේ මෙහෙයුම් මූලධර්ම	5
ශ්‍රී ලංකා වරාය අධිකාරිය යනු	6
මෙහෙයුම් වැදගත් තොරතුරු	7
මූල්‍ය වැදගත් තොරතුරු	10
අපේ අමාත්‍යවරු	11
සභාපතිතුමාගේ සමාලෝචනය	12
අධ්‍යක්ෂ මණ්ඩලය	18
කළමනාකාරීත්ව කමිටුව	25
ව්‍යාපාර සංවර්ධන	28
සංවර්ධන ව්‍යාපෘති	30
මෙහෙයුම් සමාලෝචනය	39
මූල්‍ය සමාලෝචනය	63
මානව ප්‍රාග්ධනය	68
ආයතනික පාලන වාර්තාව	69
වැදගත් සංධිස්ථාන	71
වරාය සංඛ්‍යාලේඛන	78
මූල්‍ය ප්‍රකාශන	83
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	84
මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම	86
විගණන කමිටු වාර්තාව	87
ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය	91
වැදගත් මෙහෙයුම් කරුණු	92
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	93
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	94
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය	95
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය	97
පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති	98
මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන්	119
ප්‍රස්ථාරික සමාලෝචනය	143
විගණකාධිපති වාර්තාව	145
ආයතනික තොරතුරු	163

අපගේ ආයතනික අරමුණු

2022 - 2024 සැලසුම්ගත කාලසීමාව තුළ පහත සඳහන් අරමුණු හත (07) සාක්ෂාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉදිරියට ගමන් කරනු ඇත:

1. පොදුකාර්ය ව්‍යුහ හා උපරී කාර්ය ව්‍යුහ නවීන තාක්ෂණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය නව්‍යතාවයෙන් යුතුව වැඩි දියුණු කිරීම තුළින් සුහුරු වරායක් නිර්මාණය කිරීම.

2. ඉදිරි තෙවසර තුළ වරාය ශ්‍රේණිගත කිරීම් වල හොඳම බහළු වරායයන් විස්ස (20) අතරට කොළඹ වරාය ගෙන ඒම.

3. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඵලදායීතාවය, සේවා ගුණාත්මකතාවය හා කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා මානව ප්‍රාග්ධනයේ නිපුණතාවය වැඩි දියුණු කිරීම.

4. ධනාත්මක ව්‍යාපාර සබඳතාවන් ශක්තිමත්ව ගොඩනැගීම සඳහා සියළුම වරාය ආශ්‍රිත ව්‍යාපාරික ආයතන, නැව් සමාගම් සහ රජයේ ආයතන වල සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම.

5. අවම පිරිවැයකින් උපරිම වටිනාකමක් අත්පත් කර ගැනීම සඳහා සේවාලාභී පදනම, ව්‍යාපාර ධාරිතාවය සහ පිරිවැටුම වැඩි දියුණු කිරීම.

6. ආයතනික විශේෂිත පාලන කාර්යරාමුව, පද්ධති සහ කාර්යපටිපාටි දියුණු කිරීම.

7. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (UNSDGs) හා අනුගත වෙමින් කොළඹ වරායට හරිත සහ තිරසර තත්ත්වය ලභාකර ගැනීම.

පහත දැක්වෙන්නේ සංස්ථාපිත අරමුණු හා දිගුකාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගනු ලබන උපාය මාර්ගයන්ය:

වෙළඳපොළ අත්පත් කර ගැනීමේ ක්‍රමෝපාය

සංවර්ධනය,මෙහෙයුම් සහ අලෙවිකරණය යන අංශ පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම තුළින් වර්තමානයේ වෙළඳපොළ මගින් ලබා දෙන වරාය සේවාවන් සඳහා වන වෙළඳපොළ කොටස් වර්ධනය කිරීම මෙම ක්‍රමෝපාය තුළින් අපේක්ෂා කරනු ලැබේ.

මෙම ක්‍රමෝපාය තුළ පහත ක්‍රමවේද ඇතුලත් වේ.

- ප්‍රතිඅපනයන කේන්ද්‍රීය ක්‍රමෝපාය
- සේවා සැපයුම් කේන්ද්‍රීය ක්‍රමෝපාය
- හරිත හා තිරසර වරාය ක්‍රමෝපාය

නිෂ්පාදන/ සේවා සංවර්ධන ක්‍රමෝපාය

මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිය වත්මන් නිෂ්පාදන සහ/ හෝ වරාය සේවා වැඩි දියුණු කිරීම මගින් හෝ නවීකරණය කිරීම මගින් ආදායම වැඩි කරගැනීමට හැකි වන ක්‍රමෝපායකි.

විවිධාංගීකරණ ක්‍රමෝපාය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි මෙහෙයුම් වත්මන් වෙළෙඳපොල හා සේවා අභිබවා ක්‍රියාත්මක කරනු ඇති නමුත් තවමත් පවතින වටිනාකම් ජාලයේ ශක්‍යතාවය තුළ මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් සිටී.

සහයෝගීතා ක්‍රමෝපාය

වෙනත් ආයතන සමඟ එක්ව කටයුතු කිරීම තුළින් සමුද්‍රීය සහ සේවා සැපයුම් ක්ෂේත්‍රය තුළ තරඟකාරී වාසියක් අත්පත් කර ගැනීම සහයෝගීතා ක්‍රමෝපාය වේ. පහත සහයෝගිතා ක්‍රමෝපායයන් භාවිතා කළ හැක.

- ක්‍රමෝපායික සන්ධානය
- අන්‍යෝන්‍ය සේවා සුසංධානය
- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

බාහිර වශයෙන් භාවිතා කරනු ලබන ක්‍රමෝපායන්

පහත හේතූන් මත තම හඳුනාගත් කාර්යයන් බාහිර වශයෙන් ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණය කර ඇත.

- පිරිවැය ඵලදායීතාව සඳහා
- වෙනත් ව්‍යාපාර සඳහා අවධානය යොමු කිරීමට
- සේවාදායකයන්හට ගුණාත්මක සේවාවක් ලබා දීමට

ඉහත සංස්ථාපිත අරමුණු සහ ක්‍රමෝපායයන් මත පදනම්ව කෙටිකාලීන සහ දිගු කාලීන අරමුණු සාක්ශාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් විවිධ කොටියාශීය උපක්‍රම සහ මෙහෙයුම් ක්‍රමෝපායන් භාවිතා කරනු ඇත.

වරාය මෙහෙයුම් කටයුතු එකිනෙක සම්බන්ධ කර තීරණ ගැනීමේ අනුකූලතාවය පවත්වා ගෙන යෑමට අදාළ කර ගත හැකි ප්‍රධාන වටිනාකම් පද්ධතිය මෙහෙයුම් මූලධර්මය යනුවෙන් අදහස් කෙරේ.

තිරසර භාවය

සියළුම වරාය මෙහෙයුම් කටයුතු වල කේන්ද්‍රස්ථානය වන්නේ තිරසර සංවර්ධනයයි.

හරිත වරාය

සෑම වරායයකම දර්ශන තලය වන්නේ පරිසර හිතකාමී වටාපිටාව වේ.

නවෝත්පාදනය

ක්‍රමෝපායික අරමුණු ඉටුකර ගැනීම සඳහා නවීන ව්‍යාපාර සංවර්ධන මොඩලයන් භාවිතා කිරීම.

ව්‍යාවසායකත්වය

විකල්ප ව්‍යාපාරික මාර්ග ක්‍රියාකාරීත්වයේ ප්‍රතිලාභ සඳහා අනුගමනය කල හැකි අවස්ථා සොයා බැලීම.

සබඳතා පුළුල් කිරීම

බහු විධ පාර්ශ්වකරුවන් සමඟ පූර්ව ක්‍රියාකාරීව සන්නිවේදනය කර වටිනා හවුල්කාරිත්ව සබඳතා ඇති කර ගැනීම.

ඵලදායීතාවය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම්, ආයෝජන සහ සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම.

තොරතුරු

ප්‍රතිඵලදායී කාර්යභාරයක් සඳහා සෑම මට්ටමකම තීරණ ගැනීමේ හැකියාව රඳාපවතිනුයේ අදාළ හා කාලීන තොරතුරු මත පදනම්වය.

කාර්යසාධන කළමනාකාරීත්වය

සමස්ත කළමනාකාරීත්වය සහ සේවකයින් අතර අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගී සම්බන්ධතාවයක් නිර්මාණය වන අයුරින් අත්දැකීම් බහුල පළපුරුදු වෘත්තිකයින් රඳවා ගැනීමේ උපක්‍රමයික අරමුණු වෙත සමස්ත කාර්යමණ්ඩලය පෙළගස්වා ඇත.

ලාභදායකත්වය

සියළු කාර්යයන් පූර්ණ මූල්‍ය තක්සේරුවක් සහිතව සිදු කර පැවැත්ම සහ වර්ධනය තහවුරු කරනු ඇත.

අභිලාෂයන්

සියළු වරාය කටයුතු සම්බන්ධයෙන් නිවැරදි දැක්මක් ඇති වගකීමට බැඳී සිටින කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරන නව්‍යමය අදහස් ප්‍රවර්ධනය කරන නායකත්වයක සහිත ඉහළ කාර්යසාධනයෙන් යුත් ආයතනයක් ගොඩ නැගීම.

සමෝධානය

ඕනෑම තත්ත්වයකදී තරහකාරී ගාස්තු යටතේ උසස් මට්ටමේ සේවා සැපයීමට සාධාරණව, අවංකව හා වෘත්තීය මට්ටමින් කටයුතු කිරීම.

සහයෝගීතාවය

සාමූහික, ඵලදායී සහ පෞද්ගලික සම්බන්ධතා අභිවර්ධනය වන විවෘත හා සත්කාරක පරිසරයක් නිර්මාණය කිරීමට ප්‍රයත්න දැරීම.

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් 1979 අගෝස්තු 01 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලද අතර 1984 අංක 7 සහ 35 දරණ පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත.

- නැව් භාණ්ඩ වාහක, නැවගත කිරීම් සහ ප්‍රතිනැවගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම්, වාප්පු කටයුතු, නෞකා වලට ජලය, ඉන්ධන සහ විදුලිය සැපයීම, නෞකා වලට හා නෞකා වලින් ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ ලිහිසි තෙල් මෙහෙයුම් කිරීම බන්කර් සහ ඉන්ධන ගබඩා අතර කාර්යයන්, නියමු කටයුතු සහ නෞකා බැඳතැබීමේ කටයුතු, කිමිදුම් සහ නෞකා දිය යටදී අළුත්වැඩියා කිරීම හා එවැනි වෙනත් අනුශාංගික වූ ඕනෑම කාර්යයක් සඳහා කාර්යක්ෂම හා විධිමත් සේවා සැපයීම.

- සැසඳුම් හා ආරක්ෂක සේවා කාර්යක්ෂමව හා නිත්‍ය ලෙස සැපයීම.

- වරාය සීමාව තුළ හා වරාය ප්‍රවේශ මාර්ගයන්හි නැව් ගමනාගමනය විධිමත් කිරීම හා පාලනය කිරීම.

- වරාය ගොඩනැගිලි නඩත්තු කිරීම හා ඒවා හි භාවිතය ප්‍රවර්ධනය කිරීම, වරායයන් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම.

- කිසියම් නියමිත වරායක් තුළ රේගු දෙපාර්තමේන්තුවට අදාල කාර්යයන් හැර අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම.

- ඒ ඒ වරායන් තුළට හා ඉන් පිටතට යාත්‍රාකිරීම සඳහා නෞකාවලට මඟ පෙන්වීම හා ආරක්ෂාව සැපයීම සඳහා අවශ්‍ය ප්‍රදීපාගාර හා වෙනත් මාධ්‍යයන් ශ්‍රී ලංකා වෙරළෙහි හා ඉන් ඔබ්බෙහි ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.

- වරාය අධිකාරිය පනත මගින් පනවනු ලබන වෙනත් ඒ හා සමාන කාර්යයන් ඉටුකිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම් ප්‍රතිසම්පාදනය කිරීමටත්, නව ආයෝජන වල යෙදවීමටත්, අධිකාරියේ වියදමට නොඅඩු ආදායමක් ලැබෙන පරිදි වරාය අධිකාරිය පනතේ විධිවිධාන වලට අනුකූලව අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් සුදුසු පරිදි ගාස්තු අයකර ඒවා අධිකාරියේ ආදායමට බැර කර ප්‍රමාණවත් පොදු මූල්‍ය සංචිතයක් ඇති කර පවත්වාගෙන යාමට හැකිවන ආකාරයෙන් වරාය අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සහ;

- වරාය අධිකාරිය පනතෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සියළු විශේෂිත වරායන් බාහිර ආධාර අපේක්ෂාවෙන් තොරව, ඒ ඒ වරාය විසින්ම ස්වකීය ව්‍යවසාය ලෙස පවත්වාගෙන යාමට ප්‍රයත්න දැරීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව, වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපතිවරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර එහි සමස්ත පරිපාලනය ඔහු භාරයේ පවතී.

නෞකා පැමිණීම (සියළුම වරායයන්)

විස්තරය	2022	2023	වෙනස (%)
කොළඹ වරාය	3,648	4,237	16.1
ගාල්ල වරාය	7	23	228.6
ත්‍රිකුණාමල වරාය	95	102	7.4
හම්බන්තොට වරාය	323	447	38.4
කන්කසන්තුරය වරාය	0	14	-
එකතුව	**4,073**	**4,823**	**18.4**

කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය (විස්සේ සම ඒකක)

විස්තරය	2022	2023	වෙනස (%)
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA)			
ආනයන	127,499	115,864	127,499
අපනයන	128,819	92,519	128,819
ප්‍රතිනැව්ගත කිරීම්	1,633,176	1,729,272	1,633,176
තැන් මාරු මෙහෙයුම්	36,401	27,476	36,401
එකතුව	**1,925,895**	**1,965,131**	**1,925,895**
සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT)			
ආනයන	117,773	96,574	-18.0
අපනයන	111,938	96,518	-13.8
ප්‍රතිනැව්ගත කිරීම්	1,481,563	1,528,824	3.2
තැන් මාරු මෙහෙයුම්	40,962	41,947	2.4
එකතුව	**1,752,236**	**1,763,863**	**0.7**
කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT)			
ආනයන	263,068	282,666	7.4
අපනයන	281,133	305,865	8.8
ප්‍රතිනැව්ගත කිරීම්	2,520,946	2,496,151	-1.0
තැන් මාරු මෙහෙයුම්	118,906	136,236	14.6
එකතුව	**3,184,053**	**3,220,918**	**1.2**
කොළඹ වරාය			
ආනයන	508,340	495,101	-2.6
අපනයන	521,890	494,905	-5.2
ප්‍රතිනැව්ගත කිරීම්	5,635,685	5,754,247	2.1
තැන් මාරු මෙහෙයුම්	196,269	205,659	4.8
එකතුව	**6,862,184**	**6,949,912**	**1.3**

නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (සියළුම වරායයන්)

විස්තරය	2022	2023	වෙනස(%)
සමස්ත නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය (මෙ.ටො. මිලියන)	**100.4**	**103.8**	**3.4**

කොළඹ වරායේ නැව්බඩු ගොඩබෑම - ශ්‍රී.ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)

විස්තරය	2022	2023	වෙනස (%)
බහළුගත	13,607	14,977	10.1
තොග කඩන	262	198	-24.4
වියළි තොග	1,652	1,180	-28.6
දියර තොග	3,945	4,489	13.8
එකතුව	**19,466**	**20,844**	**7.1**

කොළඹ වරායේ නැව්බඩු පැටවුම් - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)

විස්තරය	2022	2023	වෙනස (%)
බහළුගත	11,865	13,010	9.7
තොග කඩන	2	5	150.0
වියළි තොග	0	4	-
දියර තොග	389	396	1.8
එකතුව	**12,256**	**13,415**	**9.5**

කොළඹ වරායෙන් මෙහෙයවූ සමස්ත නැව්බඩු ප්‍රමාණය - ශ්‍රී ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයන්)

විස්තරය	2022	2023	වෙනස(%)
බහළුගත	25,472	27,987	9.9
තොග කඩන	264	202	-23.5
වියළි තොග	1,652	1,183	-28.4
දියර තොග	4,334	4,885	12.7
එකතුව	**31,722**	**34,257**	**8.0**

ත්‍රිකුණාමලය වරායෙන් මෙහෙයවූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)

විස්තරය	2022	2023	වෙනස (%)
ගොඩබෑම්	1,913	1,891	-1.2
පැටවීම්	176	123	-30.1
එකතුව	**2,089**	**2,014**	**-3.6**

ගාල්ල වරායෙන් මෙහෙයවූ නැව්බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයන්)

විස්තරය	2022	2023	වෙනස (%)
ගොඩබෑම්	1	0.7	-32.6
පැටවීම්	0	0.2	-
එකතුව	**1**	**0.8**	**-16.6**

හම්බන්තොට වරායෙන් මෙහෙයවූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයන්)

විස්තරය	2022	2023	වෙනස (%)
ගොඩබෑම්	1,584	1,304	-17.7
පැටවීම්	532	802	50.8
එකතුව	**2,116**	**2,106**	**-0.5**

සමස්ත සේවක සංඛ්‍යාව

විස්තරය	2022	2023	වෙනස (%)
කොළඹ වරාය	7,838	7,433	-5.2
ත්‍රිකුණාමල වරාය	363	341	-6.1
ගාල්ල වරාය	315	276	-12.4
එකතුව	**8,516**	**8,050**	**-5.5**

සියළුම වරායයන්		(රු. මිලියන)	
විස්තරය	**2023**	**2022**	**වෙනස (%)**
ආදායම සහ වියදම			
සමස්ත ආදායම	92,821.1	99,362.2	(6.6)
වියදම	(46,938.8)	(43,838.7)	(7.1)
විදේශ ණය මත පොලී සහ විදේශ විනිමය (පාඩු) / ලැබීම් වලට පෙර ලාභ/(පාඩු)	**45,882.3**	**55,523.2**	**(17.4)**
විදේශ ණය මත පොලිය	(4,217.9)	(2,400.3)	(75.7)
විදේශ විනිමය (පාඩු) / ලැබීම්	(1,305.2)	3,902.6	(133.4)
බදු වලට පෙර සහ විදේශ විනිමය (පාඩු)/ලැබීම් වලට පසු ලාභ/(පාඩු)	**40,359.2**	**57,025.8**	**(29.2)**
බදු			
ආදායම් බදු	(5,564.7)	(13,261.1)	58.0
විලම්භිත බදු	(6,180.8)	(445.5)	(1,287.4)
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	(8,673.7)	(1,000.0)	(767.4)
බදු සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු ශුද්ධ ලාභ/ (පාඩු)	**19,940.1**	**42,319.2**	**(52.9)**
ශේෂ පත්‍රය			
ජංගම නොවන වත්කම්	605,499.5	576,636.4	5.0
ජංගම වත්කම්	134,006.8	155,053.5	(13.6)
ජංගම වගකීම්	34,029.3	44,685.4	23.8
ස්කන්ධ සහ වෙනත් ප්‍රාග්ධන	7,591.4	7,591.4	-
සංචිත හා ප්‍රතිපාදන	574,414.9	546,018.6	5.2
ජංගම නොවන වගකීම්	123,470.7	133,394.4	7.4
අනුපාත			
ආදායමට මෙහෙයුම් ලාභ	43.7	52.1	
වාර්ෂික ආදායම් වර්ධනය	(6.6)	63.5	
ප්‍රාග්ධන යෙදවුම් මත ප්‍රතිලාභ	6.2	8.6	

ගරු නිමල් සිරිපාල ද සිල්වා, පා.ම.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය

සහ

ගරු ප්‍රේමලාල් ජයසේකර, පා.ම.

වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍ය

සභාපතිතුමාගේ සමාලෝචනය

විග්‍රහය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටට පත් වෙමි.

ආනයන සීමා පැනවීම් හා ගෝලීය ආර්ථික පසුබෑම් හමුවේ පසුගිය වර්ෂය දේශීය නාවික කර්මාන්තය සඳහා අභියෝගාත්මක වර්ෂයක් විය. යුරෝපා රටවල ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් සමඟ ඇදුණු පහළ මට්ටමේ ගෝලීය ඉල්ලුම හා ඉහළ මට්ටමේ නැව් භාණ්ඩ ප්‍රමාණය හේතුකොටගෙන, ජාත්‍යන්තර නාවික කර්මාන්තයට අභියෝගයක් වෙමින් නැව් භාණ්ඩ මෙහෙයුම් ප්‍රමාණය ඍජු බලපෑමට ලක් වූ නැව් සමාගම්වල අතිරික්ත ධාරිතාවය ගෝලීය ආර්ථිකයේ පසු බෑමට හේතු විය. පසුගිය වර්ෂයේ අධික නැව් සංඛ්‍යාවක් කොළඹ වරායට පැමිණියද මෙහෙයවූ භාණ්ඩ ධාරිතාවයේ අඩුවක් දක්නට ලැබිණ. කෙසේ වුවද, 2023 වර්ෂයේ අවසන් මාස දෙක තුළ 2022 වර්ෂයට සාපේක්ෂව ප්‍රධාන වශයෙන් මැද පෙරදිග කලාපයන්හි නාවික ගමනාගමනයට අවහිරතාවයන් ඇති කිරීමට හේතු වූ අවිනිශ්චිතතාවය මධ්‍යයේ වුවද මෙහෙයුම් ධාරිතාවයේ වර්ධනයක් වාර්තා කිරීමට කොළඹ වරායට හැකියාව ලැබිණු අතර එමඟින් ආන්තික වශයෙන් ඉහළ මෙහෙයුම් ධාරිතාවයක් වාර්තා කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකි විය.

යටිතල පහසුකම් සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන වයිනා සිවිල් ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන් සමාගම විසින් ඉදි කිරීම් කටයුතු මෙහෙයවන ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන, වරාය පිවිසුම් අධිවේගී ගුවන් මාර්ගයේ ඉදිකිරීම් වර්ෂය තුළදී ක්‍රියාත්මක වීම ආරම්භ විය. මෙම අධිවේගී ගුවන් මාර්ගයේ ඉදිකිරීම් හේතුකොට ගෙන කාර්යාල හා වැඩහල් ගොඩනැගිලි කිහිපයක්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියට අහිමි වූ අතර, එම කාර්යාල හා වැඩහල් ගොඩනැගිලි වරාය පරිශ්‍රයෙන් පිටත ප්‍රතිස්ථානගත කිරීමට හා වරාය පරිශ්‍රය තුළ ඒ සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමට සිදු විය. මෙම අධිවේගී ගුවන් මාර්ගයේ ඉදිකිරීම් හේතුකොටගෙන කොළඹ වරායේ අභ්‍යන්තර මාර්ග, රථවාහන ගමනාගමනය සහ සාමාන්‍ය පහසුකම්වලට අවහිරතාවයක් ඇති විය. 2024 වර්ෂයේ අගභාගයේදී ගුවන් මාර්ගයේ ඉදිකිරීම් නිමවීමත් සමඟ මෙම තත්ත්වය 2025 වර්ෂයේදී යථා තත්ත්වයට පත් වනු ඇති බවට අපේක්ෂා කරනු ලැබේ. තාවකාලික අවහිරතාවයන් වලට මුහුණපෑමට සිදු වුවද, අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය නිමවීමෙන් පසුව මේ හරහා ජාත්‍යන්තර ගුවන්තොටුපොලවල්, හම්බන්තොට හා ගාල්ල වරායවල් හා ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන හා සම්බන්ධවීමට ඇති හැකියාව මගින් කොළඹ වරායේ වටිනාකම ඉහළ යනු ඇත.

නැගෙනහිර බහළු පර්යන්තයේ සිවිල් වැඩ ඉදිරියට කරගෙන ගියද යෝජිත නව අංගන ප්‍රදේශ යෙහි කුඩා කොටසක රොන්මඩ තැන්පත් වීම හේතුකොටගෙන ඉදිකිරීම්වල යම් ප්‍රමාදයක් සිදු විය. බලපෑමට ලක් වූ ප්‍රදේශය ඉතා සුළු වුවද, වගකිව යුතු ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය එය වැදගත් කාර්යයක් සේ සලකා ගැටළුව නිරාකරණය කිරීමට අවධානය යොමු කළේය. මෙයින් ව්‍යාපෘතියේ මුල් සැලැස්ම වෙනස් වුවද, ජැටි පිහිටි ප්‍රදේශයේ කාර්යයන් සැලසුම්ගත ආකාරයට සිදු කෙරෙමින් පවතී. අංගන ප්‍රදේශයේ පවතින ගැටළුව විසඳීමට පියවර ගනිමින් තිබෙන අතර, නැගෙනහිර බහළු පර්යන්තයේ ඉදිරි වැඩ අඛණ්ඩව සිදු කෙරෙන අතර, 2024 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ජැටි අද්දර ගැඹුර මීටර් 18 – 20 ප්‍රමාණයකින් නිම කර, අළුත් ජැටි දොඹකර හයක් ස්ථාපිත කර යෝජිත රේඛීය දිග මීටර් 1300 න් 900 ක ප්‍රමාණයක් මෙහෙයුම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. තවද, 2024 දෙසැම්බර් වන විට, යෝජිත පිලිමත සවිකළ ස්වයංක්‍රිය ගැන්ට්‍රි දොඹකර 40 ක ප්‍රමාණයෙන් අවම වශයෙන් 20 ක් මෙහෙයුම් සඳහා යෙදවීමටද අපේක්ෂා කරනු ලැබේ. නැගෙනහිර බහළු පර්යන්තය සඳහා ස්ට්‍රැඩල් කැරියර්ස් යන්ත්‍ර 30 ක් ප්‍රසම්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. 2025 වර්ෂයේ ඔක්තෝම්බර් මාසය වන විට නැගෙනහිර බහළු පර්යන්තය පූර්ණ වශයෙන් මෙහෙයුම් කිරීමට නියමිතය.

ජය බහළු පර්යන්තයේ V අදියරෙහි ජැටි බැම්ම මීටර් 120 කින් දීර්ඝ කිරීම සම්පූර්ණ කර ඇති අතර, දැනට ජය බහළු පර්යන්තයේ මීටර් 440 හි ස්ථාපිත කර, භාවිතයේ යොදවා ඇති ජැටි දොඹකර තුන මාරු කිරීමත් සමඟ 2024 වර්ෂයේ මැයි මාසයේදී මෙහෙයුම් ආරම්භ කිරීමට හැකි වනු ඇත. ජය

බහළු V අදියර සඳහා නව අංගන ප්‍රදේශයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, 2024 වර්ෂයේදී එය භාවිතයට ගැනීමට හැකිවනු ඇත.

ත්‍රිකුණාමලය වරාය, කර්මාන්ත වරායක් ලෙස සංවර්ධනය කළ යුතු බවට හඳුනාගෙන ඇත. මෙම පියවරහේ එක් කොටසක් ලෙස ත්‍රිකුණාමලයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් කොටස් විශාල සංඛ්‍යාවක් සූර්ය බලශක්තිය නිපදවීම හා රසායනික ද්‍රව්‍ය හා පොහොර නිෂ්පාදනය, නැව් නැගීම ආදී කර්මාන්ත සඳහා අභිලාශීය ආයෝජකයින්ගට කල්බදු ක්‍රමය යටතේ පවරනු ලැබ ඇත. ආයොජ්කයින් දෙදෙනෙකු මේ වන විටත් හරිත බලශක්ති අංශයේ ව්‍යාපෘති ආරම්භ කිරීමට අභිලාශය දක්වා ඇත. ත්‍රිකුණාමලයේ ක්‍රියාත්මකව සිටින කර්මාන්තකරුවන් ද මෙම විශේෂ වැදගත්කමක් ඇති ආයෝජන කටයුතු වලට යොමු වී සිටී.

වැඩහල් පහසුකම් සහිතව ඉංජිනේරු අංශය පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයේදී ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නව ගොඩනැගිල්ලක් ඉදි කළ අතර එය 2024 වර්ෂයේ දෙවන කාර්තුවේදී භාවිතයට ගැනීමට අපේක්ෂා කෙරේ.

ඔලුවිල් වරායේ ආයෝජන සඳහා අභිලාෂීය අයෝජකයින්ගේ අභිලාෂිය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කරන ලදී. ඒ අනුව, ඔලුවිල් වරායේ නව අයෝජන සඳහා අයෝජකයින් තිදෙනෙකු නව ව්‍යාපෘති වල ආයෝජනය කිරීමට අභීලාෂය පළ කරන ලද අතර මෙම යෝජනා මේ වන විට ඇගයීමට ලක් කෙරෙමින් පවතී.

ගාල්ල වරාය සංවර්ධනය කිරීම සඳහා ආයෝජකයින්ගෙන් අභිලාෂය ලැබී ඇති අතර, ජාත්‍යන්තර පට්ටමේ රුවල් නැව් ව්‍යාපෘතියක් ඇතුළත් සංචාරක කර්මාන්තය කේන්ද්‍රීයවූ ව්‍යාපෘතියක් සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කර සිටී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් අග්නිදිග ඉන්දියාවේ නාගපට්ටිනම් වෙත මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා සංවර්ධනය කරනු ලබමින් පවතී. 2023 වර්ෂයේදී අත්හදා බැලීමේ ගමන්වාර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. අනාගත කාර්යයන් තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා විභව්‍යතාවය ඇති පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්වකීය අරමුදල් ආයෝජනය කර ඇත. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර වෙළෙඳ හා මගී ප්‍රවාහන කටයුතු වලට පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව කන්කසන්තුරය වරාය ප්‍රධාන වරායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් ඉඩම් වලින් අමතර ඉඩම් පවරා ගන්නා ලදී. මෙම ප්‍රයත්නය අනුමත කරමින් කන්කසන්තුරය වරායට විශාල නෞකා වලට නැංගුරම්ලෑමට හැකි වන පරිදි දිය කඩනයක් ඉදිකිරීමට හා වරාය ද්‍රෝණිය හැරීම ආදී වරාය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 61.5 ක ප්‍රදානයක් ලබා දීමට ඉන්දියාව මෑතකදී පොරොන්දු විය.

තවද, තලෙයිමන්නාරම හා රාමේෂ්වරම් අතර හෝ ඉන්දියාවේ වෙනත් විකල්ප ප්‍රදේශයක මගී යාත්‍රා සේවය නැවත ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉන්දියාව සමඟ සාකච්ඡා කරමින් සිටී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය තලෙයිමන්නාරම වරාය සීමා හඳුනාගෙන ඇති අතර ව්‍යාපෘතිය ඇතැම්විට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2024 වර්ෂයේදී සිය අරමුදල් යොදවා පවතින පියරය සංවර්ධනය කිරීමට කටයුතු කරනු ඇත.

වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට සමාගමීව, කාර්යක්ෂමතාවය හා පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීමේ අරමුණට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය යෝජිත වරාය සන්නිවේදන පද්ධතියක් ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කළේය. රෝටර්ඩෑම් වරායේ තාක්ෂණික යෙදවුම් සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහයෝගය ඇතිව KPMG Sri Lanka ආයතනය විසින් අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘති අන්තර්ගතයේ කොටසක් වශයෙන් අභිලාෂය ප්‍රකාශ කිරීමේ කෙටුම්පත් ලේඛන හා යෝජනා සඳහා ඉල්ලීම් ලබා ගැනීමේ ලේඛනද KPMG ආයතනය විසින් සකස් කරන ලදී. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, කෙටිකාලයක් තුළ, අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවීමට අපේක්ෂා කරනු ලැබේ.

2023 වර්ෂයේදී, සී/ස දකුණු ආසියා වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථාන සමාගම නමින් අති නවීන සේවා සැපයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය චයිනා මර්චන්ට් පෝට් සමාගම සමඟ ඉදිකර, මෙහෙයුම් කර, පවරාදීමේ සහන ගිවිසුමකට එළඹිණි. කොළඹ වරායේ සහන ගිවිසුම් යටතේ මෙහෙයුම් කරනු ලබන ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත්ව පාලනය කරනු ලබන නැගෙනහිර බහළු පර්යන්තය හා ජය ජය බහළු පර්යන්තයට සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගමට සමාන පර්යන්ත මෙන්ම මෙම ව්‍යාපෘතියේ හිමිකාරීත්වයෙන් සියයට පහළොවක (15%) ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකාව වරාය අධිකාරිය දරණු ඇත. අක්සස් ඉංජිනියරින් පීඑල්සී සමාගම ද මෙම ආයතනයේ හිමිකාරීත්ව අයිතියෙන් සියයට පහළොවක් (15%) දරණු ලබයි. ව්‍යාපෘතිය සැලසුම් අදියරේ පවතින අතර ඉදිරි වසර 2-3 අතර කාලය තුළ නිම කිරීමට නියමිතය. වෙනත් විශාල වරායවල් වලින් හා නැව් සමාගම් වලින් මේ හා සමාන ව්‍යාපෘති සඳහා ප්‍රබල විමසීම් ලැබී ඇත.

වෙනත් මහා පරිමාණ වරාය හා නැව් සමාගම් වලින් මෙහා සමාන ව්‍යාපෘති පිළිබඳ ප්‍රබල විමසීම් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලැබී ඇත.

Adani Ports සහ SEZ Group සමාගම් විසින් ඉදි කරනු ලබන කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය (CWIT) ඉදිකිරීම් ක්‍රියාත්මකව පවතින අතර පර්යන්තයේ ප්‍රථම පියවර 2024 දෙසැම්බර් මාසයේදී නිම කිරීමට නියමිතය.

නැගෙනහිර බහළු පර්යන්තය හා කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්ත ව්‍යාපෘති නිමවීමෙන් පසුව, දැනට කොළඹ වරායේ පවතින බහළු විස්සේ සම ඒකක මිලියන අටක (08) ධාරිතාවය ඉදිරි වසර දෙක තුළ බහළු විස්සේ සම ඒකක මිලියන පහළොව (15) දක්වා වැඩි කිරීමට සැලසුම් කෙරෙනු ඇත.

ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අදහස් කරන ආකාරයට සහ වරාය ජාතික ප්‍රධාන සැලැස්මට අනුව, දැනට පවතින දිය කඩනය දීර්ඝ කිරීම ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය යෝජනා කර සිටී. මෙය බටහිර බහළු පර්යන්තය II ක්‍රියාත්මක කිරීමත් සමඟ සහ ඉන්පසුව කොළඹ උතුරු වරාය සංවර්ධනය කිරීමත් සමඟ ක්‍රියාත්මක කෙරෙනු ඇත.

2023 වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 වර්ෂය සඳහා පොළී හා බදු ගෙවීමට පෙර රඳවාගත් ඉපයීම රුපියල් බිලියන 36.3 ක් විය. 2022 වර්ෂයේ පොළී හා බදු වලට පෙර ඉපයීම් රුපියල් බිලියන 47.5 ක් වූ අතර, 2023 වර්ෂයේ පොළී හා බදු වලට පෙර ඉපයීම් අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතුව වූයේ පෙර වර්ෂයේ රුපියල් බිලියන 68.7 ක ආදායම හා සැසඳීමේදී 2023 වර්ෂයේ ආදායම රුපියල් බිලියන 63.3 ක් වීමය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම මූලික වශයෙන් ඩොලර් වලින් එකතු කරන බැවින් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහ ළයාම ආදායම අඩු වීමට බලපෑ මූලික හේතුව විය. ඉහළ උද්ධමනයේ පීඩනය හේතුකොටගෙන 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ සෘජු වියදම්ද ආසන්න වශයෙන් රුපියල් බිලියන 3.5 කින් වැඩි විය.

2022 වර්ෂයේ රුපියල් බිලියන 22.5 ට සාපේක්ෂව වර්ෂයේ වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් බිලියන 20 ක් විය. වරාය බලපත්‍ර වලින්, පරිපාලිත සමාගම් වලින් හා වෙනත් පර්යන්ත වලින් ලැබෙන ආදායම ප්‍රධාන වශයෙන් වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුළත් වේ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වලට සමානව වෙනත් පර්යන්ත වලටද බලපාන ලදී. තවද, වෙනත් පර්යන්ත මගින් ලාභාංශ ගෙවීම අඩු වීමද වෙනත් මෙහෙයුම් ආදායම් අඩු වීමට හේතු විය.

London Inter Bank Offered Rate අගය (LIBOR) ඉහළ යෑම හේතුකොටගෙන විදේශ ණය පොළී පිරිවැය වැඩි විය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක්සත් ජනපද ඩොලර් තැන්පතු මත විනිමය අනුපාත පාඩුව හා බැඳුණු පොළී අනුපාතය අඩු වීමද ආයෝජන ආදායම අඩු වීමට බලපා ඇත. එහෙත්,

ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සඳහා පොළී අනුපාතයේ ඉහළ යාම, රුපියල් බිලියන 5.3 ක ශුද්ධ මූල්‍ය ලාභයක් ගෙන දෙමින් ඩොලර් ණය මත සිදුවූ ඉහත සඳහන් පාඩුව සමනය විය. කෙසේ වුවද, නැගෙනහිර බහළු පර්යන්තයේ ආයෝජන සඳහා මුදල් යෙදවීමට එක්සත් ජනපද ඩොලර් යෙදවීම හේතුකොට ගෙන ලැබීම්, පසුගියය වර්ෂයේ රුපියල් බිලියන 5.6 ක ලැබීමට වඩා අඩු විය.

2022 වර්ෂයේ රුපියල් බිලියන 3.9 ක විදේශ විනිමය ලැබීම් වලට සාපේක්ෂව 2023 වර්ෂයේදී රුපියල් බිලියන 1.3 ක විදේශ විනිමය පාඩුවක් වාර්තා විය. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අධි ප්‍රමාණයන විම හේතුකොටගෙන එක්සත් ජනපද ඩොලරයේ අගය අඩුවීම මෙයට හේතුවිය.

2023 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඒකාබද්ධ අරමුදලට රුපියල් බිලියන 8.7 ක දායකත්ව මුදලක් ලබා දී ඇත. 2022 වර්ෂයේ ඒකාබද්ධ අරමුදලට දායකත්වය රුපියල් බිලියන 1.0 ක් විය.

ඉහත දායකත්වයෙහි සංයෝජිත බලපෑම වූයේ 2022 වර්ෂයේ රුපියල් බිලියන 42.3 ට සාපේක්ෂව රුපියල් බිලියන 19.9 ක බදු ගෙවීමට පසු ශුද්ධ ලාභයක් වාර්තා වීමයි.

වරාය මෙහෙයුම් සහ සේවා සැපයුම් කාර්යසාධනය

ගෝලීය ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් වශයෙන් 2023 වර්ෂයේදී නාවික මෙහෙයුම් වලද පසුබෑමක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2023 වර්ෂයේ මුල් මාස 10 ඇතුළත පසුගිය වර්ෂයට වඩා අඩු මට්ටමකින් වුවද ස්ථාවර මෙහෙයුම් ප්‍රමාණයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකි විය. වර්ෂයේ අවසන් මාස දෙකෙහිදී 2022 වර්ෂයේ වාර්තා වූ මෙහෙයුම් ප්‍රමාණය ආන්තික වශයෙන් පසුකර යාමට හැකි විය. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්තවල 2023 වර්ෂයේ වාර්ෂික මෙහෙයුම් ධාරිතාවය බහළුම් විස්සේ සම ඒකක මිලියන 1.97 ක් විය. එය 2022 වර්ෂයේ විස්සේ සම ඒකක මිලියන 1.92 ක් විය.

වර්ෂයේ කෙටිකාලයක් තුළ ජාතික මට්ටමින් වෘත්තීය සංගම් විරෝධතා තිබුණද, වරායේ සියළුම සේවා බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි විය. කළමනාකාරීත්වය හා සේවකයින් වරාය අධිකාරිය යටතේ පාලනය වන සියළුම වරායවල මෙහෙයුම් බාධාවකින් තොරව පවත්වාගන යාමට හැකි විය.

2023 වර්ෂයේදී නිම කර විධිමත්ව සැලසුම් කරන ලද තොරතුරු තාක්ෂණ පද්ධති හා යටිතල පහසුකම් කාලනුරූපව Prime Route Optimization මොඩියුලය සහ Expert Decking Optimization මොඩියුලය මගින් උත්ශ්‍රේණි කිරීම ක්‍රියාත්මක කරන ලදී. ජය බහළු පර්යන්තයේ උපකරණ භාවිතය මෙම මොඩියුල මගින් උපරිම ක්‍රියාකාරීත්වයට ගෙන එන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල සාමාන්‍ය ඵලදායීතාවය ප්‍රධාන නැව් සමාගම් හා පෝෂක නෞකා සම්බන්ධයෙන් පිළිවෙලින් 2.6% ක් හා 4.9% කින් වර්ධනය විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාශයේ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන මගින් පූර්ණ බහළු (FCL cargo) විස්සේ සම ඒකක 96,501 ක් භාර දෙන ලදී. පාරිභෝගික සේවා මධ්‍යස්ථාන දවසේ පැය 24 තුළම සේවය සපයන අතර පූර්ණ බහළු/ අර්ධ පූර්ණ බහළු භාරදීමේ ලේඛන ඉදිරිපත් කිරීම හා ගෙවීම් කිරීම සඳහා විද්‍යුත් මාර්ගික පහසුකම් සැලසීම මගින් පරිභෝගිකයින් වෙත ඔවුන්ගේ කාර්යය පහසුකර ඇත.

අර්ධ පූර්ණ බහළුම් (LCL) හා විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් (MCC) විස්සේ සම ඒකක 19,117 ක් බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන වලදී මෙහෙයුම් කරන ලද අතර දේශීය, ප්‍රතිඅපනයන, විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් හා විශේෂ වර්ගයේ නැව් භාණ්ඩ සඳහා වරාය ඇතුළත ගුදම් ඉඩ පහසුකම් සලසන ලදී. 2023 වර්ෂයේදී විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් ඇසුරුම් හා හිස් කිරීම් විස්සේ සම ඒකක 8,591 ක් මෙහෙයුම් කරන ලදී.

ප්‍රධාන නැව් සමාගම් සඳහා අර්ධ පූර්ණ බහළුම් මෙහෙයුම් (de-consolidate) කිරීම සඳහා නව සිග්‍රගාමී සේවාවක් බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන I හිදී හඳුන්වා දෙන ලද අතර, ඉදිරියේදී නැව් භාණ්ඩ මෙහෙයුම් ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණ ඇතිව මෙම සේවය තව තවත් නැව් නියෝජිතයන් වෙත විවෘත කිරීමට කටයුතු කරනු ඇත.

බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන V නවීකරණය කිරීම මගින් බැඳුම්කර මෙහෙයුම් සඳහා ඉඩ වැඩි කරන ලදී. පැමිණ කරන විමසීම්, විද්‍යුත් තැපෑල මගින් කරන විමසීම්, වෙබ් අඩවි පදනම්ව කරන විමසීම් හා දුරකථන ඔස්සේ කරන විමසීම් හා සම්බන්ධයෙන් සියළුම වරායයන් වෙත පහසුකම් සැලසීම සඳහා විමසීම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී.

අළෙවි හා ව්‍යාපාර සංවර්ධන

පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අළෙවි හා ව්‍යාපාර සංවර්ධන කොට්ඨාශය පියවර ගනිමින් සිටී. වැඩි ධාරිතාවයක්, වැඩි ජැටි අද්දර ගැඹුර, නවීන තාක්ෂණයෙන් වැඩි දියුණු කරන ලද විශාල ප්‍රමාණයේ නෞකා මෙහෙයුම් කළ හැකි නවීන උපකරණ හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර නාවික හා සමුද්‍රීය කේන්ද්‍රීය වරායක් ලෙස පාරිභෝගික ප්‍රජාව වෙත සේවා සපයමින් ස්වකීය ස්ථානය තහවුරු කර ගැනීමට හැකි ඇති කරනු ලැබේ.

කොළඹ වරායේ ක්‍රියාත්මකව පවතින නවතම සංවර්ධන කාර්යය මගින්, දැනටමත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ අළුත් ව්‍යාපාර ආරම්භ කිරීමට තීරණාත්මක සාකච්ඡා පවත්වමින් සිටී. ප්‍රධාන පෙළේ නැව් සමාගම් හා පෝෂක නැව් සමාගම් සමඟ පර්යන්ත සේවා ගිවිසුම් ගණනාවක් බලාත්මකව ඇති අතර, සංශෝධිත කොන්දේසි මත මෙහෙයුම් ධාරිතා ඉලක්ක පිළිබඳ සාකච්ඡා පැවැත්වෙමින් ඇත.

කොළඹ වරායේ පර්යන්ත මෙහෙයුම්කරුවන් අතර තරඟකාරීත්වය උපරිම මට්ටමින් පවතින අතර, කොළඹ වරායට එමඟින් මනා සේවයක් සැලසී ඇත. එකිනෙක මෙහෙයුම්කරුවන් අතර තරඟකාරීත්වයක් තිබුණද, මෙහෙයුම්කරුවන් අතර සම්බන්ධතාවය ඉහළ මට්ටමේ අන්‍යෝන්‍ය වශයෙන් ගරු කිරීම ඉහළ මට්ටමක පවතී. පර්යන්ත මෙහෙයුම්කරුවන් අතර සමීප හා මිත්‍රශීලී සම්බන්ධතාවය තහවුරු කෙරෙන කොළඹ වරාය තුළ තරඟකාරී භූ දර්ශනයක් නියෝජනය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය නායකත්වය දෙන කොළඹ වරායේ සියළුම මෙහෙයුම්කරුවන් කොළඹ වරාය ප්‍රවර්ධනය කිරීම සඳහා 2022 වර්ෂයේදී සාමූහිකව ඩකාහි හා චිතගොංහි ද, 2023 වර්ෂයේදී චෙන්නායි සහ ටුටිකොරින්හිද මාර්ග සංචාර ඉතා සාර්ථකව සංවිධානය කෙරින.

නිමාව

ගෝලීය නාවික හා සමුද්‍රීය කර්මන්තය, සැපයුම් දාමයේ සිදුවන වෙනස්කම් වලට අනුව, නව තාක්ෂණයේ හා ගෝලීය පරිසර අභියෝග වලට අනුකූලව නිරන්තරයෙන් විකාශනය වීම හා පුළුල් වීම සිදු වේ. සියළුම ජාත්‍යන්තර වරායවල් වෙනස්කම් වලට හැඩගැසෙමින් හා අනුවර්තනය වෙමින් පවතින අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය පුරෝගාමී ජාත්‍යන්තර ප්‍රතිඅපනයන කේන්ද්‍රීය වරායක් ලෙස ස්වකීය තත්ත්වය හා ස්ථානය ආරක්ෂාකරගනිමින් හා වැඩි දියුණු කර ගැනීමට කැපවී සිටී. ආසියාවේ ආර්ථික වර්ධනය, විශේෂයෙන්ම වරාය ක්ෂේත්‍රයේ අනාගතය සඳහා සහාය දැක්වීමට ඉන්දියාව දැඩි පොරොන්දු දී ඇති පසුබිමක, දකුණු ආසියාවේ ප්‍රධාන කේන්ද්‍රීය මධ්‍යස්ථානය වශයෙන් උප මහද්වීපයේ වරාය ආශිකයෙහි පුළුල් කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීම මගින් එම විභව්‍යමය වර්ධනයේ වාසිය ලබා ගැනීමට කොළඹ වරයා මනා ලෙස සූදානම් කර ඇත. කොළඹ වරාය හා එක්ව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉදිරි කාලයට ගැලපෙන අයුරින් කලාපයේ වෙනත් වරායයන් වලට සාපේක්ෂව සංවර්ධනය වෙමින් පවතී. රටෙහි සමස්ත වරායයන්හිම නියමු වරාය වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරි, වරාය, නාවික හා සමුද්‍රීය අංශය හරහා ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික වර්ධනයට වර්තමානයේදී මෙන්ම ඉදිරියේදීද විශාල කාර්යභාරයක් ඉටු කරනු ඇත.


සභාපතිතුමාගේ සමාලෝචනය

ගෝලීය ආර්ථිකයේ මන්දගාමී පසුබෑම මධ්‍යයේ 2023 වර්ෂයේදී ඇති වූ අර්බුද හමුවේ, 2023 වර්ෂයේ අගභාගයේදී කොළඹ වරායේ මෙහෙයුම් ප්‍රමාණය ඉහළ ගිය අතර, එතැන් සිට 2024 වර්ෂය දක්වා මෙහෙයුම්වල වර්ධනයක් පවත්වාගෙන යාමට හැකි විය. මෙම ප්‍රවණතාවය 2024 වර්ෂයේ මුල් භාගය දක්වා අඛණ්ඩව පැමිණ ඉදිරි වර්ෂයේදී අධිකාරියේ කාර්යසාධනය එමඟින් යථාතත්ත්වයට පත්වනු ඇති බව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලබා ඇති සාර්ථකත්වය වෙනුවෙන් වර්ෂයේ දින 365 තුළම දවසේ පැය 24 පුරා වර්තමානයේදී හා අතීතයේදී කැපවීමෙන් කටයුතු කළ නායකත්වයේ, කළමනාකාරීත්වයේ හා කාර්ය බලකායේ කාර්යසාධනය ඇගයීමට ලක් කළ යුතුය. මේ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලැබූ සහයෝගය හා සේවය ඉහළින්ම අගය කරමි. කොළඹ වරායේ සාර්ථකත්වයට සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්, කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සහ කළම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිලන් යන සමාගම් වල නායකත්වයෙන් හා කණ්ඩායම් වලින් ලැබූ අඛණ්ඩ සහයෝගය පිළිබඳවද මා මගේ කෘතඥතාවය ඔවුන් වෙත පළ කරමි.

සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහ එහි පාර්ශ්වීය ආයතන වෙත ඉදිරිපෙළ සිට මඟපෙන්වමින් සහයෝගය දැක්වීම පිළිබඳව ගරු වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යතුමන් වෙත මාගේ ප්‍රණාමය පුදකර සිටිමි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වයට හා සේවක මහත්ම මහත්මීන් වෙත සහයෝගය දක්වමින් ධෛර්යමත් කිරීම සම්බන්ධයෙන් වරාය, නාවික හා ගුවන්සේවා රාජ්‍ය අමාත්‍යතුමන් වෙත ස්තූතිය පළ කළ යුතුය. සෑම අවස්ථාවකදීම නිසි ප්‍රතිචාර දක්වමින් සහයෝගයෙන් කටයුතු කරන වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්වරුන්, කළමනාකරීත්වය හා කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා වරාය අධිකාරියට සත්‍ය ලෙසම ශක්තියක් වී ඇති අතර ඒ සඳහා ඔවුන් වෙත ස්තූතිය පළ කර සිටිමි. ගරු වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යතුමාගේ පුද්ගලික ලේකම්, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය හා උපදේශකයින් සහ කාර්ය මණ්ඩලයේ උපකාරය හා සහයෝගය අගය කිරීමට අමතක නොකරමි.

අප ආයතනයේ සාමූහික සාර්ථකත්වය හා දීප්තිමත් අනාගතය උදෙසා කටයුතු කර ඇති හා ඉදිරියටත් අඛණ්ඩව කටයුතු කරන අපගේ වටිනා ගනුදෙනුකාරභවතුන්, ගෞරවනීය හවුල්කාර පාර්ශ්වයන් හා සියළුම පාර්ශ්වීය ආයතන වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයද සමඟින් මාගේ අපරිමිත ගෞරවාදරය පිරිනමමි.



කීත් ඩී බර්නාඩ්
සභාපති

කීත් ඩී බර්නාඩ් මහතා
සභාපති

කීත් ඩී බර්නාඩ් මහතා 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ධූරය හොබවමින් සිටී. මෙම පත්වීමට පෙර සිය වසර 35 කට අධික වෘත්තීය සේවා කාලයෙන් වසර 25 කට අධික කාලයක් ආයතනික අංශයේ විවිධ ක්ෂේත්‍රයන්හි ඉහළ ඉළමනාකරණ මට්ටමේ විවිධ තනතුරු දරා ඇත. මූල්‍ය පරිත්‍යාග මත හා ශ්‍රී ලංකා රජයේ අනුග්‍රහය මත ආරම්භ කළ ඉහළ ඵලදායීතාවයේ යුත්, ලාභ ඉපයීම් සඳහා නොවන සාර්ථක ව්‍යාපෘති දෙකක ඉහළ කළමනාකාරීත්වය මට්ටමින් දායකත්වය ලබා දී ඇත. රාජ්‍ය අංශයේ දරන ලද තනතුරු අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ අංක එක ස්ථානයේ පැවති කාල වකවානුව තුළ එහි සම කළමනාකාර අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කර ඇත. කෙටි කාල පරිච්ඡේදයක් තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක අධ්‍යක්ෂ ලෙස හා ඊට අනුබද්ධිත ආයතනයන්හි සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වශයෙන් ද කටයුතු කර ඇති අතර, රජයට අයත් ආයතනයන්හි දෝෂ කළමනාකරණය සඳහා උපදෙස් හා සහයෝගය දැක්වීමේ වගකීම සහිතව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විශේෂඥ කණ්ඩායමෙහි සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. තවද, ඔහු මූල්‍ය සේවා සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයන්හි ක්‍රමෝපාය, ව්‍යාපාර පෙළගැස්වීම සහ අරමුණු සැකසීම සඳහා උපදෙස් ලබා දෙමින් උපදේශක කටයුතු වල ද නිරතව සිට ඇත.

බර්නාඩ් මහතා විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛ පෙළේ සමාගම් වල හා සීමිත වගකීම් සහිත සමාගම්වල (PLC) අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු හොබවා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති තනතුරට අමතරව, ඔහු වරායේ සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

ඔහු වරලත් ගණකාධිකාරී කළමනාකරණ ආයතනයේ (එක්සත් රාජධානියේ) සහ වරලත් ගෝලීය ගණකාධිකාරී කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අතර වරලත් අලෙවිකරණ ආයතනයේද සාමාජිකයෙකු වේ. ඇබර්ඩීන්හි රොබට් ගෝඩන් විශ්වවිද්‍යාලයේ ඇබර්ඩීන් ව්‍යාපාර අධ්‍යයන ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MBA) ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (MBA) උපාධිය හදාරන කාලය තුළ ඔහු විසින් ප්‍රදර්ශනය කරන ලද, ප්‍රත්‍යුත්ක්‍රමශක්තිය හා නිර්මාණශීලිත්වය වෙනුවෙන් Douglas Gourlay සම්මානය ද ඔහු වෙත පිරිනමා ඇත.

ජී යූ කේ අල්ගේවත්තගේ මහතා
උප සභාපති

ගයාන් උදාර කෞශල්‍ය අල්ගේවත්තගේ මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති වශයෙන් කටයුතු කරන අතර සී/ස සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් පුද්ගලික සමාගම (SAGT), සී/ස කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් පුද්ගලික සමාගම (CICT), සී/ස කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් පුද්ගලික සමාගම, සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් කම්පැණි පුද්ගලික සමාගම (HIPG), සී/ස හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් පුද්ගලික සමාගම (HIPS) සහ ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, සී/ස ජය බහළු පර්යන්ත සමාගම, සී/ස වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගම හා සී/ස ලංකා නැව් සංස්ථාව යන ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

අල්ගේවත්තගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ශාස්ත්‍රපති උපාධිය ද, නාවල විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යා උපාධිය ද ලබා ඇත.

ඔහු විශිෂ්ට නායකත්වයෙන් හා කෘතහස්ත භාවයෙන් යුත් විවිධ දක්ෂතා ඇති, කැපවීමෙන් කටයුතු කරන පළපුරුදු ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙක් වන අතර ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා

කණිෂ්ඨ නිලධාරීන් සමඟ පුළුල් අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රත්‍යුත්ක්‍රම ශක්තිය හා කාල කළමනාකරණය උපයෝගී කර ගන්නා ප්‍රබල හා ප්‍රත්‍යක්ෂ සන්නිවේදකයෙකි. 2018 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට 2022 ජූනි මාසය දක්වා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ඵලදායීතා වෘත්තියෙකු වශයෙන් සේවය කළ අවධියේදී ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලයේ දෙපාර්තමේන්තු ප්‍රධානී වශයෙන් මෙන්ම ආසියානු ඵලදායීතා ආයතනයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද කටයුතු කර ඇත. 2006 වසරේ ශ්‍රී ලංකා පරිපාලන සේවයෙන් වෘත්තීය දිවිය ආරම්භ කර ඇති ඔහු 16 වසරකට අධික කීර්තිමත් සේවා කාලයකට හිමිකම් කියන අතර මේ වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු වන ශ්‍රේණියේ නිලධාරියෙකි. මෙම කාලය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණනාවක ප්‍රාදේශීය ලේකම්වරයෙකු වශයෙන් සේවය කර වසර 10 කට අධික පළපුරුද්දක් ලබා ඇත.

ප්‍රභාත් ජේ මලව්ගේ මහතා
කළමනාකාර අධ්‍යක්ෂ

වසර 18 කට අධික කාලසීමාවක් පුරා පැතිර පවතින ආදර්ශමත් විශිෂ්ට සේවා කාලය තුළ, සේවා සැපයුම් අංශයේ සහ වරාය කළමනාකාරීත්වයේ ජ්‍යෙෂ්ඨ තනතුරු දරණ ප්‍රභාත් ජේ. මලව්ගේ මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් පත් වී සිටී. විශිෂ්ට නායකත්වය සඳහා වූ පුළුල් පිළිගැනීමට පාත්‍රවී සිටින මලව්ගේ මහතාට ශ්‍රී ලංකා වරාය ඉතිහාසයේ ලාබාලතම කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පත්වීමේ භාග්‍ය හිමි වී ඇත.

කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබීමට ප්‍රථම ඔහු නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු (පරිශ්‍රී/භූවිද්‍යා තොරතුරු පද්ධති), ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්), අධ්‍යක්ෂ (සේවා සැපයුම්), අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පරිපාලන/මෙහෙයුම්) වැනි තනතුරු ඇතුළු ප්‍රධාන තනතුරු ගණනාවක් දරා ඇත. විවිධාකාර වූ විශේෂිත කළමනාකරණ නිපුණතා වලට එක්කාසුවූ ස්වකීය පෘථුල සේවා පසුබිම තුළින් ඔහු සතුව වරාය හා සේවා සැපයුම් අංශය පිළිබඳව පූර්ණ අවබෝධයක් පවතින බව මනාව විද්‍යාමාන වේ.

මලව්ගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වතු කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර, පේරාදෙනිය විශ්වවිද්‍යාලයෙන් ලබාගත් භූගෝලීය තොරතුරු හා දුරස්ථ සන්නිවේදනය පිළිබඳ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්වවිද්‍යාලයෙන් ලබාගත් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව මගින් සිය උපාධි අධ්‍යාපන සුදුසුකම් තවදුරටත් වැඩි කරගෙන ඇත.

මලව්ගේ මහතා ස්වකීය කළමනාකරණ විශේෂඥතාවයට අමතරව, දශක දෙකකට අධික කාලයක් තුළ වෘත්තීමය සුදුසුකම්ලත් දේශකයෙකු, පුහුණු කිරීමේ නිලධාරියෙකු හා වෘත්තිකයෙකු ලෙස භූ තොරතුරු විද්‍යාව හා දුරස්ථ සන්නිවේදන හා ඉඩම් දේපොළ කළමනාකරණ ක්ෂේත්‍රයට සුවිශේෂ දායකත්වයක් ලබා දී ඇත. මෙම ක්ෂේත්‍රයන් තුළ ඔහු සතුව පවතින පෘථුල විශේෂඥතාවය හා බැඳී පවතින ඉහළ මට්ටමේ ව්‍යාපෘති කළමනාකරණ පසුබිම ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියෙට අමිල වත්කමක් බව තහවුරු කරනු ලැබ ඇත.

මලව්ගේ මහතා සිය පූර්ණ කීර්තිමත් වෘත්තීය සේවා කාලය පුරාම ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ නම්‍යකරණය සඳහා විශිෂ්ට හා උද්යෝගී ඇල්මක් ඇති බව නිරතුරුවම ප්‍රදර්ශණය කර ඇත. ඔහුගේ ප්‍රවීනතාවය යටතේ කාර්යය සඳහා වූ ප්‍රවේශීය දැක්ම හා සුපරීක්ෂාකාරී අවධානය ආයතනයේ දියුණුව හා සාර්ථකත්වය කෙරෙහි අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු වී ඇත.

පී ඒ එස් අතුල කුමාර මහතා
අධ්‍යක්ෂ

පී ඒ එස් අතුල කුමාර මහතා ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (රාජ්‍ය පරිපාලන) (විශේෂ) උපාධිධාරියෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සිය ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති උපාධිය

ලබා ඇත. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු වන අතුල කුමාර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද ලන්ඩන් වරලත් රාජ්‍ය මුදල් හා ගිණුම්කරණ ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

1991 දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු වශයෙන් රාජ්‍ය සේවයට බැඳී 1992 දී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට ඇතුළත් වීමෙන් අනතුරුව 1992 – 1997 අතර කාලය තුළ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙසත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙසත් සේවය කළේය. 1997 – 2005 අතර කාලය තුළ උතුරු මැද පළාතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙස සේවය කර ඉන් අනතුරුව බත්තරමුල්ලේ පිහිටි මහවැලි, වාරිමාර්ග, රජරට සංවර්ධන හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරීවරයා ලෙස වසර දෙකක කාලයක් සේවය කර ඇත.

2007 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට බැඳුණු පී ඒ එස් අතුල කුමාර මහතා එහි විවිධ තනතුරු රාශියක් හෙබවීය. දැනට ඔහු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද වේ.

ඔහු ජාත්‍යන්තරව පිළිගත් ආයතන/ විශ්වවිද්‍යාල වලින් ගිණුම් මූල්‍ය කළමනාකරණය, ක්‍රමෝපායික සැලසුම් හා අවධානම් කළමනාකරණය පිළිබඳ විදේශ පුහුණුව ලබා ඇත.

තවද, ඔහු කලම්බු කොමර්ෂල් ෆර්ටිලයිසර් සමාගම, සී/ස මන්ටායි සෝල්ට් සමාගම, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, සී/ස සිලෝන් ඇග්‍රෝ ඉන්ටස්ට්‍රීස් සමාගම, සී/ස ලංකා හයිඩ්‍රොලික් සමාගම, සිලෝන් සෙරමික් කෝපරේෂන් යන ව්‍යවස්ථාපිත ආයතන වල අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතන වල විශේෂඥ කමිටු සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කර ඇත. ඊට අමතරව, 2012 සිට 2014 දක්වා දේශීය සංවර්ධන අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන්ද කටයුතු කර ඇත.

පී බී එස් සී නෝනිස් මහතා
අධ්‍යක්ෂ

පී බී එස් සී නෝනිස් මහතා දශක තුනකට අධික වූ ස්වකීය වෘත්තීය සේවා කාලය තුළ රාජ්‍ය සේවයේ තනතුරු දරණ පළපුරුදු කීර්තිමත් නිලධාරියෙකු වේ. දැනට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ඉහළම තනතුර වන රේගු අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරණ ඔහු රේගු ආදායම එකතු කිරීමේ, අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ හා දෙදහසක් ඉක්ම වන කාර්යමණ්ඩලය පරිපාලනය කිරීමේ ඍජු අධිකාරී බලය ඔහු වෙත පැවරී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ලැබූ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියක් සමඟ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් ඔහු වඩාත් ඇළුම්කල ආවසරික සහතිකයකින් ලැබූ සුදුසුකම් සහිතව ස්වකීය වෘත්තීය ගමන ආරම්භ විය. ඉන් අනතුරුව AUSAID ශිෂ්‍යත්වය ලබා ඔස්ට්‍රේලියාවේ ඇඩලේඩ්හි ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයෙන් පොදු පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස 1988 වර්ෂයේදී රාජ්‍ය සේවයට බැඳුණු සරත් නෝනිස් මහතා 1997 වර්ෂයේදී ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයට ඇතුළත් විය. වෘත්තියේ ඉහළ තලයට සීඝ්‍රයෙන් පැමිණ 1998 දී ධීවර හා සාගර සම්පත් අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුරට පත් වී පසුව මුදල් අමාත්‍යාංශයට ස්ථාන මාරු විය. එම අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු හා වෙළෙඳ අය කිරීම් හා ආයෝජන ප්‍රතිපත්ති වැනි අතිශය වැදගත් දෙපාර්තමේන්තුවල සේවයේ නියැලී නොමැකෙන සටහන් තබා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

2017 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම පාලක ජෙනරාල්වරයා ලෙස එම සේවයෙන් විශිෂ්ටත්වයට පත් නෝනිස් මහතා වෙත රජයේ වත්කම් කාර්යක්ෂම, ප්‍රතිඵලදායක ලෙස හා පිරිමැසුම්දායක ලෙස භාවිතා කිරීම සහතික කිරීමේ වගකීම පවරන ලදී. එහිදී අවකළමනාකරණය හා නාස්තිය පිටුදැකීම අරමුණුකොට රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා කේන්ද්‍රීය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම ඔහු විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග වලට ඇතුළත් වේ.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පසුව උසස් කිරීමෙන් පසුව, ඔහුගේ වගකීම් ජාතික අයවැය සම්පාදනය, රාජ්‍ය ව්‍යදම් කළමනාකරණය, වාණිජ ගබඩා පිළිබඳ සීමා, රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සහ අයවැය අධීක්ෂණය කිරීම දක්වා සරත් නෝනිස් මහතාගේ වගකීම් පුළුල් කරන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් ස්වකීය සේවා කාලය තුළ සංකීර්ණ ආරක්ෂක ප්‍රතිපත්තිමය කටයුතු ප්‍රශස්ත ලෙස මෙහෙයවීය. ද්වීපාර්ශ්වික හා බහුපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාව, යුධ උපකරණ ප්‍රසම්පාදනය සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ පරිපාලනමය ගැටළු විසඳීම ඔහුගේ වගකීම් වලට ඇතුළත් විය.

තවද, ඔහු ක්‍රමෝපායික අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික ආයතනයේ ෆුලර්ටන් සංසදය (IISS Fullerton Forum) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල්/ ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම්, ලෝක වෙළෙඳ සංවිධාන කවුන්සිලයේ රැස්වීම්, ආසියා හා නිරිත දිග ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා වූ යටිතල පහසුකම් මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රතිපත්ති කතිකාවත සඳහා වූ රැස්වීම් ආදී ජාත්‍යන්තර සංසද වලදී ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA) හා විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම ආදී වෙළෙඳ ගිවිසුම් ගණනාවක් සකස් කිරීමටද සම්බන්ධ වී ඇත.

කේ එන් කුමාරි සෝමරත්න මෙනවිය
අධ්‍යක්ෂ

කේ එන් කුමාරි සෝමරත්න මෙනවිය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් පත් කරනු ලැබ ඇත. පාඨශාලාචාරිණියක ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළ සෝමරත්න මෙනවිය රාජ්‍ය සේවයේ වසර 30 ක පළපුරුද්දක් ඇති නිලධාරිනියකි. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණු සෝමරත්න මෙනවිය පසුකාලීනව සෞඛ්‍යය, කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන යන අමාත්‍යාංශවල උසස් තනතුරු දැරීය. එකල පේෂ කර්මාන්ත නිෂ්පාදන දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ජනප්‍රිය කරවීමට ඇය විසින් සපයන ලද දායකත්වය විශේෂයෙන් කැපී පෙනෙන සංසිද්ධියකි.

පසුකාලීනව ඇය, ව්‍යාවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට පත් කරන ල අතර, එම අමාත්‍යාංශය යටතේ පැවති අපනයන සංවර්ධන මණ්ඩලය සහ ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ කාර්යයන් ඇයගේ අධීක්ෂණය යටතට පත් කරන ලදී. තවද, ඇය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්ද කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශයෙහි ක්‍රියාත්මක වූ ලෝක බැංකු ව්‍යාපෘතියක් වන පුරනැගුම වැඩසටහනෙහි ධාරිතා ගොඩනැගීමේ විශේෂඥවරිය ලෙස ද සෝමරත්න මෙනවිය කටයුතු කර ඇත. තවද, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය, තිරසර බලශක්ති අධිකාරිය සහ අපනයන සංවර්ධන මණ්ඩලය යන ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂිකාවක ලෙස ද ඇය කටයුතු කර ඇත.

සෝමරත්න මෙනවිය 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩ බලන සභාපතිනිය වශයෙන්ද කටයුතු කර ඇත. දැනට ඇය නාරා ආයතනයේ සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කරමින් සිටී. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අතර ඇය ව්‍යාපාර

කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ද, ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, ලබා ඇති අතර රජයේ ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද සමත් වී ඇත. දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා ඇය කෙටි කාලීන විදේශ පුහුණු වීම් කිහිපයකට ද සහභාගී වී ඇත.

එන් ඒ ඒ පී එස් නිස්සංක මහත්මිය
අධ්‍යක්ෂ

එන් ඒ ඒ පී එස් නිස්සංක මහත්මිය 1990 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන සේවයට බැඳුණු අතර, වර්තමානයේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන හා මානව සම්පත්) වශයෙන් සේවය කරයි. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක ලෙස සේවය කල එන් ඒ ඒ පී එස් නිස්සංක මහත්මිය මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් වශයෙන් ද සේවය කර ඇත.

ජේ ආර් යූ ද සිල්වා මහතා
අධ්‍යක්ෂ

නවෝත්පාදන මතධාරියෙකු වන රොහාන් ද සිල්වා මහතා බුද්ධිමත්ව හා අධිෂ්ඨානශීලීව විශිෂ්ටත්වය කරා ගමන් කරමින් සමූහ ව්‍යාපාර 75 කට අධික සංඛ්‍යාවක් පිහිටුවමින් මැක්ලරන්ස් සමූහ ව්‍යාපාරය රටෙහි විවිධ ප්‍රදේශවල ස්ථාපිත කිරීමට පියවර ගත්තාය. ඔහු ඉදිරි ගමන් මඟ ආදර්ශමත්ව සකස් කරගනිමින් සමාගම තුළ කාර්යානුරූපී සංස්කෘතියක් බිහි කර ව්‍යාපාරය විනිවිදභාවයෙන් යුතුව මෙහෙයවනු ලබයි.

රොහාන් ද සිල්වා මහතා මැක්ලරන්ස් සමූහ ව්‍යාපාරයේ වත්මන් සභාපතිවරයා ද වේ. එහි අධ්‍යක්ෂ මණ්ඩලය හා ක්‍රමෝපායයන් පිළිබඳ සිය කණ්ඩායම මෙහෙයවමින්, සමාගමේ ලාභදායීතාවය හා නව නාවික, සමුද්‍රීය සහ සේවා සැපයුම් හා සම්බන්ධ සේවාවන්හි වගකීම දරමින් කටයුතු කරයි. තවද, නව ආයෝජන, නවෝත්පාදන සහ ජ්‍යෙෂ්ඨ කුසලතා කළමනාකරණය ඔහු දැඩි උනන්දුවක් දක්වන අංශයන්ය. ශ්‍රී ලංකාවේ වරායයන්හි නාවික සේවා ප්‍රවර්ධනය කිරීමේ කටයුතු වලද නිරතව සිටී.

රාජ්‍ය අංශයේ සහ පුද්ගලික අංශයේ ප්‍රධාන පෙළේ ව්‍යාපෘති ගණනාවක් හා සම්බන්ධ විශේෂ කාර්යභාරයක් ඔහුගේ වෘත්තීය ජීවිතයට ඇතුළත්ව ඇත.

ගෝලීය සමුද්‍රීය හා සේවා සැපයුම් සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රමෝපායික නාවික කේන්ද්‍රස්ථානයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියේදී සිය සහයෝගය දක්වමින් රාජ්‍ය හා පුද්ගලික අංශයේ කාර්යභාරයන් ගණනාවකට දායකත්වය ලබා දෙන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු, හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් පුද්ගලික සමාගම සහ ජය බඳළු පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරනු ලබන අතර ඔහු ලංකා නැව් නියෝජිතයන්ගේ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

රොහාන් ද සිල්වා මහතා නැමීබියාවේ ශ්‍රී ලංකා ගරු කොන්සල්වරයා වශයෙන් ද පත් කර ඇත. ඔහු සිය කාලය කැප කරමින් ආයතන සහ කමිටු රාශියක සේවය කරමින් සිටී.

තවද, අවුරුදු ගණනාවක් තිස්සේ, මෝටර් රථ ධාවන තරඟ රාශියකට සහභාගී වී වාර්තා ගණනාවක් තබා ඇත. දක්ෂ බැඩ්මින්ටන් ක්‍රීඩකයෙකු ද වන රොහාන් ද සිල්වා මහතා ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලදී ජයග්‍රහණ රාශියක් අත්කරගෙන ඇත. ඒ අතර ප්‍රවීණ ගණයේ ක්‍රීඩකයින් සඳහා පවත්වන තරඟවලදී පිරිනමන "ශ්‍රී ලංකා ජාතික ශූරතාවය " ද ඇතුළත් වේ. ඔහු ජාත්‍යන්තර තරඟවලදී රන් පදක්කම් ලබා ඇත.

බැඩ්මින්ටන් ක්‍රීඩාව සඳහා වසර ගණනාවක් තුළ කැපවීමෙන් සහයෝගය දක්වා ඇති රොහාන් ද සිල්වා මහතා 2019 වසරේ ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සම්මේලනයේ සභාපතිවරයා ලෙස පත් කරන ලද

අතර මේ දක්වාම එම තනතුරේ කටයුතු කරමින් සිටී. ඔහු ඔටෝමොබයිල් ක්‍රීඩාවල සහ ශ්‍රී ලංකාවේ මෝටර් රථ ධාවන කමිටුවේ පාලන මණ්ඩලයෙහි ද නිලධාරියෙකු වේ.

ඔහුගේ අදහස් පෙරදැරිව මැක්ලරන්ස් සමූහ ව්‍යාපාරය මගින් අනාථ නිවාස හා වැඩිහිටි නිවාස රාශියකට උපකාර කරන අතර සංස්ථාපිත සමාජ වගකීම්/පුණ්‍ය ක්‍රියා ව්‍යාපෘති වශයෙන් වැලිකඩ බන්ධනාගාරයේ රැඳවියන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්හට විවිධ මට්ටමේ උපකාර කිරීමේ ද නිරතව සිටී.

මැක්ලරන්ස් සමූහ ව්‍යාපාරයේ සෑම අංශයක්ම මෙහෙයවනු ලබන්නේ දූරදර්ශී ව්‍යාවසායකයෙකු හා කෘතහස්ත නායකයෙකු වන රොහාන් ද සිල්වා මහතා විසිනි. ඔහු ව්‍යාවසායකයින් වෙත දෙන සරල එහෙත් වැදගත් උපදේශය වන්නේ කිසියම් ආයතනයක් උසස් නිෂ්පාදනයෙහි නියැලිය යුතු බවත්, ඒ සඳහා කාලය, උත්සාහය හා කැපවීම, මහපෙන්වීම හා මනා දැක්ම ඉතා වැදගත් වන බවත්, එමඟින් අතිශය අසීරු කාලවලදී වුවද ව්‍යාපාරය ශක්තිමත්ව පවත්වාගෙන යා හැකි බවත්ය. ‘‘අනලස්ව වැඩ කරන්න, අවධානයෙන් පසුවන්න, අවස්ථානුකූලව අභියෝගවලට මුහුණ දෙන්න’’ මේ ප්‍රායෝගික , යථාර්තවාදී මෙන්ම මානුෂීය නායකයෙකු වන රොහාන් ද සිල්වා මහතාගේ උපදෙස්ය.

එන් ආර් හේවාතන්ත්‍රී මහතා
අධ්‍යක්ෂ

නීතිඥ හේවාතන්ත්‍රී මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය ලබා ඇති අතර ඔහු සිවිල් හා මානව හිමිකම් නඩු වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන පෙළේ වෘත්තීය නීතිඥවරයෙකි.

ඔහුගේ වෘත්තීය ජීවිතයට අතිරේකව හේවාතන්ත්‍රී මහතා 1995 දී කොළඹ ගෑස් සමාගමේ නීති උපදේශක වශයෙන් ද, 1996 දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කළමනාකරණ මණ්ඩලයේ ද, 2001 දී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නීති කෙටුම්පත් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ද, 2004 දී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද, කටයුතු කර ඇති අතර 2010 දී සෞඛ්‍ය නියාමන කොමිෂන් සභාවේ ආරම්භක සාමාජිකයෙකු ද විය.

වෛද්‍ය උපුල් අජිත් මෙන්ඩිස් මහතා
අධ්‍යක්ෂ

වෛද්‍ය උපුල් අජිත් මෙන්ඩිස් මහතා **(MBBS/DLM/MCMA/FCMA)** කොළඹ විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධියක් ලබා ගෙන ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් අනතුරුව, ඔහු බදුල්ල මහ රෝහලේ නේවාසික වෛද්‍ය නිලධාරියා වශයෙන් සේවය ආරම්භ කළ වසර 35 ක ක්‍රියාකාරී සෞඛ්‍ය සේවය අවසානයේ ඉහළම පරිපාලන තනතුර වන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුර හොබවන ලදී. මෙම වසර 35 ක සේවා කාලය තුළ ඔහු වෛද්‍ය අධිකාරී, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, වෛද්‍ය සැපයුම් කොට්ඨාශයේ අධ්‍යක්ෂ, වෛද්‍ය තාක්ෂණ හා සැපයුම් අධ්‍යක්ෂ හා රසායනාගාර සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු ද දරා ඇත.

ඉන් අනතුරුව, ශ්‍රී ලාංකීය ප්‍රජාව සඳහා පොදු සෞඛ්‍ය සේවා සපයන රාජ්‍ය නොවන සංවිධානයක් වන Population Services Lanka සමාගමේ දේශීය අධ්‍යක්ෂ වශයෙන්ද ඔහු සේවය කර ඇත. නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ සභාපතිවරයා ලෙස ඔහු පත් කරන ලද අතර 2022 මැයි දක්වා එම තනතුරෙහි කටයුතු කරන ලදී. එම කාලසීමාව තුළදීම ඔහු රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද සේවය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය

වෛද්‍ය අජිත් මෙන්ඩිස් මහතා රජයේ හා පෞද්ගලික සෞඛ්‍ය සේවයේ වසර 45 කට ආසන්න කීර්තිමත් වෘත්තීය දිවියෙන් බැහැරව, 2022 ජූනි මස දී ශ්‍රී ලංකා ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (පුද්ගලික) සමාගමේ උප සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර 2023 අගෝස්තු දක්වා ඔහු විසින් එම ආයතනයේ අභිවෘද්ධිය උදෙසා විශාල කාර්යභාරයක් ඉටු කරන ලදී.

වෛද්‍ය මෙන්ඩිස් මහතා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ලෙස 2023 අගෝස්තු මස පත් වීමත් සමඟ යළි සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වූ අතර මේ දක්වා එම තනතුර දරමින් සිටී.

වෛද්‍ය අජිත් මෙන්ඩිස් මහතා, දැනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරමින් සිටී.

ෂෙහාරා නවරත්න මහත්මිය
නීති උපදේශක/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

කළමනාකාරීත්ව කමිටුව

කීත් ඩී බර්නාඩ් මහතා
සභාපති

ජී යූ කේ අල්ගේවත්තගේ මහතා
උප සභාපති

ප්‍රභාත් ජේ මලවිගේ මහතා
කළමනාකාර අධ්‍යක්ෂ

ඩී එල් ආර් වීරසිංහ මහතා
අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)

ඩබ්. එම් නලින් අපෝන්සු මහතා
අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පරිපාලන/මානව සම්පත් කළමනාකරණ)

ජේ ඒ චන්ද්‍රරත්න මහතා
අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)

මේජර් ජෙනරාල් සුදත් පෙරේරා (විශ්‍රාමික)
අධ්‍යක්ෂ (ආරක්ෂක)

ජී වී ටී නානායක්කාර මහතා
අධ්‍යක්ෂ (තාක්ෂණ)

කේ ජී එස් දයානන්ද මහතා
අධ්‍යක්ෂ (අළෙවි හා ව්‍යාපාර සංවර්ධන)

ජී ඉසෙඩ් මිස්කින් මහත්මිය
අධ්‍යක්ෂ (සේවා සැපයුම්/මානව සම්පත් හා පරිපාලන)

ජී එන් ලියනගේ මහත්මිය
අධ්‍යක්ෂ (මුදල්)

එච් ජේ කේ යූ කුමාර මහතා
අධ්‍යක්ෂ (මෙහෙයුම්)

අපර්ණා තිලකරත්න මහත්මිය
ප්‍රධාන නීති නිලධාරිනී

නිර්මාල් ද ෆොන්සේකා මහතා
ප්‍රධාන අභ්‍යාස කළමනාකරු

ඩී ජී ආර් එම් පතිවිල මහතා
ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්)

කපිතාන් කේ එම් එන් පී සිල්වා
හාබර් මාස්ටර්

නෙළුම් අනවරත්න මහත්මිය
ප්‍රධාන කළමනාකරු (පරිපාලන)

චිත්‍රාල් ජයවර්ණ මහතා
ප්‍රධාන කළමනාකරු (සන්නිවේදන හා මහජන සබඳතා)

ටී සී කේ පරණවිතාන මහතා
ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)

එෆ් එම් හුසේන් මහත්මිය
ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන)

කේ එස් හෙට්ටිආරච්චි මහතා
ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික වැඩ)

එල් පී එස් චන්දන මහතා
ප්‍රධාන මෙහෙයුම් කළමනාකරු (බහළු මෙහෙයුම්)

එම් ආර් එම් රම්සීන් මහතා
ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා)

එන් එන් ජේ ඒ කුමාර මහතා
ප්‍රධාන ඉංජිනේරු (නාවික)

ටී කේ ජී එල් හේමචන්ද්‍ර මහතා
ප්‍රධාන ඉංජිනේරු (විදුලි)

සී එල් දසනායක මහතා
ප්‍රධාන ඉංජිනේරු (සංවර්ධන)

ජී එච් ආර් පෙරේරා මහත්මිය
ප්‍රධාන අභ්‍යන්තර විගණක

එම් වී එස් ප්‍රනාන්දු මහතා
ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ)

ඒ බී එම් අස්වර් මහතා
ප්‍රධාන මෙහෙයුම් කළමනාකරු (සාම්ප්‍රදායික නැව්බඩු)

පී පී ප්‍රදීප් නිශාන්ත මහතා
ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්)

ඩබ් පී එස් පෙරේරා මහතා
ප්‍රධාන කළමනාකරු (අළෙවි)

ප්‍රසාද් සුභවික්‍රම මහතා
ප්‍රධාන කළමනාකරු (පරිශ්‍ර හා දේපළ කළමනාකරණ)

එම් පී මදාරසිංහ මහත්මිය
ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති)

ටී ආර් ඩබ්. ඇලපාත මහතා
ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)

වෛද්‍ය කන්දෙගෙදර
ප්‍රධාන වෛද්‍ය නිලධාරී

ආර් ඒ පී පී රූපසිංහ මහතා
ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ)

2023 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වෙනස්වීම්

විශ්‍රාම ගැනීම්

සුසන්ත අබේසිරිවර්ධන මහතා, කළමනාකාර අධ්‍යක්ෂ ශ්‍රී ලංකා වාරය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

පී ඒ ආර් ඩී පතිරාජ මහතා, අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) ශ්‍රී ලංකා වාරය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

එස් එච් තිලකපාල මහතා, ප්‍රධාන අභ්‍යාස කළමනාකරු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

පත් කිරීම්

ප්‍රභාත් ජේ මලවිගේ මහතා කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

ඩී එල් ආර් වීරසිංහ මහතා, අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්) ලෙස පත් කරන ලදී.

ඩබ්. එම් නලින් අපෝන්සු මහතා, අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පරිපාලන/මානව සම්පත් කළමනාකරණ) ලෙස පත් කරන ලදී.

ජේ ඒ චන්ද්‍රරත්න මහතා, අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) ලෙස පත් කරන ලදී.

ජී ඉසෙඩ් මිස්කින් මහත්මිය, අධ්‍යක්ෂ (සේවා සැපයුම්/මානව සම්පත් හා පරිපාලන) ලෙස පත් කරන ලදී.

ජී එන් ලියනගේ මහත්මිය, අධ්‍යක්ෂ (මුදල්) ලෙස පත් කරන ලදී.

එච් ජේ කේ යූ කුමාර මහතා, අධ්‍යක්ෂ (මෙහෙයුම්) ලෙස පත් කරන ලදී.

නිර්මාල් ද ෆොන්සේකා මහතා, ප්‍රධාන පුහුණු කළමනාකරු ලෙස පත් කරන ලදී.

කේ එස් හෙට්ටිආරච්චි මහතා, ප්‍රධාන කළමනාකරු (යාන්ත්‍රික වැඩ) ලෙස පත් කරන ලදී.

එම් ආර් එම් රම්සීන් මහතා, ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා) ලෙස පත් කරන ලදී.

සී එල් දසනායක මහතා, ප්‍රධාන ඉංජිනේරු (සංවර්ධන) ලෙස පත් කරන ලදී.

ජී එච් ආර් පෙරේරා මහත්මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් කරන ලදී.

එම් වී එස් ප්‍රනාන්දු මහතා, ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රෝපකරණ) ලෙස පත් කරන ලදී.

ඒ බී එම් අස්වර් මහතා, ප්‍රධාන මෙහෙයුම් කළමනාකරු (සාම්ප්‍රදායික මෙහෙයුම්) ලෙස පත් කරන ලදී.

පී පී ප්‍රදීප් නිශාන්ත මහතා, ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්) ලෙස පත් කරන ලදී.

ඩබ්. පී එස් පෙරේරා මහතා, ප්‍රධාන කළමනාකරු (අළෙවි) ලෙස පත් කරන ලදී.

එම් පී මදාරසිංහ මහත්මිය, ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති) ලෙස පත් කරන ලදී.

කළමනාකාරීත්ව කමිටුව

ටී ආර් ඩබ්. ඇලපාත මහතා, ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) ලෙස පත් කරන ලදී.

වෛද්‍ය කන්දෙගෙදර, ප්‍රධාන වෛද්‍ය නිලධාරී (ද්විතීක පදනම මත) ලෙස පත් කරන ලදී.

ප්‍රසාද් සුභවික්‍රම මහතා, ප්‍රධාන කළමනාකරු (පරිශ්‍ර හා දේපළ කළමනාකරණ) ලෙස පත් කරන ලදී.

ආර් ඒ පී පී රූපසිංහ මහතා, ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) ලෙස පත් කරන ලදී.

ගෝලීය වෙළෙඳාමේ අතිශය වැදගත් කේන්ද්‍රස්ථානයක් ලෙස කොළඹ වරාය පසුවන ස්ථානය ශක්තිමත් කරගනිමින් 2023 වර්ෂයේදී සමුද්‍රීය කටයුතුවල කැපී පෙනෙන සීඝ්‍ර වර්ධනයක් අත්දකින ලදී. උපාය මාර්ගික සැලසුම් සහ මෙහෙයුම් හැකියාවන් තුළින් ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රයෙහි සිය ප්‍රගමනය ශක්තිමත් කරමින් වරාය විවිධ අංශයන්හි සුවිශේෂී වර්ධනයක් අත්කර ගනු ලැබීය.

වරාය කටයුතු පුළුල් කිරීමේ පියවරෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2023 වර්ෂය තුළ විවිධ නෞකාවල පැමිණීමේ සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. බහළු නෞකා පැමිණීම් 3,890 කට ළඟා වෙමින් 18.3% කින් ඉහළ ගිය අතර සාම්ප්‍රදායික නැව්බඩු නෞකාවල පැමිණීම 3.2% ක සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. උසස් මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා සේවා විශිෂ්ටත්වය පෙන්නුම් කරමින් යාත්‍රාවලට ඉන්ධන සැපයීම, අළුත්වැඩියා කිරීම සහ නෞකාවලට භාණ්ඩ සැපයීම (Shipp Chandelling) වැනි අත්‍යාවශ්‍ය සේවා ඇතුළු "වෙනත් සේවාවන්" කාණ්ඩයේ සේවාවන් වල 33.7% ක පැහැදිලි වර්ධනයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, වෙනස්වන වෙළෙඳ ගතිකත්වයන් පිළිඹිබු කරමින් දියර තොග සහ රෝල් ඔන්/ රෝල් ඕෆ් වැනි ඇතැම් නැව්බඩු මෙහෙයුම් 21.4% කින් අඩු විය.

පෙර වර්ෂයේ බහළු මෙහෙයුම් ධාරිතාවය වූ බහළු විස්සේ සම ඒකක 6,862,184 ට සාපේක්ෂව 2023 වර්ෂයේදී බහළු විස්සේ සම ඒකක 6,949,912 ක් මෙහෙයුම් කරමින් 1.3% ක සුළු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සංඛ්‍යාත්මක වෙන් කර දැක්වීමේදී ජය බහළු පර්යන්තය සහ නැගෙනහිර බහළු පර්යන්තය ඒකාබද්ධව බහළු විස්සේ සම ඒකක 1,965,131 ක් මෙහෙයවමින්, සමස්ත බහළු ධාරිතාවයෙන් 28.3% ක් මෙහෙයවන ලදී. එමෙන්ම , බහළු විස්සේ සම ඒකක 1,763,863 ක් මෙහෙයවමින් සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් සමාගම 25.4% ක කෙටස් හිමිකාරීකාරීත්වයක් දරණ ලද අතර බහළු විස්සේ සම ඒකක 3,220,918 ක් මෙහෙයුම් කරමින් කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම 46.3% ක දායකත්වයක් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්ත සහ කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්තවල සහ කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායික උපාය මාර්ග ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාමාර්ගවලට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනට පවතින හවුල්කාරීත්වය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත අමතර ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම සඳහා පර්යන්ත සේවා ගිවිසුම්වලට එළඹීම ආදිය මෙයට ඇතුළත් වේ.

පෙර වර්ෂයේ මෙහෙයුම් කරන ලද ටොන් 96,170,000 ට සාපේක්ෂව මෙම වර්ෂයේ කොළඹ වරාය විසින් මෙහෙයුම් කරන ලද නැව්බඩු ටොන් ප්‍රමාණය 3.6% ක වර්ධනයක් සනිටුහන් කරමින් ටොන් 99,673,000 ක් දක්වා ඉහළ යන ලදී. යකඩ/ වානේ හා පොහොර ආනයනය අඩු වීම හේතුවෙන් තොග කඩන නැව්බඩු ටොන් ප්‍රමාණය 23.1% ක සැලකිය යුතු පහල වැටීමක් දක්නට ලැබුණි. එසේම, සිමෙන්ති, තිරුඟු හා බඩ ඉරිඟු, යන ධාන්‍ය වර්ග ආනයනය අඩු වීම හේතුවෙන් වියළි තොග නැව්බඩු මෙහෙයුම් 28.4% ක සැලකිය යුතු පහළයාමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, බොරතෙල් ආනයනය ඉහළ යාම හේතුවෙන් මෙහෙයවන ලද දියර තොග නැව්බඩු ටොන් ප්‍රමාණය 12.7% ක සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම, මෙම කාලසීමාව තුළදීම බහළුගත නැව්බඩු ටොන් ප්‍රමාණය 3.9% ක වර්ධනයක් වාර්තා විය.

2023 වර්ෂයේදී ගෝලීය වරාය සංසදයේ සම්මාන ප්‍රධානෝත්ස්වයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2023 වසරේ වරාය අධිකාරියට හිමි සම්මානය හා 2023 වසරේ රජයට අයත් හොඳම බහළු පර්යන්තයට හිමි සම්මානය ඇතුළු ගෞරව සම්මානයන්ගෙන් පිදුම් ලැබීය. ගෝලීය සමුද්‍රීය භූදර්ශකය තුළ කොළඹ වරායේ සුවිශේෂී ප්‍රමුඛතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය දරණ උත්සාහය අගය කිරීමක් වශයෙන් මෙම ගෞරව සම්මාන පිරිනමන ලදී.

විශිෂ්ටත්වය කරා තරඟකාරීව ඉදිරියට යන ගමනේදී රාජ්‍ය තාන්ත්‍රික නියෝජිත කණ්ඩායම්, ජාත්‍යන්තර ප්‍රජාව, දේශීය රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් උපාය මාර්ගිකව සම්බන්ධ කරගනිමින් වරාය සංචාර 100 පමණ සංවිධානය කළෙමු. තවද, ප්‍රධාන නැව් සමාගම් නියෝජිතයින්ද බංග්ලාදේශයේ හා ඉන්දියාවේ පවත්වන ලද ජාත්‍යන්තර ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු මගින් අපගේ ගෝලීය පියසටහන් ප්‍රචාරණය වී, කලාපීය සමුද්‍රීය හවුල්කරුවෙකු වශයෙන් අපගේ ප්‍රගමනය ශක්තිමත් විය.

සමුද්‍රීය විශිෂ්ටත්වයේ සුවිශේෂී සංකේතයක් ලෙස, කොළඹ වරාය එහි මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ, උසස් සේවා තත්ත්වයේ සහ වෙළෙඳපොළ නායකත්වයේ නව මිනුම් සලකුණු තැබීම අඛණ්ඩවම සිදු කරයි. නවීකරණය, සහයෝගීතාවය සහ පරිභෝගික කේන්ද්‍රිකතාවය මූලික කොටගෙන ගොඩනගන ලද ශක්තිමත් අත්තිවාරමක් සහිතව ගෝලීය වෙළෙඳාමේ සංකීර්ණතාවයන් අභිබවමින් කලාපයේ ආර්ථික වර්ධනයේ හා සෞභාග්‍යයේ ප්‍රමුඛ නියමුවා ලෙස ඉදිරියට ගමන් කිරීම වරායේ ඒකායන අධිෂ්ඨානය වේ.

2023

සංවර්ධන ව්‍යාපෘති

සමුද්‍රීය යටිතල පහසුකම් සහිත වූ ගතික පරිසරයක් තුළ වරාය සංවර්ධන හා වාණිජ සේවා සැපයුම් ක්ෂේත්‍රයේ කලාපීය ප්‍රමුඛයෙකු ලෙස සිය ස්ථානය ස්ථාවරව පවත්වා ගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2023 වර්ෂයේ අභිප්‍රායික ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැලසුම් හා සංවර්ධන, කොන්ත්‍රාත් හා සැලසුම් හා සංවර්ධන යන කොට්ඨාශ වල මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම ක්‍රමෝපායික පියවරයන් ශ්‍රී ලංකාව සතු සමුද්‍රීය ශක්‍යතාවයන් පාදක වූ සුවිශාල වැදගත්කමක් දරනු ලබන අතර සැලකිය යුතු ආර්ථික වර්ධනයක් ගොඩනැගීමට දායක වේ. විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් හරහා 2023 වර්ෂය තුළ අත්කරගත් විශිෂ්ට ප්‍රගතිය, රටෙහි සමුද්‍රීය ක්ෂේත්‍රය දියුණුකිරීමට හා ඉහළම ඵලනෙලා ගැනීම සඳහා ආයතනයේ කැපවීම අවධාරණය කරනු ලබයි.

1. නැගෙනහිර බහළු පර්යන්තය

කොළඹ දකුණු වරායේ නැගෙනහිර බහළු පර්යන්තය, මීටර් 18 සිට මීටර් 20 දක්වා පරාසයක ගැඹුර සහිත නැංගුරම්පොළවල මීටර් 400 ක් හෝ ඊට වඩා වැඩි දිගින් යුත් අති විශාල බහළු ප්‍රවාහන නෞකා තුනකට නැංගුරම්ලෑමේ පහසුකම් සැපයීම සඳහා සැලසුම් කර ඇත. මෙම පර්යන්තය ආසන්න වශයෙන් හෙක්ටයාර් 72 ක භූමි ප්‍රදේශයක විහිදෙන අතර වාර්ෂික විස්සේ සම ඒකක මිලියන 3.0 ක බහළු මෙහෙයුම් ධාරිතාවයකින් යුක්ත වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2015 වසරේදී මීටර් 600 ක ජැටි බැම්මක්, මීටර් 440 ක මෙහෙයුම් නැංගුරම්පොළක්, හෙක්ටයාර 18 ක අංගනයක්, පර්යන්ත මාර්ග හා අදාළ ගේට්ටු පහසුකම්වල ඉදිකිරීම් අවසන් කරන ලදී. නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර - I හි මෙහෙයුම් 2020 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ විය.

හවුල් ව්‍යාපාරයක් වන ඇක්සස් ඉංජිනියරින් පීඑල්සී හා සී/ස වයිනා හාබර් ඉංජිනියරින් සමාගම විසින් නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර II හි සිවිල් ඉදිකිරීම් වැඩ 2022.01.04 දින ආරම්භ කර ඉදිකිරීම් මේ වන විට ක්‍රියාත්මකව පවතී. දැනට පවත්නා මීටර් 600 ක් දිග ජැටි බැම්ම සඳහා මීටර් 18 ගැඹුර සහිත නැංගුරම්පොළක් පවතින අතර ඉතිරි මීටර් 700 ක ජැටි බැම්ම සඳහා මීටර් 20 ක් ගැඹුරැති නැංගුරම්පොළක් ඉදි කිරීමට සැලසුම් කර ඇත. සිවිල් ඉදිකිරීම් වැඩ වල සමස්ත භෞතික ප්‍රගතිය 24.5% ක් වේ.

1.1 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා උපකරණ ප්‍රසම්පාදනය

නැගෙනහිර බහළු පර්යන්තයේ මෙහෙයුම් සාර්ථකව සිදු කිරීම සඳහා පහත සඳහන් උපකරණ සමූහය ප්‍රසම්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

අ) නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර (STS) 12 ක් සහ රේල් පීලි මත දිවෙන ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර (ARMGs) 40 ක් ප්‍රසම්පාදනය කිරීම.

සමස්ත කොන්ත්‍රාත් මිල	-	ඇ.එ.ජ.ඩොලර් මිලියන 282
පළමු තොගය (නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් සිදු කරන (STS) දොඹකර ක් 06 රේල් පීලි මත දිවෙන ගැන්ට්‍රි දොඹකර (ARMGs) 20ක්) භාර දීමේ ඇස්මේන්තුගත දිනය	-	2024 දෙවන කාර්තුව
භෞතික ප්‍රගතිය	-	කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර ඉදිකිරීම් වැඩ සිදු කෙරෙමින් පවතී.
මූල්‍ය ප්‍රගතිය	-	ඇ.එ.ජ.ඩොලර් මිලියන 141 (ඇ.එ.ජ.ඩො.මි. 113 + ඇ.එ.ජ.ඩො.මි. 28)

ආ) ස්ට්‍රැඩල් කැරියර්ස් 15 ක් ප්‍රසම්පාදනය කිරීම

භාරදීමේ ඇස්තමේන්තුගත දිනය	-	2025 දෙවන කාර්තුව
ඇස්තමේන්තුගත පිරිවැය	-	ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 25
භෞතික ප්‍රගතිය	-	ලංසු කැඳවා ඇත.

ඇ) ස්ට්‍රැඩල් කැරියර්ස් 15 ක් ප්‍රසම්පාදනය කිරීම

භාරදීමේ ඇස්තමේන්තුගත දිනය	-	2025 තෙවන කාර්තුව
ඇස්තමේන්තුගත පිරිවැය	-	ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 25
භෞතික ප්‍රගතිය	-	ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

1.2 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් ගොඩනැගිල්ල

නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර - II සංවර්ධන ව්‍යාපෘතියේ අංගයක් ලෙස නැගෙනහිර බහළු පර්යන්තය සඳහා රුපියල් මිලියන 1,600 ක ඇස්තමේන්තුගත පිරිවැයකට මහල් හතරකින් යුත් මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙහි ඉදිකිරීම් කටයුතු 2023 ජූලි මස ආරම්භ කරන ලද අතර වසර අවසානය වන විට මූලික සිවිල් වැඩවලින් 57% ක් පමණ අවසන් කර ඇත.

2. බටහිර බහළු පර්යන්තය - I (WCT – I)

කොළඹ දකුණු වරායේ බටහිර බහළු පර්යන්තය - I මීටර් 20 ක් ගැඹුරැති නැංගුරම්පොළ මීටර් 400 ක් හෝ ඊට වඩා වැඩි දිගින් යුත් අති විශාල බහළු නෞකා තුනකට නැංගුරම්ලෑමේ පහසුකම් සැපයිය හැකි වන ලෙස සැලසුම් කර ඇති මීටර් 1400 ක් දිග ජැටි බැම්මකින් සමන්විත පර්යන්තයක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර ඇත. ආසන්න වශයෙන් හෙක්ටයාර 65 ක භූම ප්‍රදේශයක ඉදිවන මෙම පර්යන්තය මගින් වාර්ෂිකව බහළු විස්සේ සම ඒකක මිලියන 3.0 ක් මෙහෙයුම් කිරීමට සැලසුම් කර ඇත.

වසර 35 ක් සඳහා ඉදිකර මෙහෙයුම් කර පවරා දීමේ පදනම යටතේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, Adani Ports Special Economic Zone Ltd., සමාගම සහ සිය දේශීය හවුල්කාර සමාගම වන John Keells Holdings PLC සමාගම හා එක්ව පර්යන්ත මෙහෙයුම්කරු ලෙස "කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (පුද්.) සමාගම" (CWIT) ස්ථාපිත කර ඇත. ඉදිකර මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුම 2021.09.30 දින ක්‍රියාත්මක කරන ලද අතර එකී ගිවිසුම 2022.02.25 දින අත්සන් කරන ලදී.

2023.12.31 දිනට අත්කරගත් සුවිශේෂී සන්ධිස්ථාන ඇතුළුව ඉදිකිරීම් වල 39.5% ක් වන සමස්ත වත්මන් භෞතික ප්‍රගතියට ගොඩ කිරීම්, හෑරීම, සමුද්‍රීය කටයුතු, පසුපස අංගනය සහ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ ඇතුළත් වේ.

3. බටහිර බහළු පර්යන්තය - II සඳහා දියකඩනය දීර්ඝ කිරීම්

2019 ජාතික වරාය ප්‍රධාන සැලැස්මට අනුගතව, බටහිර බහළු පර්යන්තය - II ස්ථාපිත කිරීම සඳහා කොළඹ දකුණු වරායේ බටහිර දියකඩනය දීර්ඝ කිරීම ඉදිරි සංවර්ධන කාර්යයට ඇතුළත් වන අතර එමඟින් බටහිර බහළු පර්යන්තය I හි ජැටි බැම්ම දීර්ඝ කෙරෙනු ඇත.

බටහිර බහළු පර්යන්ත II පිටුපස අවම වශයෙන් හෙක්ටයාර 50 – 70 ක භූමිය ඇතුළත් වන ලෙස තවදුරටත් ගැඹුරු මුහුදේ බටහිර දෙසට දීර්ඝ කරමින් දැනට පවත්නා බටහිර දියකඩනය දීර්ඝ කිරීම බටහිර බහළු පර්යන්තයේ II ට ඇතුළත් වේ. මෙම දීර්ඝ කිරීමේ කාර්යයට දකුණු වරාය ද්‍රෝණිය හා බටහිර බහළු පර්යන්ත I ට යාබදව විස්සේ සම ඒකක මිලියන 3.5 ක ධාරිතාවයක් ඇති කරමින් මීටර් 20 ගැඹුරැති මීටර් 1200 - මීටර් 1400 ජැටි බැම්ම නිර්මාණය කෙරේ. මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම වීමෙන් පසුව බටහිර බහළු පර්යන්ත - I සහ බටහිර බහළු පර්යන්ත - II ඇතුළුකොට මීටර් 18 – 20 ගැඹුරැති මීටර් 2600 – 2800 ක සෘජු ජැටි බැම්මක් කොළඹ වරායෙහි ඉදිවනු ඇත. මීට අමතරව, බටහිර බහළු පර්යන්ත II හි පිටුපස හෙක්ටයාර 50 -70 භූමි ප්‍රදේශයක් සේවා සැපයුම් පහසුකම් සඳහා වෙන් කෙරෙනු ඇත.

මෙම දියකඩනය දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භයේ සිට වසර 05 ක කාල පරිච්ඡේදයක් ගතවනු ඇතැයි අපේක්ෂා කෙරේ. බටහිර බහළු පර්යන්ත II දීර්ඝ කිරීම දියකඩනයේ කොටසක් වශයෙන් දීර්ඝ කිරීමෙන් ආරම්භ කළ හැක. 2028 වර්ෂයට පසුව ධාරිතාවය හීනවීම හා ව්‍යාපාර අහිමිවීම වැළැක්වීම සඳහා 2025 වර්ෂය වන විට බටහිර බහළු පර්යන්ත II ආරම්භ කිරීම අනිවාර්ය වේ. 2030 අවසන් වීමට පෙර මෙහෙයුම් ආරම්භ කිරීමට අරමුණු කරගන්නේ නම්, සියළුම තාක්ෂණික හා මූල්‍ය අංගයන් සියල්ල සම්පූර්ණ වීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් විය යුතුය.

ප්‍රමාණවත් අධ්‍යයනයන් අවසන් කර ඇතත් ව්‍යාපෘතිය සංකල්පනාත්මක අදියරේ පවතී. එබැවින් ව්‍යාපෘතියේ විස්තීර්ණ සංවර්ධනය සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පවතී. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව මෙම කාර්ය පිළිගත් වරාය සංවර්ධන උපදේශක සමාගමක් වෙත පවරනු ලැබේ. සවිස්තරාත්මක සැලැසුම් කාර්යයට ආසන්න වශයෙන් වසර දෙකක් ගතවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය ඇතිව මෙම අධ්‍යයනය සඳහා සුදුසු උපදේශකවරයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබා ගෙන ඇත. ප්‍රසම්පාදන ආයතනය එහි කාර්යභාරය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් යෝජනා සඳහා ඉල්ලීම් කිරීම සඳහා උපදේශකවරුන් කෙටි ලැයිස්තුගත කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර දැනට යෝජනා සඳහා ඉල්ලීම් නිකුත් කිරීමේ කටයුතු සිදු කරමින් සිටී.

4. ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

ගාල්ල වරාය සංචාරක කටයුතු හා ප්‍රාදේශීය වාණිජ කටයුතු යන කාර්ය දෙඅංශය සඳහාම පහසුකම් සපයන බහු කාර්ය කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කිරීම ගාල්ල වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම සැලසුම්ගත සංවර්ධනය මගින් තිරසර සාම්ප්‍රදායික වරාය සේවා අභිබවමින් ලබා දීමට පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගත හැකි තිරසර ආදර්ශකයක් ඇති කිරීමට හැකි වේ. ගාල්ල බොක්කේ උපාය මාර්ගික භූගෝලීය පිහිටීමේ වාසිදායක තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී විවේකය ගත කිරීම සඳහා සහ දේපොළ සංවර්ධනය සඳහා අවස්ථා නිර්මාණය කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ.

ගැඹුරු මගී පර්යන්තයක්, එකිනෙක සම්බන්ධ වූ රැඳවුම් බැම්මක්, දියකඩන ඉදිකිරීම, පිවිසුම් ඇළ මාර්ගය සහ වරාය ද්‍රෝණිය හැරීම මෙන්ම ඉඩම් ගොඩකර සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. වාණිජ හා විනෝදාස්වාදය ගෙන දෙන පහසුකම් මිශ්‍රණයක් හරහා ආර්ථික වර්ධනය අපේක්ෂා කරමින් ගොඩකර සංවර්ධනය කරන ඉඩම් මිශ්‍ර සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනෙනු ඇත. ගාල්ල ප්‍රදේශයේ මෙන්ම සමස්ත රටෙහි ආර්ථික සංවර්ධනයට සමාන්තරව ප්‍රතිලාභ අත්කර ගැනීමේ ඉලක්කයට මෙම විස්තීර්ණ සැලැස්ම අනුගත වේ.

ඒ අනුව, ප්‍රසම්පාදන කාර්ය ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම පරිණාමනීය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා

ආයෝජකයෙකු තොරා ගැනීම සඳහා අභිලාෂිය ප්‍රකාශ කිරීම හා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම 2024 වසරේ දී සිදු කිරීමට නියමිතය.

5. කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශක සේවාව

නැවිබඩු ධාරිතාවයෙහි ප්‍රක්ෂේපිත වැඩි වීමට පිළියම් ලෙස නැගෙනහිර බහළු පර්යන්ත අදියර - II හා බටහිර බහළු පර්යන්ත - I ක්‍රියාත්මක කිරීමේ කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වර්තමානයේ ක්‍රියාත්මක කරමින් සිටී. මෙම පර්යන්ත දෙකෙහි ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු බටහිර බහළු පර්යන්ත - II, 2028 වසරේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වුවද, කොළඹ වරායට පැමිණෙනැයි පුරෝකථනය කර ඇති බහළු ධාරිතාවය මත පදනම්ව 2030 වර්ෂය වන විට සමස්ත වරාය බහළු ධාරිතාවයේ උපරිමයට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට ප්‍රතිචාර ලෙස දැනට පවත්නා කොළඹ වරායේ උතුරු දිශාවෙන් කොළඹ උතුරු වරාය ලෙසින් හඳුන්වන නව වරායක් ඉදිකිරීමේ කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආරම්භ කර ඇත.

යෝජිත කොළඹ උතුරු වරාය මෝදර ප්‍රදේශයේ කැළණි නදිය අසල සිට කොළඹ වරායේ පවත්නා උතුරු දියකඩනය තෙක් දීර්ඝ කිරීමට අපේක්ෂා කෙරේ. දියර තොග, වියළි තොග, රෝ රෝ සහ බහළු මෙහෙයුම් සඳහා උතුරු වරාය භාවිතා කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කර ඇත. ඉල්ලුමට අනුගතව උතුරු වරායේ ඉදිකිරීම් කටයුතු අදියර වශයෙන් සිදු කරන අතර අපේක්ෂිත ඉල්ලුමට සරිලන යටිතල පහසුකම් සහ වරාය සේවාවන් ලබා දීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවී සිටී.

මෙම කාර්යයෙහි වැදගත්කම හඳුනාගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් AECOM Infrastructure and Environment UK Limited සමාගම හරහා කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ආරම්භ කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් දායකත්වයෙන් ප්‍රවාහන ව්‍යාපෘති ප්‍රාරම්භක පහසුකම් යටතේ මෙම උපදේශන කාර්ය සිදු කර ගෙන යනු ලැබේ.

AECOM සමාගම විසින් මෙහෙයවන ලද මෙම උපදේශක සේවාව මගින් ශක්‍යතා අධ්‍යයන වාර්තාව හා පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) වාර්තාව සාර්ථකව අවසන් කර ඇත. මෙම පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව මහජන අදහස් ලබා ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CC & CRMD) වෙත ඉදිරිපත් කර ඇති අතර මෙම ක්‍රියාවලියට පසුව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘති කාර්යය සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුමට අනුගතව අවශ්‍ය යටිතල පහසුකම් හා වරාය සේවා නිසි කලට සැපයීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අවධානයෙන් පසු වේ.

6. ත්‍රිකුණාමලය වරායේ වරාය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම

ත්‍රිකුණාමලය වරායේ වාසිදායක පිහිටීම, ගැඹුරු වරාය යටිතල පහසුකම් සහ කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා යෝග්‍ය වරාය ආශ්‍රිත පුළුල් ප්‍රදේශය භාවිතයට ගනිමින් එම ප්‍රදේශයේ ආර්ථික කටයුතුවල ප්‍රමුඛ ක්‍රියාකරුවෙකු බවට ත්‍රිකුණාමලය වරාය පරිවර්තනය කිරීම උපාය මාර්ගික උත්සාහයකි. අධිවේගී මාර්ග ජාලය පුළුල් කිරීම හරහා භූමිය මතින් කොළඹ වරායට ඇති අඛණ්ඩ සම්බන්ධතාවය මෙම වරායේ විභව්‍යතාව තවදුරටත් පුළුල් කරනු ලැබේ.

ජාතික වරාය ප්‍රධාන සැලැස්ම මගින් මෙන්ම ත්‍රිකුණාමලය කලාප සැලැස්ම මගින් ද දුම්රිය මාර්ග හා මහා මාර්ග අතර පවතින විභව්‍ය සම්බන්ධතාවය සැලකිල්ලට ගනිමින් කර්මාන්ත සංවර්ධනය සඳහා කේන්ද්‍රස්ථානයක් බවට ත්‍රිකුණාමලය වරාය පරිවර්තනය කිරීම සඳහා ඇති හැකියාව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා රජයේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාමූහික අරමුණ වනුයේ

කර්මාන්ත ආශ්‍රිත ව්‍යාපාර සහ සංචාරක කටයුතු සඳහා ත්‍රිකුණාමලය වරාය ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් බවට පත් කිරීම වේ.

මෙම සංවර්ධන කාර්යයේ තිරසරභාවය තහවුරු කිරීම සඳහා පරිසර හිතකාමී සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳ අවධානය යොමු කරමින් මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගිතාවය ඇතිව ක්‍රමෝපායික පාරිසරික තක්සේරුවක් මේ වන විට පිළියෙල කෙරෙමින් පවතී.

7. දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් මධ්‍යස්ථානය (SACLH)

දකුණු ආසියානු වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානය, එහි ඉදිකිරීම හා මෙහෙයුම් හා සම්බන්ධ ගිවිසුම් කොළඹ දී විධිමත් ලෙස අත්සන් කිරීමෙන් පසු කැපී පෙනෙන යටිතල පහසුකම් ව්‍යාපෘතියක් බවට පත් කිරීමට සැලසුම් කර ඇත. ආයෝජනය කරන ආයතන තුනෙහි එනම් චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග්ස් (CM Ports), ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) සහ ඇක්සස් ඉංජිනියරින් පිල්සී (Access) සමාගමේ නියෝජිතයින් වසර 50 ක් සඳහා ඉදිකර, මෙහෙයුම් කර, පවරා දීමේ ගිවිසුමකට ඇතුළත් වී ඇත.

වර්ග අඩි මිලියන 5 ක් සහ සත මීටර් 530,000 ක සැලසුම් කළ ගබඩා ධාරිතාවයක් ආවරණය වන මහල් අටකින් යුත් දර්ශනීය ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මෙම අභිලාෂිය කාර්යභාරය දකුණු ආසියාවේ විශාලතම වාණිජ හා සේවා සැපයුම් සංකීර්ණය ලෙස පිළිගැනීමට ලක්වනු ඇත.

මෙම සුවිශේෂී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා මග හසර තනමින් 2023 ජූලි මස දී වැඩබිම් කල්බදු ගිවිසුම අත්සන් කිරීමේ ඉතා වැදගත් පියවර සාර්ථකව අවසන් කරන ලදී.

8. වරාය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීම

ගිනි නිවීමේ අංශයේ සිට සමර්හිල් දක්වා මාර්ගය ආවරණය කරමින් ප්‍රධාන අභ්‍යන්තර වරාය මාර්ගය පුළුල් කිරීමේ ඉදිකිරීම් කටයුතු 2023 වසරේ දී සාර්ථකව අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් මසදී ආරම්භ කළ අතර ඉදිකිරීම් වැඩ සඳහා රුපියල් මිලියන 175.6 ක සත්‍ය පිරිවැයක් දරණ ලදී.

ජය බහළු පර්යන්තයේ බහළු අංගනයේ අභ්‍යන්තර මාර්ගවල අදියර II හි මතුපිට තාර දමා පිළිසකර කිරීමේ කටයුතු 2022 දෙසැම්බර් මාසයේ දී ආරම්භ වූ අතර 2023 ඔක්තෝම්බර් මාසයේදී රුපියල් මිලියන 289.3 ක වියදමක් දරා අවසන් කරන ලදී. මීට අමතරව, විජය කුමාර ජැටියේ අදියර II හි අංගනයේ ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු රුපියල් මිලියන 291 ක මූලික පිරිවැයකට 2023 නොවැම්බර් මසදී ආරම්භ කරන ලද අතර ඉදිකිරීම් කටයුතු 2024 ජූනි මාසයේදී අවසන් කිරීමට අපේක්ෂිතය.

9. ජය බහළු පර්යන්ත - IV ජැටි බැම්ම දීර්ඝ කිරීම

ජය බහළු පර්යන්ත - IV හි පවතින ජැටි බැම්ම අවම අද්දර ගැඹුර මීටර් 16 (පහළ මට්ටමේ සාමාන්‍ය උදම් රළ) සහිතව මීටර් 120 කින් දීර්ඝ කිරීම සඳහා 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කරන ලදී. මීටර් 330 කට වඩා වැඩි දිගින් යුත් නෞකා දෙකකට එකවර නැංගුරම් පහසුකම් සැලසීමට හැකි වීම පිණිස වරාය ධාරිතාවය පුළුල් කිරීම මෙහි අරමුණ විය. කෙසේ වුවද, සංවර්ධන කොන්ත්‍රාත්තුවේ සිවිල් වැඩ සංචරවකය 2018 දී බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනයෙන් තොර වූ කරුණු හේතුකොට ගෙන එය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදනයන්ට මුහුණ පෑමට සිදු විය.

ඉන්අනතුරුව, කොන්ත්‍රාත්කරු සමඟ නැවත සාකච්ඡා කර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, 2020 නොවැම්බර් මාසයේදී ඉදිකිරීම් ආරම්භ කර, පවතින ප්‍රගතියත් සමඟ 2023 වසර තුළ ක්‍රියාත්මක කෙරින. දුෂ්කරතා මධ්‍යයේ වුවද, ව්‍යාපෘතිය 83% ක භෞතික ප්‍රගතියක් අත් කර ගන්නා ලදී. මෙම වැදගත් කාර්යභාරය සඳහා වැය වන කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 6,374 කි.

10. ත්‍රිකුණාමලය වරායේ සංවර්ධන කටයුතු

ත්‍රිකුණාමලය වරායේ මහල් තුනකින් යුත් ඉංජිනේරු වැඩබිම් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රුපියල් මිලියන 327 ක මූලික පිරිවැයකට 2023 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද අතර 2024 ජූනි මාසයේදී අවසන් කිරීමට නියමිතය. තවද, අභ්‍යන්තර හා නෞකාවල ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් ත්‍රිකුණාමලය වරායේ දැනට පවත්නා ජල ටැංකිය සඳහා පොම්පය ස්ථාපිත කිරීමේ හා නල පද්ධතිය එළීමේ කටයුතු 2023 නොවැම්බර් මසදී ආරඹ කරන ලද අතර 2024 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

11. කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීම

ඉන්දියාවේ එක්සිම් බැංකුව විසින් ඇ.එ.ජ.ඩොලර් මිලියන 45 ක් යොදවමින් කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ අරමුණ කන්කසන්තුරය වරාය වාණිජ වරායක් බවට පරිවර්තනය කිරීම වන අතර, මෙම ව්‍යාපෘතිය, දියකඩනය හා පලම් අළුත්වැඩියා කිරීම, අළුතින් වාණිජ නැංගුරම්පොළක් ඉදිකිරීම සහ අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යන කාර්යයන්ගෙන් සමන්විත වේ.

ව්‍යාපෘතියේ සැලසුම් නිර්මාණ හා උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ව්‍යාපෘති කළමනාකරණ උපදේශක සේවා ගිවිසුමකට එළඹෙන ලද අතර ගිවිසුමෙහි කාර්යයන් 2020.10.12 දින ආරම්භ කරන ලදී. මූලික උපදේශක අදියරෙහි කාර්යයන් මේ වන විට 72% කින් සම්පූර්ණ වී ඇත. දැනට උපදේශක සමාගම වෙත රුපියල් මිලියන 196 ක් මේ වන විට ගෙවා ඇත. ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියර 2024 වසරේ ආරම්භ කිරීමට නියමිතය. කෙසේ නමුත්, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම, පූර්ව සුදුසුකම් ලේඛනය හ ණය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ඉන්දියාවේ එක්සිම් බැංකුවෙන් ලබා ගත යුතු වේ.

12. කන්කසන්තුරය සහ ඉන්දියාව අතර අත්හදා බැලීමේ පදනමින් මගී යාත්‍රා සේවයක් ආරම්භ කිරීම

යාත්‍රා සේවය සඳහා මගී පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මුළුමනින්ම අවසන් කරන ලද අතර එය ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2023.06.16 දින විවෘත කරන ලදී.

අළුතින් ඉදි කරන ලද ගොඩනැගිල්ල බිම් සේවා බාහිරින් ලබා ගනිමින් කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණය කර ඇත. මෙම මෙහෙයුම් ක්‍රියාවලියෙහි ප්‍රතිඵලදායකත්වය මත මෙම ක්‍රියාපිළිවෙත ඉදිරියට කර ගෙන යනවාද නැද්ද යන බව තීරණය වනු ඇත. මෙය සාර්ථක වන්නේ නම් සහ අපේක්ෂිත ප්‍රතිචාර ලැබෙන්නේනම්, අනාගතයේදී මගී යාත්‍රා සහ සංචාරක නැව් වඩා විශාල පරිමාණයෙන් මෙහෙයුම් කිරීම අරමුණු කරමින් කන්කසන්තුරය වරායේ මගී පර්යන්තය මෙහෙයුම් කිරීම සඳහා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවනු ඇත. දැනට, මෑතදී සම්පූර්ණ කරන ලද පර්යන්ත ගොඩනැගිල්ල භාවිතා කරමින් මගී යාත්‍රා මෙහෙයුම් සතුටුදායක ලෙස ක්‍රියාත්මකව පවතී.

13. වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් සේවා ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විවිධ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. පහත දැක්වෙන කාර්යයන් එම ව්‍යාපෘතිවලට ඇතුළත් වේ.

13.1 පහසුකම් සැලැසීම හා සම්බන්ධීකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ගයේ කොන්ත්‍රාත්කරු සමඟ පහසුකම් සැපයීමේ හා සම්බන්ධීකරණය පැවැත්වීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටී.

13.2 වැඩහල් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් හේතුකොටගෙන, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩහල් ගොඩනැගිලි ප්‍රතිස්ථානගත කළ යුතුව ඇත. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍ය පහසුකම් සලසනු ලබන ගොඩනැගිලි හතරකින් සමන්විත වැඩහල් සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2,089 ක ඇස්තමේන්තුවක් (මිල උච්චාවචනය සැලකිල්ලට ගෙන) සකස් කර ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව 2021.09.09 දින BEL-DGES JV සමාගම වෙත ප්‍රදානය කරන ලදී. ඉදිකිරීම් 2023 දෙසැම්බර් මාසයේ නිමවූ අතර, අළුත් වැඩහල් ගොඩනැගිල්ල 2024 ආරම්භයේදී විවෘත කිරීමට නියමිතය.

13.3 සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල)

වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ගය හේතුකොටගෙන ප්‍රතිස්ථානගත කරන කාර්යාල ගොඩනැගිලිවල කාර්යමණ්ඩලය සඳහා කැනල් යාඩ් අංගන පරිශ්‍රයේ මහල් 17 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කෙරෙමින් පවතී. රුපියල් මිලියන 6,200 ක පිරිවැයකින් ඉදිවන මෙම ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. අදාළ මූල්‍ය යෙදවුම ආසියානු සංවර්ධන බැංකුව මගිනි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘති සම්බන්ධීකරණය කාර්යයෙහි සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි අවශ්‍යතා පදනම්ව එහි ව්‍යාපෘතිය නිම කිරීමේ කටයුතු වල ක්‍රියාකාරීව නිරතව සිටී. 2023 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියෙන් 38.1% ක ප්‍රගතියක් අත්කර ඇත. ව්‍යාපෘතියේ අපේක්ෂිත අවසන් කිරීමේ දිනය 2024 දෙසැම්බර් මාසය වේ.

13.4 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම

ගෘහ භාණ්ඩ අවශ්‍යතා කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකු හා අභ්‍යන්තර නිර්මාණ ශිල්පියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම හා කාර්යාල පරිශ්‍රවල දැනට පවතින භාණ්ඩ ගෘහ නිර්මාණ ශිල්පියාගේ හා අභ්‍යන්තර නිර්මාණකරුගේ උපදෙස් සහිතව නවීකරණය කිරීම මෙම සැලසුමට අයත් වේ.

14. ඔලුවිල් වරාය සඳහා ආයෝජන අවස්ථාවන්


ඔලුවිල් වරායේ ආයෝජනය කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම් සහ යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීමෙහි ක්‍රියාවලිය සඳහා 2022.11.22 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. වරාය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය සහිතව, ඔලුවිල් වරායේ

වාණිජ වරාය ඇතුළත දිගු කාලීන කල්බදු සඳහා ඉඩම් හා ගොඩනැගිලි සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම සඳහා තක්සේරු කිරීමට විශේෂ ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් පත් කර ඇත.

අභිලාෂය ප්‍රකාශ කිරීමේ අදියරට අනුව, යෝජනා සඳහා ඉල්ලීම් අදියරේදී ඉදිරියට ගෙනයාහැකි බවට විශේෂ ව්‍යාපෘති ඇගයීම් කමිටුව තීරණය කළ, යෝජකයින් තුන්දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද මූලික යෝජනා තුනක් තිබිණ. අභිලාෂය ප්‍රකාශ කිරීමේ අදියර තුළදී සාර්ථකව යෝජනා ඉදිරිපත් කළ ආයෝජකයින් තුන්දෙනා වෙත 2023 දෙසැම්බර් මාසයේදී යෝජනා සඳහා ඉල්ලීම් නිල වශයෙන් ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනා 2024 ජනවාරි මාසයේදී ඇගයීමට ලක් කිරීමට නියමිතව ඇති අතර එහිදී ඔලුවිල් වරායේ වාණිජ වරාය පරිශ්‍රය තුළ වරාය ආශ්‍රිත කර්මාන්ත සඳහා ඉඩම් කල්බදු දීමට සුදුසු ආයෝජකයින් තෝරා ගැනීමට හැකිවනු ඇත.

මෙම පරිවර්තනීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළ, සිය ක්‍රමෝපායික පිහිටීම තුළින් ගෝලීය සමුද්‍රීය හා සේවා සැපයුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් බවට පත් වීමට ශ්‍රී ලංකාව දරණ කැපවීම යළි තහවුරු වන සුවිශේෂී ප්‍රගතියක් සහිත කාල පරිච්ඡේදයක් 2023 වර්ෂය මගින් පිළිබිඹු වේ.

2023
මෙහෙයුම් සමාලෝචනය



ශ්‍රී ලංකා වරාය අධිකාරිය

මෙහෙයුම් කොට්ඨාශය

දේශීය මෙන් ම ජාත්‍යන්තර වශයෙන් පැන නැගුණු බරපතල ආර්ථික අර්බුධ තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කොට්ඨාශය සුවිශේෂ කැපවීමක් පෙන්නුම් කිරීමට සමත් විය. උද්ධමනය විසින් තීව්‍ර කරනු ලැබ ලොව පුරා පවතින ආර්ථික පසුබෑම් මධ්‍යයේ බහළු මෙහෙයුම් උපරිමයෙන් පවත්වා ගනිමින් නෞකා මෙහෙයුම් ඉලක්ක සපුරා ගැනීම සඳහා දැඩි පරිශ්‍රයකින් යුතුව කොට්ඨාශයේ කාර්ය මණ්ඩලය ස්වකීය කාර්යයන් කණ්ඩායමක් වශයෙන් ඉටු කර ඇත.

ගෝලීය වෙළෙඳ ක්ෂේත්‍රය පුරා පැතිරුණු උද්ධමනයේ බලපෑම දැඩිලෙස දැනුන අතර එය ලොව පුරා නැව් ගමනාගමනය අඩු වීමට හේතුවක් විය. 2023 වර්ෂයේ ඍණ ආර්ථික වර්ධනය දෙගුණ වීමත් සමඟ නැව් සමාගම් විසින් ප්‍රවාහනය කරන ලද බහළු ප්‍රමාණය අඩු වීම මෙහි ප්‍රතිඵලය විය. ජය බහළු පර්යන්තය ද ඇතුළුව වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවයේද කැපීපෙනෙන අඩු වීමක් සිදු විය.

ගෝලීය අර්බුධ තුළින් පැන නැගුණු අභියෝග ජය බහළු පර්යන්තයේ මෙහෙයුම් කෙරෙහි දැඩි ලෙස බලපෑමක් 2023 වර්ෂය ආරම්භයේ සිටම එල්ල විය. මෙම අපහසුතාවයන් මධ්‍යයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත ක්‍රමානුකූලව සතුටුදායක තත්ත්වයට පත් විය. 2022 වර්ෂයේ මෙහෙයවන ලද බහළු ප්‍රමාණය ඉක්මවමින් බහළු විස්සේ සම ඒකක 39,236 ක් මෙහෙයුම් කිරීමට හැකි විය.

2023 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත 2022 වර්ෂයේ නිරීක්ෂණය වූ දොඹකර ඵලදායීතාවයට සාපේක්ෂව 4.14% ක සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින් ප්‍රධාන නැව් සමාගම්හි නෞකා සඳහා පැයකට දොඹකර යෙදවුම් වාර (MPH) 26.01 ක සාමාන්‍ය දළ දොඹකර ඵලදායීතාවයක් අත්කර ගන්නා ලදී. එහෙත්, 2022 වර්ෂයේ දොඹකර ඵලදායීතා මට්ටම් හා සැසඳීමේදී 0.03% ක අඩු වීමක් පෙන්නුම් කරමින්, 2023 වර්ෂයේ පෝෂක නෞකා සඳහා සාමාන්‍ය දළ දොඹකර ඵලදායීතාවය වාර්තා වූයේ පැයකට දොඹකර යෙදවුම් වාර 24.84 ක් ලෙසය.

රටෙහි ඇති වූ අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය නෞකා මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් යෙදවීමට වගබලා ගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී ප්‍රධාන නැව් සමාගම්වල නෞකා මෙහෙයුම් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තවල සාමාන්‍ය ඵලදායීතා මට්ටමේ වර්ධනයක් ඇති විය. තවද, පෝෂක නැව් සමාගම් සම්බන්ධයෙන් වූ ඵලදායීතා මට්ටම 2022 වර්ෂයේ තීව්‍ර මට්ටමින්ම පවත්වාගෙන යාමට හැකිය.

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී මෙහෙයවන ලද අන්තර් පර්යන්ත ට්‍රැකින් (ITT) සේවා සැලකිය යුතු මට්ටමින් අඩු විය. මෙම අඩු වීමේ බලපෑම අවම කිරීමේ අරමුණ ඇතිව, මූලික වශයෙන් ප්‍රධාන නැව් සමාගම්වල නෞකා සඳහා සේවය සැපයීම, ප්‍රතිසැකසුම් කරන ලදී. තවද, 2023 වර්ෂය පුරාම පැතිරී පැවති ගෝලීය අර්බුධකාරී තත්ත්වය වරායයන් වෙත අයහපත් ලෙස බලපෑමක් ඇති කරමින් අන්තර් පර්යන්ත ට්‍රැකින් සේවා මෙහෙයුම් වල අඩුවීමක ප්‍රතිඵලයක් අතිකරමින් සමස්ත නැව් භාණ්ඩ මෙහෙයුම්වල පසුබෑමක් ඇති කිරීමක් ප්‍රතිඵලයක් අත්කරමින් සමස්ත නැව් භාණ්ඩ මෙහෙයුම්වල පසුබෑමක් ඇති වීමට හේතු විය.

2022 වර්ෂයට සාපේක්ෂව, 2023 වර්ෂයේදී සාම්ප්‍රදායික නැව් භාණ්ඩ පර්යන්තවල වියළි තොග නැව් භාණ්ඩ මෙහෙයුම්වල 28.4% ක කැපී පෙනෙන අඩු වීමක් සිදු විය. 2022 වර්ෂයේදී වියළි තොග නැව් භාණ්ඩ ටොන් 1,652,453 ක් මෙහෙයුම් කළද, 2023 වර්ෂය තුළදී එම ප්‍රමාණය ටොන් 1,183,490 ක් දක්වා විශාල අඩු වීමක් ඇති විය. එහෙත්, 2022 වර්ෂයට සාපේක්ෂව ද්‍රව තොග නැව් භාණ්ඩ මෙහෙයුම්වල 12.7% ක වර්ධනයක් ඇති වූ අතර එය 2022 වර්ෂයේ මෙහෙයුම් කරන ලද ටොන් 4,333,670 සිට 2023 වර්ෂයේදී ටොන් 4,884,677 ක් දක්වා වැඩි වීමකි. තොග කඩන

නැව් භාණ්ඩ සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී ටොන් 202,355 ක් මෙහෙයුම් කරන ලද අතර, එම ප්‍රමාණය 2022 වර්ෂයේදී ටොන් 263,602 ක් විය. මෙය 23.1% ක අඩු වීමකි.

කොළඹ වරායේ 2023 වර්ෂයේදී මෙහෙයුම් කරන ලද මුළු නැව් භාණ්ඩ ප්‍රමාණය ටොන් 99,673,588 ක් වූ අතර මෙය 2022 වර්ෂයේ මෙහෙයුම් කරන ලද ටොන් 96,169,811 ට සාපේක්ෂව 3.6% ක වැඩි වීමකි.

2023 වර්ෂයේදී ඇති වූ දේශීය හා ජාත්‍යන්තර අභියෝගාත්මක තත්ත්වයන් හමුවේ වුවද, මෙහෙයුම් ධාරිතාවය හා අපේක්ෂිත ඵලදායීතා මට්ටම ඉදිරියට පවත්වාගෙන යාම සඳහා විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. ඒවායින් කිහිපයක් පහත සඳහන් වේ.

- කොට්ඨාශයට තරහකාරීත්වයක් ලබා දෙමින්, ගනුදෙනුකාර පාර්ශ්වයන් වෙත ලබා දෙන සේවා ඉහළ මට්ටමක් පවත්වාගනිමින් කටයුතු කිරීම සඳහා කාර්ය මණ්ඩලයට වගකීම් පැවරීමේ සේවක බලාරෝපණ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- ප්‍රයිම් මූවර් රථ ගමනාගමනය වැඩි දියුණු කිරීම සඳහා ජය බහළු පර්යන්තයේ අංගන ප්‍රදේශයේ මතුපිට පිළිසකර කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

- සේවකයින් තුළ ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුව හා සමස්ත ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා සිය කාර්යභාරය ඉටු කිරීමට දායකත්වය ලබා දෙනු පිණිස සේවක දැනුවත් කිරීමේ වැඩ සටහන් හඳුන්වා දෙන ලදී.

- යාත්‍රාවලට සහ අංගන මෙහෙයුම් සේවක කණ්ඩායම්වලට ප්‍රමුඛතාවය ලබා දෙමින් අන්තර් පර්යන්ත මෙහෙයුම් අංශයටද දීමනා ක්‍රමය ගැලපුම් කරන ලදී. ප්‍රධාන සේවා ස්ථානවල සේවකයින් තවදුරටත් අභිප්‍රේරණය කිරීම මෙම වැඩ පිළිවෙලේ අරමුණ විය.

- නැගෙනහිර බහළු පර්යන්තය හා ජය බහළු පර්යන්ත V ව්‍යාපෘතියේ පූර්ව සැලසුම් අදියර තුළදී සලසන ලද අතුරු ක්‍රියාකාරීත්ව විධිවිධාන හේතුකොටගෙන එම ව්‍යාපෘති හා සම්බන්ධ කටයුතු අපේක්ෂිත කාලවකවානු තුළ නිමකිරීමට හැකිවීම.

සේවා සැපයුම් කොට්ඨාශය

පූර්ණ බහළුම්, අර්ධ පූර්ණ බහළුම්, තොග කඩන නැව්බඩු, ඇසුරුම් නැව්බඩු, මෝටර් රථ හා ව්‍යාපෘති නැව්බඩු ඇතුළුව විවිධ වර්ගයේ නැව්බඩු කාර්යක්ෂමව හාර දීම, ගබඩා කිරීම හා මෙහෙයුම් කිරීම සම්බන්ධයෙන් සේවා සැපයුම් කොට්ඨාශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

2023 වසර තුළ, පාරිභෝගික සේවා කාර්යක්ෂම කරමින් දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක වන පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් රුපියල් මිලියන 6,561.09 ක ආදායමක් උත්පාදනය කරමින් පූර්ණ බහළුම් විස්සේ සම ඒකක 96,501 ක් ඍජුව හාර දෙන ලදී. පූර්ණ / අර්ධ පූර්ණ බහළුම් වලට අදාළ ලේඛන විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කර ගෙවීම් පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් පාරිභෝගික සේවා වඩාත් කාර්යක්ෂමව සිදු කරන ලදී.

ප්‍රතිඅපනයන බහළුම්, විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් හා විශේෂ නැව්බඩු ඇතුළුව වරාය තුළ පවතින ගුදම් පහසුකම් විවිධ මෙහෙයුම් සඳහා භාවිතා කරමින් 2023 වසරේදී අර්ධ පූර්ණ බහළුම් හා විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් විස්සේ සම ඒකක 19,117 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළු මෙහෙයුම් මධ්‍යස්ථානවලදී මෙහෙයුම් කරන ලද අතර විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළුම් විස්සේ සම ඒකක 8,591 ක් මෙහෙයවන ලදී. අර්ධ පූර්ණ බහළුම් මෙහෙයුම් කිරීම තුළින් උපයා ගත් ආදායම රුපියල් මිලියන 455.04 ක් වූ අතර අර්ධ පූර්ණ බහළුම් හා තොග කඩන නැව්බඩු ගොඩබෑම් සහ හාර දීමේ ගාස්තු ලෙස රුපියල් මිලියන 1,184.68 ක් උපයන ලදී. විවිධ රටවලට අයත් ප්‍රතිඅපනයන බහළු මෙහෙයුම් මගින් උපයන ලද ආදායම රුපියල් මිලියන

279.78 ක් වූ අතර සේවා සැපයුම් කොට්ඨාශය විසින් සිදු කරන ලද විශේෂ හා සාමාන්‍ය මෙහෙයුම් වලින් රුපියල් මිලියන 29.52 ක් උපයන ලදී. මෙයට අමතරව, හිස් බහළු සඳහා ප්‍රමාද ගාස්තු, ප්‍රතිඅපනයන බහළුම් සහ බහළුම් වල තත්ත්වය වෙනස් කිරීම සඳහා අය කරන ගාස්තු මගින් රුපියල් මිලියන 59.76 ක ආදායමක් උපයන ලදී.

බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන (CFS) V ගුදම නවීකරණය කිරීම මගින් බැඳුම්කර නැව්බඩු ගුදම් පහසුකම් පුළුල් කිරීමත් සමඟ බැඳුම්කර මෙහෙයුම් ඉහළ යෑමක් සිදු වූ අතර එමඟින් රුපියල් මිලියන 133.58 ක ආදායමක් උපයන ලදී. තවද, 2023 වර්ෂයේදී අත්හල නැව්බඩු, ඉවත ලන භාණ්ඩ, අබලි යකඩ, පාවිච්චි කළ තෙල්, පාවිච්චි කළ ටයර්, ටියුබ් සහ ඔලුවිල් වරායේ වැලි විකිණීම මගින් සේවා සැපයුම් කොට්ඨාශය රුපියල් මිලියන 151.30 ක ආදායමක් උපයන ලදී.

නිෂ්කාශන නියෝජිතායතන සඳහා නව බලපත්‍ර 74 ක් නිකුත් කිරීම හා බලපත්‍ර 719 ක් අළුත් කිරීම මගින් රුපියල් මිලියන 35.37 ක ආදායමක් උපයන ලදී. වාප්පු ලිපිකරුවන් සඳහා “A” , “B” කාණ්ඩයේ හා පොහොර නිෂ්කාශනය සඳහා බලපත්‍ර හා මුරපද නිකුත් කිරීම හා අළුත් කිරීම මගින් රුපියල් මිලියන 8.30 ක අමතර ආදායමක් උපයන ලදී. වර්ෂය තුළ නිකුත් කරන ලද හෝ අළුත් කරන ලද මුළු “A” බලපත්‍ර 991 ක් ලෙස වාර්තා වූ අතර “B” බලපත්‍ර 88 ක් හා පොහොර නිෂ්කාශන බලපත්‍ර 17 ක් විය.

තවද, 2023 වර්ෂයේදී, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය හරහා ලැබුණු ගාස්තු අය කර ගැනීම් අත්හැරීමේ ඉල්ලුම් පත් 43 ක් සේවා සැපයුම් කොට්ඨාශය විසින් සැකසුම් කරන ලදී. මෙම ඉල්ලුම්පත් වලින් 20 ක් නිර්දේශ කරන ලද අතර 8 ක් ප්‍රතික්ෂේප කරන ලදී.

2023 වර්ෂය තුළ සිදු කරන ලද වැඩි දියුණු කිරීම්

- නැව්බඩු ගබඩා කරන නෙස්ටෙනර් ගුදම් භාවිතා කිරීම ඉහළ දැමීම තුළින් ගුදම් තුළ ගබඩා කළ හැකි ධාරිතාවය වැඩි කිරීම.

- වරාය සම්බන්ධ පැමිණිලි, විද්‍යුත් තැපෑල, වෙබ් අඩවි සහ දුරකථන ඇමතුම් මගින් විසඳීම විධිමත් කිරීම සඳහා සේවා සැපයුම් කොට්ඨාශයේ විමසීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.

- බැඳුම්කර ගුදමේ උෂ්ණත්ව පාලන ප්‍රදේශය වැඩි දියුණු කිරීම, රාක්ක ක්‍රමය හඳුන්වාදීම සහ බැඳුම්කර නැව්බඩු වල වට්ටෝරු භාණ්ඩ ලේඛනය නිවැරදිව කළමනාකරණය කිරීම සඳහා බින් කාඩ් පද්ධතියක් (bin card system) ක්‍රියාත්මක කිරීම.

- ගුදම් මෙහෙයුම් වල ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා බණ්ඩාරනායක ජැටි ගුදමේ බහළු හිස් කිරීම/ බහළු ගත කිරීම් ට්‍රෙලර්ගත මෙහෙයුම් (Trailer Based) මගින් සිදු කිරීම සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම.

- අර්ධ පූර්ණ බහළුම් මෙහෙයුම් කිරීම් ප්‍රධාන පෙළේ නැව් සමාගම් මගින් පැය 24 ක් තුළ සිදු කිරීමේ නව සීග්‍ර සේවයක් බහළු මෙහෙයුම් මධ්‍යස්ථාන 1 හි ක්‍රියාත්මක කරන ලදී. මෙහෙයුම් කරන නැව් භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැංවීමේ අරමුණ ඇතිව වරාය පරිශ්‍රය තුළ මෙහෙයුම් කටයුතු සිදු කිරීම මගින් නැව් නියෝජිතයින් වැඩි සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීම පිණිස මෙම ක්‍රමෝපායික සැලැස්ම දියත් කර ඇත. මෙම ක්‍රමෝපායේ කොටසක් ලෙස නව නියෝජිතයින් දෙදෙනෙකු ආකර්ෂණය කර ගැනීමට හැකි විය.

නාවික කොට්ඨාශය

නියමු සේවා

2023 සමාලෝචිත වර්ෂය තුළ කොළඹ වරාය විසින් සියළුම වර්ගයේ නෞකා සඳහා සතියේ සෑම දිනකම දවසේ පැය 24 පුරා නියමු සේවා සපයන ලදී.

ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය විසින් නෞකා සඳහා කාර්යක්ෂම සහ අඛණ්ඩ ටග් යාත්‍රා සේවාවන් ලබා දෙමින් සතුටුදායක කාර්යභාරයක් ඉටු කරන ලදී. දෛනිකව ටග් යාත්‍රා මෙහෙයුම් සිදු කරන ලද අතර අනපේක්ෂිත හදිසි ආපදාවන්ට මුහුණ දීම සඳහා එක් පොරොත්තු ටග් යාත්‍රාවක් සෑම විටම සූදානම්ව තබන ලදී.

වර්ෂය තුළ නැංගුරම් ටග් යාත්‍රා සමස්ත ගමන්වාර 19,314 ක් සිදු කරන ලද අතර මෙයට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ටග් ශ්‍රාතා ගමන් වාර 9,520 ක් හා කුලී ටග් යාත්‍රා ගමන් වාර 9,794 ක් අයත් වේ. ටග් යාත්‍රා සේවා සැපයීමෙන් උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 2,868 ක් විය.

ප්‍රධාන ඉංජිනේරු නිලධාරී අංශය

2023 වර්ෂයේදී, ටග් යාත්‍රා, නියමු යාත්‍රා මුවරිං දියත් යාත්‍රා යන සියළුම යාත්‍රාවල මෙහෙයුම් හා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුකූල වනසේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යන ලදී. නෞකා ඇදගෙන යාම සඳහා සහ නියමු සේවා සඳහා යොදා ගන්නා යාත්‍රාවල සාමාන්‍ය නඩත්තු සහ දෛනික මෙහෙයුම් කටයුතු මෙම අංශයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. කළමනාකාරීක්වයේ නිර්දේශයන්ට ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන ඉංජිනේරු නිලධාරි අංශය ටග් යාත්‍රා වල සාමාන්‍ය නඩත්තු සිදු කිරීමේ හැකියාව වැඩිදියුණු කර වැඩහලක් ස්ථාපිත කිරීමට කැපවී කටයුතු කරමින් සිටී.

වරාය ගිනි නිවන හමුදාව (PFB)

දේශීය ගිනි නිවාරණ ප්‍රමිතීන්ට අනුගත වෙමින්, ගිනි ගැනීම්වල හා වෙනත් හදිසි අනතුරුවල බලපෑම අවම කරමින් වරාය ගිනි නිවීමේ අංශය විසින් 2023 වර්ෂය තුළදී කාර්යක්ෂම හදිසි සේවා සපයන ලදී.

2023 මුදල් වර්ෂය තුළ රුපියල් මිලියන 71.9 ක ආදායමක් උත්පාදනය කරමින් වරාය ගිනි නිවීමේ අංශය විසින් ගිනි හටගැනීමේ සිද්ධි 2,205 ක් සඳහා ප්‍රතිචාර දක්වන ලදී.

වරාය නිරාපද අංශය

ආරක්ෂිත මෙහෙයුම් විධික්‍රම වලට දැඩි ලෙස අනුගත වීම තහවුරු කරමින් වරාය තුළ සියළු අන්තරාදායක නැව්බඩු මෙහෙයුම් ඉතා සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කිරීම මෙම අංශයේ වගකීම වේ. අධිතාප වැඩ සඳහා අවසර ලබා දීමට ප්‍රථම වැඩිබම් පරීක්ෂා කිරීම් සිදු කරන අතර අනවසර අධිතාප වැඩ පිළිබඳ සිද්ධීන් නිසි ලෙස අනාවරණය කර ඒවා නැවැත්වීමට කටයුතු කරනු ලබයි. තවද, සමුද්‍රීය දූෂණයට අදාළව දැඩි පරීක්ෂාවන් ද සිදු කෙරේ. සේවකයින් හා නාවික යාත්‍රා දෙඅංශයටම සිදුවන අනතුරු පිළිබඳ ක්‍රියාකාරීව පරීක්ෂා කොට විශ්ලේෂණය කිරීම ද අප කණ්ඩායම විසින් කාර්යක්ෂමව ඉටු කරනු ලැබේ.

වැදගත් අවස්ථා:

- කොළඹ වරායට පැමිණි නෞකා වලින් දේශීය අන්තරාදායක නැව්බඩු මෙට්‍රික් ටොන් 223,034,857 ක් හා ප්‍රතිනැව්ගත නැව්බඩු මෙට්‍රික් ටොන් 881,142,420 ක් ගොඩබාන ලදී.

- ප්‍රතිනැව්ගත කිරීම් වලට අන්තරාදායක නැව්බඩු ලෙස නම් කර ඇති බහළු 41,686 ක් මෙහෙයවීම ඇතුළත් විය.

- විවිධ වර්ගයේ නැව්බඩු සඳහා විශේෂීකරණය වූ ත්‍රිකුණාමලය හා කොළඹ වරායයන් වලට පැමිණි මුළු තෙල් නෞකා ප්‍රමාණය 302 කි. එයින් ගොඩබාන ලද නැව්බඩු වලට පහත ද්‍රව්‍ය ඇතුළත් විය.

  - ද්‍රව පෙට්‍රෝලියම් වායු මෙ.ටො. 373,501,624
  - ගෑස් තෙල්/ජෙට් Ai /ගැසොලින්/ භූමිතෙල් මෙ.ටො. 2,526,603.098
  - බොර තෙල් මෙ.ටො. 1,579,874.010
  - ඉන්ධන තෙල් මෙ.ටො. 876,879.935
  - මූලික තෙල් (Base oil) මෙ.ටො. 37,532.633

- අධි පුපුරණ ද්‍රව්‍ය (GPIE) මෙ.ටො. 5,928 ක් සහ පුපුරණ ස්වභාවයේ ද්‍රව්‍ය (GP IAE/IIE) මෙ.ටො. 45,967.043 ක් මෙහෙයුම් කරන ලදී.

- වරාය ගිනි නිවන හමුදාවේ සහය ඇතිව රසායනික ද්‍රව්‍ය කාන්දුවීමේ සිද්ධීන්, රීවර්ක් මෙහෙයුම් (re-work operations) සහ ගිනි නිවීමේ කටයුතු මෙම කණ්ඩායම විසින් සාර්ථකව කළමනාකරණය කරන ලදී.

- සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහය ඇතිව අන්තරාදායක නැව් බඩු ගබඩාකරණ ගුදම් ඇතුළු ගුදම් පරීක්ෂා කිරීම කාලානුරූපීව සිදුකරන ලදී.

- අධිතාප වැඩ සඳහා අවසර ලබා දීමට අවශ්‍ය පරීක්ෂා කිරීම් සහ සමුද්‍ර දූෂණ වැළැක්වීමට මග පෙන්වීම හා අදාළ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණය කරන ලදී.

- කාර්මික සහ සමුද්‍රීය හදිසි අනතුරු පිළිබඳව පරීක්ෂණ ද වරාය විසින් පවත්වනු ලැබේ.

- සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහාය ඇතිව විශේෂයෙන්ම පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතා කරන්නේ දැයි අවධානය යොමු කරමින් නාවික කොට්ඨාශයට අනුයුක්ත නැව් බඳින සේවක කණ්ඩායම්වල ආරක්ෂාව අධීක්ෂණය කරන ලදී.

- සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහාය ඇතිව ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සහ පෙට්‍රෝලියම් තෙල් ගොඩබෑමේ කටයුතු නිරතුරුව පරීක්ෂා කරන ලදී.

- කසල, අපිරිසිදු තෙල් (Sludge Oil), මලාපවහන ද්‍රව්‍ය ඇතුළුව නෞකාවල ඉවතලන කසල අනුමත කොන්ත්‍රාත්කරුවන් විසින් ඉවත් කිරීමේ කටයුතු සමුද්‍රීය පරිසර දූෂණ අධිකාරිය (MEPA) සමඟ ඒකාබද්ධව නිරතුරුව අධීක්ෂණය කරන ලදී.

- ජය බහළු පර්යන්තය, සමඟි බහළු පර්යන්තය හා නැගෙනහිර බහළු පර්යන්තය යන අංගණවල අන්තරාදායක නැව්බඩු අඩුක් කිරීම සහකාර වරාය නිරාපද පරීක්ෂකවරුන්ගේ සහාය ඇතිව අඛණ්ඩ පරීක්ෂාවට ලක් කරන ලදී. අන්තරාදායක නැව්බඩු ප්‍රකාශ නොකිරීම සම්බන්ධයෙන් නැව් නියෝජිතවරුනට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදී.

වෙරළ ප්‍රදීපාගාර අංශය

ජාත්‍යන්තර නැව් මාර්ග සඳහා අතිශය වැදගත් වන දකුණු හා බටහිර වෙරළ තීරය ඔස්සේ ස්ථාපිත කර ඇති ප්‍රදීපාගාර නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

ප්‍රවේශ ඇළ මාර්ගවල බෝයා

නාවිකයන්ට කලින්කලට අවවාද කරමින් අදාළ බලධාරීන් වෙත චක්‍රලේඛ නිකුත් කරමින් සැහැල්ලු බෝයා නඩත්තු කිරීම පිළිබඳ අඛණ්ඩ පරීක්ෂණ සිදු කරන ලදී. 2023 වසරේදී ප්‍රදීපාගාර ගාස්තුව වශයෙන් රුපියල් මිලියන 1,488.83 ක ආදායමක් වරාය උපයා ගන්නා ලදී.

වරාය යාත්‍රා අංශය

කොළඹ වරායේ යාත්‍රා ආරක්ෂිතව බැඳ තැබීම සහ මුදා හැරීම සඳහා නියමු යාත්‍රාවලට මූවරිං කණ්ඩායම් හා කාර්යමණ්ඩල සැපයීමට සහායවීමට වරාය යාත්‍රා අංශය මූලිකව පහසුකම් සලසන ලදී. නියමු යාත්‍රාවල හා මූවරිං යාත්‍රාවල නඩත්තු කටයුතු නිතිපතා සිදු කිරීම මගින් සතුටුදායක ප්‍රතිඵල අත්කර ගන්නා ලදී.

ජල ශාස්ත්‍රීය සමීක්ෂණ අංශය

සියළුම වරායයන් වල විවිධ කාර්යයන් සිදු කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙහෙයුම් කරන වරායන් සඳහා ඉඩම් හා ජල ශාස්ත්‍රීය සමීක්ෂණ සේවාව මෙම අංශය විසින් ලබා දෙන ලදී. මෙම සේවාවන් අතරට වරාය ද්‍රෝණිය සහ නැංගුරම්පොළ ගැඹුර මැනීම, බෝයා ස්ථානගත කිරීම පිළිබඳ සමීක්ෂණ, සිතියම සංශෝධනය කිරීම, ව්‍යාපෘති සඳහා උපදේශක සේවා සහ බදු කුලී ගිවිසුම් සමීක්ෂණ අනෙකුත් සේවා ඇතුළත් වේ.

නාවික අංශය

2023 වර්ෂයේදී නාවික අංශය සමුද්‍රීය ආයතන සඳහා වාර්ෂික ලියාපදිංචි කිරීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදු කරන ලදී. මෙම වසරේදී සමස්ත බලපත්‍ර 411 ක් නිකුත් කොට රුපියල් මිලියන 73.9 ක ආදායමක් උපයන ලදී.

යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාශය

සියළුම වරායයන්හි ව්‍යුහ හා උපකරණ මෙහෙයුම් තත්ත්වයේ පවත්වාගෙන යාම යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන කාර්යය වේ. නාවික යාත්‍රා බහළු දොඹකර සහ අනෙකුත් වරාය ආශ්‍රිත ව්‍යුහවල වානේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම මෙම කොට්ඨාශයේ සේවාවන්වලට ඇතුළත් වේ. 2023 වසරේදී නව ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ලෙහි වානේ ව්‍යුහ පිරිසැකසුම් කිරීම, බහළු දොඹකරවල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සහ ඉන්ධන නල මාර්ගය දිර්ඝ කිරීම වැනි සුවිශේෂී ව්‍යාපෘති අවසන් කරන ලදී. මීට අමතරව, ගුදම් පුළුල් කිරීම, සීමා වැට අළුත්වැඩියා කිරීම, තට්ටු හා දම්වැල් පිරිසැකසුම් කිරීම, උපකරණ ප්‍රතිස්ථානගත කිරීම ආම්පන්න සැකසීම, යන්ත්‍රාගාර වැඩ සහ වරාය ආශ්‍රිත විවිධ කාර්යයන් සඳහා අළුත්වැඩියා කටයුතු මෙම කොට්ඨාශය විසින් සිදු කරනු ලැබ ඇත. තවද, මෙම කොට්ඨාශය වරාය අධිකාරියේ වෙනත් කොට්ඨාශ විසින් ඉල්ලා සිටින නඩත්තු හා අළුත්වැඩියා කටයුතු ද සිදු කරනු ලැබේ.

යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය

බහළු මෙහෙයුම් උපකරණ සහ වෙනත් විවිධ උපකරණවල කාර්යක්ෂමතාවය හා විශ්වාසනීය ක්‍රියාකාරීත්වය සහතික කිරීමේ අතිශය වැදගත් කාර්යභාරය යන්ත්‍රෝපකරණ ඉංජිනේරු

කොට්ඨාශය විසින් ඉටු කරනු ලැබේ. ඉදිකිරීම් උපකරණ, සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් යන්ත්‍ර, ජංගම හා පොදු කාර්ය දොඹකර මෙහෙයුම් උපකරණ, විදුලි ජනක යන්ත්‍ර හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වාහන නඩත්තු කිරීම මෙම කොට්ඨාශය විසින් සිදු කරන පුළුල් සේවාවන් වලට අයත් වේ.

ජය බහළු පර්යන්තය, නැගෙනහිර බහළු පර්යන්තය, සමඟි බහළු පර්යන්තය, බණ්ඩාරනායක පර්යන්ත සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගුදම් වල දෛනික මෙහෙයුම් පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් සේවා සැපයුම් කොට්ඨාශය හා මෙහෙයුම් කොට්ඨාශය සඳහා පුළුල් සේවාවක් ලබා දීමට මෙම කොට්ඨාශය කැප වී සිටී. මීට අමතරව, වෙනත් වරායයන්වලට අයත් උපකරණ හා වාහන සහ ප්‍රදීපාගාර නඩත්තු කිරීම ද මෙම කොට්ඨාශයේ වගකීම වේ. තවද, විශේෂිත සේවා බාහිර වශයෙන් ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්තු කළමනාකරණය සහ වාහන කුලී පදනම මත ලබා ගැනීම, රක්ෂණ කිරීම් සම්බන්ධ කටයුතු සහ පුද්ගලික ප්‍රයිම්මූවර් රථ හා ට්‍රෙලර් සඳහා පරීක්ෂණ / ප්‍රවීණතා සහතික නිකුත් කිරීම ආදී කටයුතුවල මෙම කොට්ඨාශය ක්‍රියාකාරීව නියැලී සිටී.

ප්‍රධාන හා සුළු කාර්යයන් පිළිබඳ විශේෂ සඳහන් කිරීම්

- ජය බහළු පර්යන්තයේ බහළු දොඹකරවල ප්‍රධාන ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු.
- ජය බහළු පර්යන්තයේ ඩීසල් විදුලි ජනක යන්ත්‍රවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු.
- බහළු ප්‍රවාහන ට්‍රෙලර් හා සම්බන්ධ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු.
- ජය බහළු පර්යන්තයේ අදියර IV සඳහා නව Twin Lift Spreader (Make-STINIS) උපකරණය මිලදී ගැනීම, ස්ථාපිත කිරීම හා මෙහෙයුම් සඳහා සූදානම් කිරීම.
- ජය බහළු පර්යන්තයේ අදියර II සඳහා නව Single Lift Spreader (Make-BROMMA) මිලදී ගැනීම, ස්ථාපිත කිරීම හ මෙහෙයුම් සඳහා සූදානම් කිරීම.
- රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකරයේ (TC 31) තිබූ අක්‍රිය එන්ජිම වෙනුවට Cummins Engine (855) මිලදී ගැනීම, ස්ථාපිත කිරීම හා මෙහෙයුම් සඳහා සූදානම් කිරීම.
- රබර් ටයර් යෙදූ TC 23 දොඹකරය සඳහා සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කරන ලද මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කිරීම.
- පැරණි S2 – 2 නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන ස්ප්‍රෙඩරය රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි ස්ප්‍රෙඩරයක් බවට පරිවර්තනය කිරීම.

මෙම ප්‍රධාන ව්‍යාපෘති වලට අමතරව, මෙම කොට්ඨාශය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උපකරණවල හා වාහන වල දෛනික හා හදිසි ආපදා නඩත්තු සේවාවන් කාර්යක්ෂමව ඉටු කර ඇත.

සිවිල් ඉංජිනේරු කොට්ඨාශය

ව්‍යුහ, ගොඩනැගිලි, නිල නිවාස, වරාය ගැඹුර, මාර්ග, බහළු අංගන, ජැටි බැම්, ජල සැපයුම සහ පාර්ශ්වකරුවන් සඳහා සේවා සැපයීම ඇතුළුව වරාය යටිතල පහසුකම්වල විවිධ අංශ නඩත්තු කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳව සිවිල් ඉංජිනේරු කොට්ඨාශය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙයට අමතරව, ප්‍රදීපාගාර නඩත්තු කටයුතු ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ

පවත්වාගෙන යනු ලබන සියළුම වරායයන්ගේ සමුද්‍රීය ව්‍යුහ නඩත්තු කිරීමේ වගකීම ද මෙම කොට්ඨාශය වෙත පැවරී ඇත.

ටෙන්ඩර් ක්‍රියාවලිය ඇතුළු ව්‍යාපෘති කළමනාකරණය, ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, ඉදිකිරීම් අධීක්ෂණය, තත්ත්ව පාලනය සහ කොට්ඨාශයේම සේවයේ නියුතු සේවකයින් යොදවා ප්‍රධාන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති හා සුළු නව ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් කළමනාකරණය මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. අපේක්ෂිත අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රධාන සිවිල් නඩත්තු කටයුතු සැලසුම්කණ අතර, සුළු නඩත්තු කටයුතු කොට්ඨාශයේ සේවයේ නියුතු සේවකයින් යොදවා කඩිනමින් සිදු කරනු ලැබේ. සිවිල් ඉංජිනේරු කොට්ඨාශය විසින් සාර්ථක සහ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර ඇත.

සිවිල් ඉංජිනේරු කොට්ඨාශය විසින් මුදල් වර්ෂය තුළ සිදු කරන ලද වැදගත් ප්‍රතිසංස්කරණ කටයුතු පහත දක්වා ඇත.

- නැගෙනහිර බහළු පර්යන්තයේ විදුලි උපපොල ඉදිකිරීම.
- ජය බහළු පර්යන්තයේ බහළු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම.
- කොළඹ වරායේ සීමා තාප්පය අළුත්වැඩියා කිරීම.
- බණ්ඩාරනායක ගුදමේ පහසුකම් වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.
- යෝජිත ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම.
- කොච්චිකඩේ ජල ටැංකියේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මධ්‍යම මුළුතැන්ගෙය දක්වා අගල් 06 ක ජල නළ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මධ්‍යම මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම.
- අඩු එසවුම් යන්ත්‍ර නඩත්තු ගොඩනැගිල්ල ඉදිකිරීම.
- ත්‍රිකුණාමලයේ සහ ගාල්ලේ නිවාඩු නිකේතන අළුත්වැඩියා කිරීම.

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විදුලි, විද්‍යුත්, සන්නිවේදන හා ස්වයංක්‍රීයකරණ පද්ධති සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශයේ කාර්යභාරය වේ. මෙයට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වරායයන්හි පවත්නා යන්ත්‍රෝපකරණවල හා සවි කිරීම්වල ස්ථාපිත කර ඇති මෙම පද්ධතිවල අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීම ද මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. වරාය කටයුතුවලට අදාළ වන අතිශය වැදගත් වන විදුලි, විද්‍යුත්, සන්නිවේදන හා ස්වයංක්‍රීයකරණ පද්ධති හා අදාළ සියළුම සේවා 95% කට වැඩි ප්‍රතිශතයකින් පවතින බව සහතික කිරීම සඳහා ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් මෙහෙයවනු ලබන උසස් ලෙස සුදුසුකම්ලත් වෘත්තීය විශේෂඥ කණ්ඩායමක් දවසේ පැය 24 පුරා වෙහෙසකාරී සේවයක නියැලී සිටී.

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශය එහි විෂය පථය තුළ පහත සඳහන් කාර්යයන් 2023 වසර තුළ සම්පූර්ණ කර ඇත.

- ජය බහළු පර්යන්ත අදියර 5 සහ සමර් හිල් යන නව විදුලි උප පොළවල කිලෝ වොට් 11 ක විදුලි බල බෙදා හැරීමේ පුවරු සවි කර පරීක්ෂා කර ක්‍රියාත්මක කිරීම.

- කොට්ඨාශයේම විශේෂඥ දැනුම භාවිතයෙන් මිට්සුයි (Mitsui) වර්ගයේ රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකරවල පැරණි DOS පාදක PLC පාලන පද්ධතිය වින්ඩෝස් පදනම් කරගත් පාලන පද්ධති බවට පත් කිරීම.

- ජය බහළු පර්යන්තයේ රැහැන් රහිත හා රැහැන් සහිත දත්ත සන්නිවේදන ජාල වැඩි දියුණු කිරීම, ප්‍රයිම් මූවර් රථ සඳහා NAVIS N4 ප්‍රයිම් රූට් පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

- කොළඹ වරායේ ගුදම්, කාර්යාල, වැඩපොළ සහ ප්‍රවේශ ගේට්ටු සඳහා CCTV කැමරා පද්ධති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

- නැගෙනහිර බහළු පර්යන්ත අදියර II හි සිවිල් වැඩ සංරචකයේ මධ්‍යම, අඩු අතිශයෙන්ම අඩු වෝල්ටීයතා පද්ධති සඳහා වැඩ බිම් සැලැස්ම, ද්‍රව්‍ය සැපයීම සහ ක්‍රමවේද ප්‍රකාශන සැලසුම් කිරීම, සමාලෝචනය කිරීම සහ භාර ගැනීම.

- නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර II හි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අංගන දොඹකර සහ පර්යන්ත මෙහෙයුම් පද්ධතිය ඒකාබද්ධ කිරීම.

- රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර සඳහා බලශක්ති වැය නොවන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

- නැගෙනහිර බහළු පර්යන්තයේ පරිපාලන ගොඩනැගිල්ල සඳහා මධ්‍යම, අඩු අතිශයෙන්ම අඩු වෝල්ටීයතාවයෙන් යුත් පද්ධති සඳහා වාතාශ්‍ර සහ වායු සමීකරණ පද්ධති සැලසුම් කිරීම, ටෙන්ඩර් සකස් කිරීම සහ ප්‍රදානය කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වරායයන් තුළ අඩු වෝල්ටීයතාවයෙන් යුත් විදුලිය බෙදා හැරීම, දුරකථන ජාල, දත්ත සන්නිවේදන ජාල, වායු සමීකරණ හා වාතාශ්‍ර පද්ධති උත්ශ්‍රේණි කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පාවෙන වත්කම්වල විදුලි, විද්‍යුත්, සන්නිවේදන හා නාවික පද්ධතිවල අළුත්වැඩියාව සහ නඩත්තු කටයුතු සිදු කිරීම.

- රේඩාර් සහ ගුවන් විදුලි සන්නිවේදන පද්ධති සවි කිරීම හා නඩත්තු කිරීම සහ දිවයින වටා ඇති සියළුම ප්‍රදීපාගාර නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.

නාවික ඉංජිනේරු කොට්ඨාශය

නාවික ඉංජිනේරු කොට්ඨාශය, නාවික කොට්ඨාශය සමඟ අඛණ්ඩ සහයෝගීත්වය ඇතිව, කොළඹ වරායට පැමිණෙන සියළුම නෞකාවල ගමනාගමනය බාධාවකින් තොරව පවත්වාගෙනයාම තහවුරු කරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුරෝගාමී කාර්යභාරයක් ඉටුකරන කොට්ඨාශයකි. සේවකයින් 271 දෙනෙකුගෙන් යුත් නාවික ඉංජිනේරු කොට්ඨාශය, නාවික, මෙහෙයුම්, සිවිල් ඉංජිනේරු සහ ආරක්ෂක යන කොට්ඨාශ වලට අවශ්‍ය කරනු ලබන පාවෙන යාත්‍රා අවශ්‍යතාවය 100% කින් පවත්වාගෙන යමින් කාර්යක්ෂම වරාය පරිසරයක් පවත්වාගෙන යාම තහවුරු කරයි.

නාවික කොට්ඨාශයේ අවශ්‍යතාවයනට අනුව පාවෙන යාත්‍රා ප්‍රමාණවත් ලෙස සේවයේ යොදවා ඇති බවට සහතික කිරීමේ වගකීම දරනු ලබන්නේ නාවික ඉංජිනේරු කොට්ඨාශය මගිනි. ගාල්ල වරායට හා ත්‍රිකුණාමලය වරායට එක් යාත්‍රාවක් බැගින් හා ත්‍රිකුණාමලය වරායට නැංගුරම් ටග් යාත්‍රා දෙකක් හා නියමු යාත්‍රා එකක් බැගින් වෙන්වූ කොළඹ වරායේ නැංගුරම් ටග් යාත්‍රා හතරෙහි සහ නියමු යාත්‍රා තුනෙහි දෛනික නිරාපද හා ප්‍රතිකාර්මික කටයුතු මෙයට අයත් වේ.

වර්ගීකරණ සමාගම් විසින් පනවනු ලබන නීති රීතිවල අධීක්ෂණය යටතට ගැනෙන පාවෙන යාත්‍රාවල තත්ත්වය උසස් ලෙස පවත්වාගෙන යාමට මෙම කොට්ඨාශය බැඳී සිටී. වර්ගීකරණය මගින් නැව් සමාගම් හා නැව් සංවිධානවල නැව් සඳහා ජාත්‍යන්තර නැව් මාර්ගවල ගමන් ගන්නා නෞකාවල නිරුපද්‍රිතතාවය තහවුරු කිරීමේදී අපගේ වරාය ඉහළ මට්ටමේ පවතින වරායයක් බව තහවුරු කිරීමට ඉවහල් වේ.

නාවික I සහ නාවික II වශයෙන් මෙම කොට්ඨාශය ප්‍රධාන කොටස් දෙකකට ව්‍යූහගත කර ඇති අතර ඉන් එක් ඒකකයක් ආයතනික අංශයෙහි විස්තර කර ඇති අනු ඒකක වලින් සමන්විත වේ. මෙම අංශවල සාමූහික ප්‍රයත්න 2023 වසරේ සමස්ත කාර්ය පැවරුමේ සාර්ථක නිමාවට දායක විය.

නාවික I

රිජ්ට් ඉංජිනේරු අංශය

වරාය නැංගුරම් ටග් යාත්‍රා, හැරීමේ යාත්‍රා සහ 'මේඝ' පාවෙන ගිනි නිවන යාත්‍රාව ඇතුළු ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් විවිධ වර්ගයේ යාත්‍රාවල නිරාපද නඩත්තු සහ ප්‍රතිකාර්මික නඩත්තු වැඩ ඉටු කිරීම රිජ්ට් ඉංජිනේරු අංශය වෙත පැවරී ඇත. හැරීමේ යාත්‍රා වන 'හංසකාවා' සහ 'දිය කොවුලා' යාත්‍රාවල ප්‍රධාන නඩත්තු වැඩ මෙන්ම ආරක්ෂක හා නාවික කොට්ඨාශ විසින් භාවිතා කරනු ලබන යාත්‍රාවල පිටතින් සවිකල යන්ත්‍රවල දෛනික අළුත්වැඩියා කටයුතු ද මෙම අංශය විසින් ඉටු කරන ලදී.

වර්ගීකරණ සමාගම්වල සහාය ඇතිව, නීති හා රෙගුලාසි වලට අනුගත වීම සහතික කරමින් ටග් යාත්‍රා සහ හෑරුම් යාත්‍රා සඳහා වියළි නැව් තටාකාංගන වලදී සිදු කරන අළුත්වැඩියා කටයුතු ඇතුළු ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. 'කන්චදේව' ටග් යාත්‍රාවේ දියයට අළුත්වැඩියාවන් හා යාන්ත්‍රික කොටස් අළුතින් සවි කිරීම් ඇතුළු අළුත්වැඩියාවන් සිදු කරන ලදී. M/T Wijayabahu ටග් යාත්‍රාවේ වියළි නැව් තටාකාංගන අළුත්වැඩියාවන් සිදු කරන ලද අතර එම අළුත්වැඩියාවන්ට වර්ගීකරණ සමාගම්වල ප්‍රමිතීන්ට අනුව යන්ත්‍ර පිරික්සුම් කටයුතු හා අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. තවද, වසරේ සුවිශේෂී කාර්යභාරයක් නිම කරමින්, ගෝඨයිම්හර, විජයබාහු සහ නන්දිමිත්‍ර යන ටග් යාත්‍රාවල යන්ත්‍ර පූර්ණ අළුත්වැඩියාවට ලක් කරන ලදී.

වරාය යාත්‍රා ඉංජිනේරු අංශය

නියමු යාත්‍රා, මූවරිං යාත්‍රා සහ අනෙකුත් යාත්‍රාවල අළුත්වැඩියා සහ නඩත්තු කිරීම සිදු කරනු ලබන්නේ වරාය යාත්‍රා ඉංජිනේරු අංශය මගිනි. 2023 වර්ෂයේදී 'නියමු 12', 'නියමු 10' සහ 'එකෝ 3' යන නියමු යාත්‍රාවල අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබීය. ත්‍රිකුණාමලය සහ ගාල්ල වරායයන්හි භාවිතයේ පවතින නියමු යාත්‍රා හා ටග් යාත්‍රා ඇතුළු ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සියළුම නියමු යාත්‍රා හා ටග් යාත්‍රාවල දෛනික අළුත්වැඩියා හා නඩත්තු සිදු කරන ලදී. නියමු යාත්‍රා සඳහා වර්ගීකරණ සමීක්ෂණ නියමිත කාලය තුළ සිදු කරන ලද අතර, එම යාත්‍රා මේ වන විට LR පන්තිය (LIoyd's Register) යටතේ පවතී.

නාවික I I

නැව්බඩු යාත්‍රා අංශය

මෙහෙයුම් කොට්ඨාශය ආශ්‍රිතව පවතින ඇදගෙන යාමේ ටග් යාත්‍රා, මෝටර් දියත් යාත්‍රා, වතුර බත්තල් සහ තට්ටු බත්තල් ඇතුළු නාවික කොට්ඨාශය යටතේ පවතින විවිධ යාත්‍රාවල වානේ සහ ව්‍යූහ අළුත්වැඩියාවන්, මතුපිට සැකසීම හා පින්තාරු කිරීම මුළුමනින්ම සිදු කරනු ලබන්නේ නැව්බඩු යාත්‍රා අංශය මගිනි. 2023 වර්ෂයේදී, නියමු යාත්‍රා (10, 12 සහ 14) මූවරිං 1 සහ 3 යන යාත්‍රා, 'කන්චදේව' සහ 'ගෝඨයිම්හර' යන නැංගුරම් යාත්‍රා, 'හංසකාවා' හැරීමේ යාත්‍රාව, 'මේඝ' ගිනි නිවන පාවෙන යාත්‍රාව සහ අංක 16 වතුර බත්තල යන යාත්‍රාවල ප්‍රධාන අළුත්වැඩියාවන් භාර ගන්නා ලදී. තවද, රැහැන් පටි (wire slings), තිර, කැන්වස් ආවරණ, වියන් සහ කූඩාරම් රෙදි ආදිය නිෂ්පාදනය කර මෙම අංශයේ බහුවිධ නිපුණතාවය ප්‍රදර්ශනය කරනු ලැබීය. මුළුතැන්ගෙයි උපකරණ නඩත්තු කිරීම සහ පිටකොටුව බෝට්ටු අංගනයේ යාත්‍රා දියත්මගට ගැනීම හා දියත් මගෙන් ඉවත් කිරීමේ මෙහෙයුම් ද මෙම අංශයේ කටයුතු වල කොටසකි.

නව බේරේ අංශය

මෙහෙයුම් කොට්ඨාශයේ භාවිතා කරන වානේ නැව්බඩු බත්තල් හා සැහැල්ලු බත්තල් නඩත්තු කිරීමේ හා අළුත්වැඩියා කිරීමේ වගකීම පැවරී ඇත්තේ නව බේරේ අංශය වෙතය. 2023 වර්ෂයේදී මෙම අංශය අංක 15 වතුර බත්තලෙහි අළුත්වැඩියා කිරීම සහ පේටන්ට් දියත් වර්ගයේ අට්ටාල අළුත්වැඩියා කිරීම මෙන්ම අංක 07 කැණීම් යාත්‍රාවේ අළුත්වැඩියාවන්ද සිදු කරන ලදී.

නැව් තැනීමේ අංශය

නාවික කොට්ඨාශයේ නැංගුරම් ටග් යාත්‍රාවල සහ දියත් යාත්‍රාවල දැව ගෘහ භාණ්ඩ හා දැව පෙන්ඩර් වල අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන්නේ මෙම අංශය විසිනි. කන්වදේව නැංගුරම් ටග් යාත්‍රාවේ සම්පූර්ණ අළුත්වැඩියාවක්ද මෙම අංශය විසින් සිදු කරන ලදී.

ලේකම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලනමය කේන්ද්‍රස්ථානය වනුයේ ලේකම් කොට්ඨාශයයි. සභාපති කාර්යාලය, උප සභාපති කාර්යාලය, කළමනාකාර අධ්‍යක්ෂ කාර්යාලය හා අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ කාර්යාලය ලේකම් කොට්ඨාශයට අයත් වන අතර අධිකාරියේ සමස්ත පරිපාලනමය කටයුතු මෙහෙයවනු ලබයි.

සියළුම කොට්ඨාශ / අංශ සම්බන්ධීකරණය වෙමින් ඉහළ කළමනාකාරීත්වයට හා බාහිර ආයතන වලට (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය, වෙනත් රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන) අවශ්‍ය තොරතුරු නිවැරදිව සැපයීම ප්‍රධාන වගකීම් වේ. පරිපාලනමය කටයුතු වලට අමතරව වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම, විගණන වාර්තාවට පිළිතුරු, අදාළ පාර්ලිමේන්තු කමිටුවේ වරාය අධිකාරියට අදාළ වාර්තා, පාර්ලිමේන්තුවේදී අමාත්‍යතුමා වෙත යොමු කරන ප්‍රශ්න වලට පිළිතුරු, කාර්තුමය ප්‍රගති වාර්තා, ප්‍රධාන උත්සව සංවිධානය කිරීම, සංචාරක බංගලාවල කටයුතු පාලනය, නඩත්තු කිරීම් සම්බන්ධව කටයුතු කිරීම, ඉහළ කළමනාකාරීත්වයේ සහභාගීත්වයෙන් පැවැත්වෙන රැස්වීම්වලට අවශ්‍ය පහසුකම් සැපයීම, සමාජීය වගකීම් ක්‍රියාකාරකම් (CSR) සඳහා මූලිකත්වය ලබා දී කටයුතු කිරීම වැනි ප්‍රධාන කාර්යයන්ද ලේකම් කොට්ඨාශය විසින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර (රන්) සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2023 වසරේදී පහත පරිදි ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය මගින් ගෙවීම් සිදු කර ඇත.

		සේවක සංඛ්‍යාව	එක් අයෙකු සඳහා ගෙවිය යුතු මුදල	හිමිකම් පෑ මුදල (රු.)
රෝහල් ගතවීම්	පෞද්ගලික	810	350,000.00 (වාර්ෂිකව)	73,113,718.00
	රජයේ	346	42,000.00 (වාර්ෂිකව)	5,379,399.00
බරපතල රෝග	හදවත් සැත්කම්	40	1,000,000.00 (ජීවිත කාලයටම)	35,186,959.00
	පිලිකා	22	600,000.00 (ජීවිත කාලයටම)	2,446,708.00
	මොලයේ සැත්කම්	2	1,200,000.00 (ජීවිත කාලයටම)	2,400,000.00
දරු උපත්	සීසේරියන්	121	100,000.00	7,610,413.00
	සාමාන්‍ය		50,000.00	

		සේවක සංඛ්‍යාව	එක් අයෙකු සඳහා ගෙවිය යුතු මුදල	හිමිකම් පෑ මුදල (රු.)
හදිසි අනතුරු	සුළු අකර්මන්‍ය 2.5%	1	1,500,000.00 (උපරිම මුදල)	37,500.00
මරණ	සාමාන්‍ය	18	700,000.00	12,600,000.00
	හදිසි අනතුරු	2	2,000,000.00	4,000,000.00
එකතුව		**1,362**		**142,774,697.00**

2023 වසර තුළ 2022 වසරට අදාළ වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම, විගණන වාර්තාවට පිළිතුරුද 2023 වර්ෂයට අදාළ පාර්ලිමේන්තු කමිටුවේ වරාය අධිකාරියට අදාළ වාර්තා, පාර්ලිමේන්තුවේදී අමාත්‍යතුමා වෙත යොමු කරන ප්‍රශ්න වලට පිළිතුරු, කාර්තුමය ප්‍රගති වාර්තා අදාළ කොට්ඨාශ සමඟ සම්බන්ධීකරණය වී සකස් කර අවසන් කර අදාළ ආයතන වලට යොමු කර ඇත.

එලෙසම වරාය අධිකාරියේ ඇතැම් විධායක නොවන සේවකයින් සඳහා පමුණුවනු ලබන විනයානුකූල දඩුවම් වලට එරෙහිව එම සේවකයින් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමද තවත් කාර්යයක් වේ. 2023 වසර තුළ මෙවැනි සේවක අභියාචනා 15 ක් ලැබී ඇති අතර වසර අවසන් වන විට එයින් 09 ක් නිම කර ඇත. ඉතිරි 06 පිළිබඳව අභියාචනා මණ්ඩලය විසින් විමර්ශනය කරමින් පවතී.

2023 වර්ෂයේදී විගණන විමසුම් 47 ලැබී තිබුණු අතර විගණන විමසුම් 43 සඳහා පිළිතුරු යවා ඇත.

පරිපාලනමය කටයුතු නිසි ක්‍රමවේදවලට අනුව පවත්වාගෙන යෑම පිණිස ඉහළ කළමනාකාරීත්වය විසින් වරින් වර ගනු ලබන තීරණ වලට අදාළව ලබා දෙන උපදෙස් අනුව 2023 වසර තුළ ලේකම් කොට්ඨාශය මගින් චක්‍රලේඛ 35 ක් නිකුත් කර ඇත.

මානව සම්පත් කොට්ඨාශය

ආරක්ෂිත හා සහයෝගී කාර්ය පරිසරයක උසස් නිපුණතාවයෙන් යුත් අභිප්‍රේරණය වූ හා සේවයට කැපවුනු සේවක පිරිසක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව ඇත. 2023.12.31 දිනට, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සංඛ්‍යාව 8,050 ක් විය. විවෘත හා සහයෝගී කාර්ය පරිසරයක් තුළ තරඟකාරී හා සාධාරණ වැටුප් දීමනා මෙම ආයතනය විසින් සිය සේවකයන්ගට ගෙවනු ලැබේ. අප සේවකයන් අතර පුද්ගලාභිවර්ධනය හා දියුණුව නගාසිටුවීම සඳහා ප්‍රතිලාභ පරාසයක් ප්‍රදානය කිරීම අවධානයට ලක් කළ යුතු වේ. අන්තර්ගත සංවිධානයක් ඇති කරමින්, සෑම සේවකයෙකු සඳහාම සාධාරණ ගෙවීම් ලැබීමේ හා සමාන අවස්ථාවලට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කරමින් සියළුම මට්ටම් වලදී තිබිය යුතු විවිධ නියෝජනය, පිළිගැනීම කෙරෙහි ප්‍රබල අවධානයක් යොමු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරයි.

තනතුරුවල තරාතිරම හා ආයතනික අවශ්‍යතා සමඟ ගැලපෙන අයුරින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි අනුමත සේවක සංඛ්‍යාවේ අවශ්‍යතාවය පිළිබඳව සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කරන ලද අතර, එමඟින් අවශ්‍ය අනුමත සේවක සංඛ්‍යාව 6,687 ක් බව හඳුනාගන්නා ලදී. මෙම යෝජිත අනුමත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර 2023.12.11 දින සිට ආයතනය තුළ ක්‍රියාත්මකව පවතී.

මෙයට සමගාමීව, විධායක හා විධායක නොවන සේවකයින් සඳහා නව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කෙරෙමින් පවතී. පූර්ව බඳවා ගැනීමේ පටිපාටියේ පවතින විවිධ අඩුලුහුඩුකම් නිවැරදි කරමින් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව, නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක කෙරෙනු ඇත.

වත්මන් වාර්තාකරණ වර්ෂයේදී, විධායක හා විධායක නොවන ශ්‍රේණියේ සේවක සංඛ්‍යාවේ සංයුතිය පහත පරිදි වේ.

සේවක කාණ්ඩය	ස්ථිර	කොන්ත්‍රාත් පදනම	එකතුව
විධායක	479	43 (ද්විතීය පදනම 01)	522
විධායක නොවන	4,296	-	4,296
තාක්ෂණික/ තාක්ෂණික නොවන	3,232	-	3,232
එකතුව	**8,007**	**43**	**8,050**

අනුමත සේවක සංඛ්‍යාවේ ප්‍රමාණය හා බඳවා ගැනීමේ ක්‍රියාවලියේ යන දෙඅංශයෙන්ම මෙම ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රසාදනය කිරීම තුළින් කාර්යක්ෂමතාව වැඩි දියුණු වීම හා වත්මන් ආයතනික අවශ්‍යතා සමඟ ගැලපෙන අයුරින් සකස් කිරීමේ ක්‍රමෝපායික ක්‍රියාමාර්ගයක් සනිටුහන් කරයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුහුණු අංශය වන මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන්, අභිප්‍රේරණ සැසි හා පුහුණු වැඩසටහන් පවත්වයි. මෙම පියවර මගින් සේවකයින්ගට සිය දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කර ගැනීම සඳහා වැදගත් අවස්ථා සැලසේ.

ආයතනය තුළ විනයානුකූල සේවක පිරිසක් පවත්වා ගෙන යෑමේ වගකීම අවධාරණය කරමින් මානව සම්පත් කොට්ඨාශය මගින් විනය පරීක්ෂණ 151 ක් සාර්ථකව අවසන් කර ඇත.

පහත සඳහන් කරුණු මත 2023 වසර තුළ සේවකයන් 552 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය හැර ගොස් ඇත.

විශ්‍රාම ගැනීම් (අනිවාර්ය හා නියමිත දිනට පූර්ව විශ්‍රාම යෑම)	461
මරණ	27
සේවයෙන් පහ කිරීම	03
ඉල්ලා අස්වීම්	23
සේවය අතහැර යෑම	32
වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම්	06
සේවය අවසන් කිරීම	-
එකතුව	**552**

මෙම කාලසීමාව තුළදීම හදිසි අනතුරු හේතුකොටගෙන සේවකයින් 48 දෙනෙකුට නිවාඩු අනුමත කරන ලදී.

සේවකයින්ගේ සංවිධානය වීමේ නිදහස හා සාමූහික කේවල් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය නිරතුරුව පිළිගෙන එයට ගරු කිරීම සිදු කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, සේවකයින්ගෙන් 88% ක් පමණ විවිධ වෘත්තීය සමිති මගින් නියෝජනය වන අතර එමඟින්, සාමූහික හා විවිධත්වයෙන් යුත් කාර්ය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ආයතනය දක්වන කැපවීම පිළිබිඹු වේ.

සුහසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්වකීය අරමුණු සාක්ෂාත්කර ගැනීමට සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා මානව සම්පත සැලකිය යුතු වැදගත් ස්ථානයක තබා කටයුතු කරයි. භෞතික සම්පත් කාර්යක්ෂමව

කළමනාකරණය කිරීම හා සසඳා බැලීමේදී මානව සම්පත කළමනාකරණය කිරීම සඳහා අනන්‍ය ප්‍රවේශයක් ගැනීම අවශ්‍ය වේ. මෙයට ප්‍රතිචාර ලෙස සේවකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම මගින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම හා තෘප්තිමත් භාවය වැඩි කිරීම සඳහා සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය 2023 වසරේදී විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

කාර්යාල ගණයේ සේවකයින්හට සහ සේවා මුර පදනමෙහි සේවකයින්හට දිවා සහ රාත්‍රී ආහාර, උදේ ආහාර, තේ සහ කැවිලි සැපයීම සඳහා මධ්‍යම මුළුතැන්ගෙවල් අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2023 වර්ෂය තුළ, පිළිවෙලින් රු. 1,342,248,299/- ක් හා රු. 574,512,860/- ක් වැය කරමින් මුළු දිවා රාත්‍රී ආහාර වේල් 2,866,784 ක් හා තේ සහ කැවිලි වේල් 3,767,144 ක් සපයා ඇත. ඒ අනුව, වසරේ සමස්ත ආහාර වියදම රු. 1,916,761,159/- ක් වේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුභසාධනය සඳහා රු. 45,397,002/- ක මුදලක් 2023 වසරේදී ප්‍රතිපූර්ණය කරන ලද අතර මෙයට ඇස් කණ්ණාඩි ලබා දීම වෙනුවෙන් රු.14,465,800/- ක මුදලක් සහ බාහිර වෛද්‍ය බිල්පත් වෙනුවෙන් රු. 30,931,202/- ක මුදලක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ අ.පොස. (සා.පෙළ) විභාගයෙන් සමත් දරුවන්හට මසකට රු. 750/- බැගින් වසර දෙකක් සඳහා ශිෂ්‍යත්ව ලැබීමට යෝග්‍යතාවය ලබා තිබිණ. විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපනය සඳහා තෝරාගනු ලැබූ දරුවන්හට මසකට රු. 2,500/- බැගින් ඔවුන්ගේ උපාධි පාඨමාලාවේ අධ්‍යයන වර්ෂය තුළ ගෙවනු ලැබේ. 2023 වසරේ ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා මුළු වියදම රු. 16,576,000/- ක් විය.

දීර්ඝ කාලීන සේවය අගය කිරීමක් වශයෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවකයන්ගේ සේවය ඇගයීමට ලක් කරමින් ත්‍යාග පිරිනමන අතර වසර පහළොවකට වැඩි සේවා කාලයක් හිමි විශ්‍රාම යන හෝ සේවයෙන් ඉල්ලා අස්වන සේවක මහත්ම/ මහත්මීන්ගේ සේවා කාලය අනුව රන් පවුම් ලබා දීම වෙනුවට මුදල් ප්‍රදානය කරනු ලැබේ. මෙම ත්‍යාග සඳහා 2023 වසරේදී සේවක මහත්ම / මහත්මීන් 110 ක් සඳහා රු. 18,093,750/- ක මුළු මුදලක් වැය කර ඇත. වසර 30 ක සේවා කාලය සම්පූර්ණ කරන සියළු සේවක මහත්ම/ මහත්මීන්ට අගනා පෝසිලේන් තේ කට්ටල ප්‍රදානය කෙරේ. 2023 වසර තුළ දී පෝසිලේන් කට්ටල 210 ක් ප්‍රදානය කර ඇත.

වරාය පරිශ්‍රය තුළ ස්ථාපිත සුභසාධක ආපනශාලා මගින් වාර්ෂික මුළු බදු කුලී මුදල ලෙස රු. 5,889,197/- ක මුදලක් අය කර ඇත.

2023 වර්ෂය තුළ කෞතුකාගාරය නැරඹීම සඳහා ශ්‍රී ලාංකිකයන් 57,793 දෙනෙකු සහ විදේශීය ජාතිකයින් 1,950 දෙනෙකු පැමිණ ඇත.

වෛද්‍ය කොට්ඨාශය

සතියේ දින 7 පැය 24 තුළ මූලික සෞඛ්‍ය සේවා ලබා දීම සහතික කරමින් සේවකයින්හට සෞඛ්‍ය ආශ්‍රිත සේවා ලබා දීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය කොට්ඨාශය කටයුතු කරයි. සෞඛ්‍ය අධ්‍යාපනය හා සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලබන අතර රාජකාරී කටයුතු සඳහා වෛද්‍ය යෝග්‍යතාවය තක්සේරු කිරීම, වෛද්‍ය නිවාඩු අනුමත කිරීම සහ විවිධ වෛද්‍යාධාර යෝජනා ක්‍රම පරිපාලනය කිරීම හා අනුමත කිරීම ද සිදු කරනු ලැබේ.

තවද, ඩෙංගු මර්දනය, ජලභීතිකා මර්දනය, කලින් කලට පැතිරෙන වසංගත රෝග සහ වෙනත් හදිසි මහජන සෞඛ්‍ය අවශ්‍යතාවයන් වැනි ගැටළු පිළිබඳව අවධානය යොමු කරමින්, නිවාරණ සෞඛ්‍ය කටයුතු පිළිබඳව වැදගත් කාර්යභාරයක් මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී.

- මෙහෙයුම් කොට්ඨාශයේ අසතුටුදායක සෞඛ්‍ය තත්ත්වයන් හේතුකොටගෙන ඉහළ අවධානමකට ලක්ව ඇතැයි සැලගෙන තෝරාගත් සේවකයින්ගේ සෞඛ්‍ය යෝග්‍යතාවය තක්සේරු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- මත්පැන් පානය කිරීම පරීක්ෂා කිරීම සඳහා දැනට භාවිතා කරනු ලබන ප්‍රශ්වාසය මගින් රියදුරෙකු ගත් මධ්‍යසාර ප්‍රමාණය මනිනු ලබන උපකරණ පරීක්ෂණය අනුපූරණය කරමින්, සේවකයින් අතර නීති විරෝධී මත්ද්‍රව්‍ය පානය කර ඇති බව අනාවරණය කර ගැනීමේ මාර්ග ක්‍රියාත්මක කරන ලදී. සෞඛ්‍ය අධ්‍යාපනය හා උපදේශනය ලබා දුන් අතර මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ සේවකයන් සඳහා පුනරුත්ථාපන කටයුතු සහ ප්‍රතිකාර කිරීම ද මෙම කොට්ඨාශය මගින් සිදු කරන ලදී.

- සෞඛ්‍ය උවදුරු සහිත ස්ථාන හා ප්‍රදේශ හඳුනාගෙන සිතියම්ගත කිරීම සඳහා විශේෂ වැඩසටහන් ආරම්භ කරන ලද අතර මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

- මුඛ සෞඛ්‍ය පිළිබඳව වැදගත්කම සේවකයන් අතර අවධාරණය කරමින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයේදී වාර්ෂික දන්ත සායනයක් සංවිධානය කරන ලදී.

- දෘෂ්ටි සෞඛ්‍ය හා යහපැවැත්ම තහවුරු කරමින් වරාය සේවකයින් සඳහා අක්ෂි සායනයක් සංවිධානය කිරීම සඳහා ආයතනයක් සමඟ සම්බන්ධ වන ලදී.

නිවාරණ ක්‍රියාමාර්ග හා සක්‍රිය සෞඛ්‍ය සේවා පිළිබඳව මැදිහත්වීම් ඇතුළත්ව මෙම සාමූහික ක්‍රියාමාර්ග තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක පිරිසේ යහපැවැත්ම සහ පූර්ණ සෞඛ්‍ය රැකගැනීම පිළිබඳව වෛද්‍ය කොට්ඨාශයේ කැපවීම පෙන්නුම් කරනු ලැබේ.

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය (MPMA)

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුහුණු කිරීමේ අංශය වන මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය ISO 9001 : 2015 තත්ත්ව සහතිකය යටතේ ක්‍රියාත්මක වේ. මෙම ආයතනයේ මූලික අරමුණ වනුයේ වරාය සේවකයින් හා වරාය භාවිතා කරන්නන්හට පුහුණු සේවා ලබා දීම සහ දේශීය හා අන්තර්ජාතික වශයෙන් වරාය, සමුද්‍රීය හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර තුළ පුහුණු වීම් සඳහා පහසුකම් ලබා දීම වේ. දැනුවත් කිරීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, වෘත්තීය පරීක්ෂණ, ප්‍රවීණතා තක්සේරු සහ ප්‍රායෝගික පුහුණු සැසි ඇතුළු වැඩසටහන් රාශියක් විවිධ සේවක කණ්ඩායම්වල දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා මෙම විද්‍යායතනය කැපවී කටයුතු කරයි. තවද, සමුද්‍රීය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සඳහා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් නව පුහුණු වැඩසටහන් සංවිධානය කරන අතර ජාතික වෘත්තීය සුදුසුකම් යටතේ සුදුසුකම් සපුරා ගැනීමට අපේක්ෂා කරන්නන් සඳහා ප්‍රවීණතාවය මත පදනම් වූ ඇගයීම් වැඩසටහන් ද පවත්වනු ලැබේ.

මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය එහි පුහුණු වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් වශයෙන් වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය හා ඉන්දියන් රෙජිස්ට්‍රාර් ඔෆ් කොලිටි සිස්ටම්ස් (IRQS) යන ආයතනවල සම්බන්ධතාවය ඇතිව සහතික විගණන දෙකේ පරීක්ෂාවට යටත්ව සිදු කරනු ලබයි. අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය (IMO) / පුහුණු කිරීමේ, සහතික කිරීමේ, පිරික්සුම් පාලනයේ ප්‍රමිති (STCW) සම්මුතියට අනුකූලව නාවිකයින් සඳහා සමුද්‍රීය පුහුණු වැඩසටහන් පැවැත්වීමට මෙය අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ සමුද්‍රීය අධ්‍යාපන ආයතනයක් වශයෙන් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය, IRQS ආයතනයෙන් ISO 9001 : 2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය හිමි කර ගෙන ඇත. 2022 වසරේදී, සමුද්‍රීය පුහුණු වැඩසටහන් පැවැත්වීමේ බලපත්‍ර අළුත් කිරීම සඳහා වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයෙන් විගණනයක් පැවැත්වූ අතර වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය සහ IRQS

ආයතනය මගින් පැවැත්වූ විගණනය මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් සාර්ථකව අවසන් කරන ලදී.

2023 වසරේදී, මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය එහි පුහුණු කිරීමේ වැඩසටහන් වැඩි දියුණු කිරීම සඳහා පියවර ගණනාවක් ගෙන ඇත. වරාය සේවකයන්, නාවිකයින්, උපාධි අපේක්ෂකයන් සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ අභ්‍යාසලාභීන්හට විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම සාර්ථකව අවසන් කිරීම ද මෙයට අයත් වේ. මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය එහි ප්‍රධාන විදුලි යටිතල පහසුකම් පද්ධතියට සූර්ය බලශක්ති පද්ධතියක් ඒකාබද්ධ කිරීම තුළින් තිරසර ක්‍රමවේද වලට අනුගත විය. පන්ති කාමර නවීකරණය කරන ලද අතර ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) සහිත තාක්ෂණික දියුණුව හඳුන්වා දෙන ලදී.

2023 වර්ෂයේ, මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මූල්‍යමය වශයෙන් ප්‍රශස්ත කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, රු. 153,257,815/- ක සමස්ත ආදායමක් උපයන ලදී. ගාස්තු අය කරන පාඨමාලා වලින් රු. 122,321,802/- ක් සහ ගාස්තු අය නොකරන පාඨමාලා මගින් රු. 30,936,013/- ක් උපයා ඇත. පුහුණු පාඨමාලා සඳහා වියදම රු. 25,931,175/- ක් විය.

පුහුණු කිරීමේ කාර්යසාධනය පිළිබඳව සඳහන් කිරීමේදී, අභ්‍යාසලාභීන් 12,924 දෙනෙකු සහභාගී වූ මිනිස් පැය 326,382 කින් යුත් විවිධ විෂයයන් පිලිබඳ වැඩසටහන් 606 ක් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් පවත්වන ලදී. සමුද්‍රීය හා නාවිකත්වය, වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව, වරාය මෙහෙයුම් හා සේවා සැපයුම්, තොරතුරු පද්ධති, කළමනාකරණය හා තාක්ෂණික අංශ මෙම වැඩසටහන් වලට ඇතුළත් විය.

නීති කොට්ඨාශය

නීති නිලධාරීන් යනු, 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් විශේෂයෙන් සඳහන් කර ඇති කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය යන වරායවල නීති උපදේශකයින් වන අතර, මෙම නීති උපදේශකයින් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට, අධ්‍යක්ෂවරුන් වෙත, කොට්ඨාශ ප්‍රධානීන් වෙත හා අංශ ප්‍රධානීන් වෙත නීති උපදෙස් දීම සිදු කරනු ලබයි.

නීති උපදෙස්

2023 වර්ෂය තුළ කළමනාකාරීත්වයට හා කොට්ඨාශ ප්‍රධානීන් වෙත නීති උපදෙස් 150 කට වැඩි වැඩි උපදෙස් සඛ්‍යාවක් ලබා දී ඇත.

ඊට අමතරව, කොන්ත්‍රාත්තු, ගිවිසුම් හා බැඳුම්කර කෙටුම්පත් කිරීමේ හා ඒ හා සම්බන්ධ වෙනත් කටයුතු වල යෙදී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන ඔප්පු (පැවරුම්, කල්බදු, ප්‍රකාශන, උගස් ආදී) පිළිබඳ කටයුතු ද නීති කොට්ඨාශයේ විෂය පථය යටතට ගැනේ.

කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර සහ ඔප්පු

2023 වර්ෂය තුළ කල් බදු ගිවිසුම් 47 ක්, අවලංගු කිරීමේ ඔප්පු 01 ක්, ගිවිසුම්/කොන්ත්‍රාත් 81 ක්, පරිශිෂ්ට, ව්‍යාපාර, සම්ප්‍රේෂණ, කොටස්කාර ගිවිසුම්, සෘජු ගිවිසුම් ආදිය සහ අවබෝධතා ගිවිසුම් නීති කොට්ඨාශය විසින් ක්‍රියාත්මක කර ඇත.

- විදේශ රැකියා/ පුහුණු වීම්/ අධ්‍යාපන හා සම්බන්ධ වැටුප් රහිත නිවාඩු පිළිබඳ ගිවිසුම් හා බැඳුම්කර 41 ක්.
- පූර්ණ වැටුප් සහිත විදේශීය/දේශීය අධ්‍යාපන කටයුතු සඳහා ගිවිසුම් හා බැඳුම්කර 17 ක්.
- අවබෝධතා ගිවිසුම් 02 ක්
- පරිපූරක ගිවිසුම්, ව්‍යාපාර සම්ප්‍රේෂණ ගිවිසුම්, සෘජු ගිවිසුම්, කොටස්හිමිකාර ගිවිසුම් 21 ක්

අධිකරණ ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශ්වකරුවෙකු වන ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ, මහාධිකරණ, දිසා උසාවි, සහ කම්කරු විනිශ්චය සභා, ආදී අධිකරණමය කටයුතු වලට සම්බන්ධ සියළුම කටයුතු ද නීතිපති හා නීති උපදේශකයින්ගේ සහාය ඇතිව නීති කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ.

ඉහත සඳහන් නඩු වලට අමතරව, කම්කරු දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිසම, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (Ombudsman), කම්කරු උසාවි, කම්කරු වන්දි හා රේගු විමර්ශන පිළිබඳ කටයුතු ද නීති කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ.

2023.12.31 දින වන විට එම ආයතනවල නිම නොවූ නඩු /පැමිණිලි/අයදුම්/ විමර්ශන 275 ක් ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු

2023 වසර තුළ ශ්‍රේෂ්ඨාධිකරණයේ අළුත් නඩු 03 ක් පවරා ඇති අතර නඩු 09 ක් අවසන් කර ඇත. 2023.12.31 දිනට නිම නොවී තිබූ නඩු ගණන 22 ක් විය.

අභියාචනාධිකරණ නඩු

2023 වර්ෂය තුළ, අළුතින් නඩු 03 ක් ගොනු කරන ලද අතර, නඩු 03 ක් අවසන් විය. 2023.12.31 දිනට නඩු 34 ක් අවසන් නොවී පැවතින.

මහාධිකරණ නඩු

2023 වර්ෂය තුළ, අළුත් නඩු 01 ක් ගොනු කර ඇති අතර නඩු 02 ක් නිම විය. 2023.12.31 දිනට පැවති නඩු ගණන 07 ක් විය.

දිසා උසාවි නඩු

2023 වර්ෂය තුළ, අළුත් නඩු 01 ක් ගොනු කරන ලද අතර නඩු 03 ක් නිම විය. 2023.12.31 දිනට නිම නොවී පැවති නඩු ගණණ 28 ක් විය.

මහේස්ත්‍රාත් උසාවි නඩු

2023 වර්ෂය තුළ, අළුත් නඩු 23 ක් ගොනු කරන ලද අතර, නඩු 03 ක් නිම විය. 2023.12.31 දිනට නිම නොවී පැවති නඩු 43 ක් විය.

කම්කරු විනිශ්චය සභා විමසුම්

2023 වර්ෂය තුළ විමසුම් 13 ක් නිම කරන ලදි. 2023.12.31 දිනට විමසුම් නිම නොවී පැවති නඩු 02 ක් විය.

මානව හිමිකම් කොමිසම් සභා අයදුම්පත්, කම්කරු ආරවුල් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සහ කම්කරු වන්දි විනිශ්චය සභා කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම්

මානව හිමිකම් කොමිසම

2023 වර්ෂය තුළ, අළුත් නඩු 11 ක් ගොනු කරන ලද අතර නඩු 09 ක් නිම කරන ලදී. 2023.12.31 දිනට නිම නොවී පැවති නඩු ගණන 34 ක් විය.

කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි

2023 වර්ෂය තුළ, අළුත් නඩු 15 ක් ගොනු කරන ලද අතර, නඩු 04 ක් නිම විය. 2023.12.31 දිනට පැමිණිලි 78 ක් නිම නොවී පැවතින,

බේරුම්කරණ (වාණිජ)

2023 වර්ෂය තුළ, අළුත් නඩු ගොනු නොවීය. නඩු 01 ක් නිම විය. 2023.12.31 දිනට නඩු 75 ක් නිම නොවී පැවතින.

බේරුම්කරණ (කාර්මික)

2023 වර්ෂය තුළ, අළුත් නඩු 02 ක් ගොනු කර ඇත. නඩු 03 ක් නිම විය. 2023.12.31 දිනට නඩු 05 ක් නිම නොවී පැවතින.

රේගු විමර්ශන

2023 වර්ෂය තුළ, අළුත් නඩු ගොනු කිරීම හෝ නිම නොවීම සිදු නොවීය. 2023.12.31 දිනට නොවූ නොවූ නඩු 02 ක් නිම නොවී පැවතින.

<u>කම්කරු වන්දි</u>

2023 වර්ෂය තුළ, අළුත් නඩු ගොනු නොවුණු අතර නඩු 01 ක් නිම විය. 2023.12.31 දිනට නිම නොවූ නඩු නොවූ අතර පැවති නඩු ද නොවීය.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (Ombudsman)

2023 වර්ෂය තුළ, අළුත් පැමිණිලි ඉදිරිපත් නොවිණ. 01 පැමිණිල්ලක් අවසන් විය. 2023.12.31 දිනට නිම නොවී පැවති පැමිණිලි ගණන 19 ක් විය.

තොරතුරු පද්ධති කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වාප්පු ලිපිකරුවන් සහ නිෂ්කාශන ආයතන සඳහා විශේෂයෙන්ම නිර්මාණය කළ නවීන නිෂ්කාශන බලපත්‍ර පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. මෙම පද්ධතිය මගින් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරමින් වාර්ෂික බලපත්‍ර හා තාවකාලික බලපත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා ගැනීමේ පහසුකම් සලසනු ලැබේ. තවද, මෙම පද්ධතිය මගින් නිත්‍ය වරාය භාවිතාකරන්නන්හට ස්වකීය ප්‍රවේශ බලපත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ අඛණ්ඩව ලබා ගෙන වරායට පිවිසීමේ පහසුව සියළුම අදාළ පාර්ශවීය ආයතන සඳහා බලපත්‍ර කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සැලකිය යුතු අන්දමින් වැඩි දියුණු වන බවට විශ්වාස කළ හැකිය.

තාක්ෂණික ප්‍රගමනය සඳහා අප විසින් ක්‍රියාත්මක කර ඇති දායකත්වයේ එක් කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි සියළුම කොට්ඨාශ හරහා විද්‍යුත්මාර්ගික ලේඛන ඩිජිටල්කරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී. මෙම පද්ධතිය අපගේ ලේඛන කළමනාකරණ රටා, උසස් සංඛ්‍යාංකන ගොනුගත කිරීමේ හැකියාවන්, සොයාගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම, ප්‍රශස්ත ලේඛන පාලනය සහ අනාගත භාවිතය සඳහා දත්ත ගබඩා කිරීම, ආදියෙහි පරිවර්තනයක් ඇතිවන පරිදි නිර්මාණය කර ඇත. මෙම පද්ධතිය හඳුන්වාදීම අපගේ කාර්යයන්හි තිරසරභාවය හා කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කරමින්, කඩදාසි භාවිතයෙන් තොරවූ පරිසරයක් වෙත ගමන් කිරීමේ ක්‍රමෝපායක් වේ.

ආයතනයේ අභ්‍යන්තර සම්පත් භාවිතා කරමින් නම්‍ය වූ මානව සම්පත් පද්ධතියක් බිහි කිරීම ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නායකත්වය භාර ගෙන ඇත. ආයතනයේ

විශේෂිත අවශ්‍යතා ඉටු කිරීම සඳහා වූ ඉහළ මට්ටමේ පාලනයක් හා භාවිත රටාවක් අරමුණු කොටගනිමින් අභ්‍යන්තර හැකියාවන් භාවිතා කිරීමේ සැබෑ දායකත්වය මෙම පද්ධතිය මගින් පිළිඹිඹු වේ.

සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාශය

ක්‍රියාකාරිත්වය

කොළඹ, ගාල්ල හා ත්‍රිකුණාමලය යන වරායයන් ඇතුළුව සමස්ත ආයතනයටම ද්‍රව්‍ය, උපකරණ හා ඉන්ධන අඛණ්ඩව හා කාර්යක්ෂමව සැපයීම සහතික කිරීම සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාශයේ මූලික වගකීම වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම කොට්ඨාශ හා අංශ වලට ඉන්ධන, යන්ත්‍ර, උපකරණ අමතර කොටස් සහ අනෙකුත් අවශ්‍ය අයිතම ප්‍රසම්පාදනය (දේශීය හා විදේශීය) කිරීම, ගබඩා කිරීම හා අංශ සඳහා බෙදාහැරීම ඇතුළුව විවිධ කාර්යයන් වල මෙම කොට්ඨාශය ක්‍රියාකාරීව නියැලී සිටී.

තවද, මධ්‍යම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය අයිතම නියමිත කාලයට සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ කාර්ය මෙම කොට්ඨාශය වෙත පැවරී ඇති අතර එමඟින් මධ්‍යම මුළුතැන්ගෙයි කටයුතු බාධාවකින් තොරව ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. මෙම කොට්ඨාශයේ වගකීම් අනු අංශ කිහිපයකට එනම් දේශීය මිලදී ගැනීම්, විදේශීය මිලදී ගැනීම්/ වාප්පු, පරිපාලන, වවුචර්පත්, තොග පාලනය සහ ප්‍රධාන ගබඩාව වශයෙන් බෙදා ඇති අතර එක් එක් අංශ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත ප්‍රසම්පාදන හා සේවා සැපයුම් දාම කළමනාකරණය හා සම්බන්ධ විශේෂිත රාජකාරී හා කාර්යභාරයක් පවරනු ලැබ ඇත.

2023 වසරේ ප්‍රගතිය

සමාලෝචිත වර්ෂය තුළ අනුමත කරන ලද ටෙන්ඩර් ගණන

ටෙන්ඩරයේ නම	ටෙන්ඩර් ගණන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	ටෙන්ඩර් ගණන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන්
DPC (රු. 20,000,000 ට වැඩි)	15	523
mPC – A (රු. 500,000 සිට රු. 20,000,000 දක්වා)	53	3,086
mPC – B (රු. 500,000 ට වඩා අඩු අනුමත සීමාව)	99	4,913

2023 වසරේ දේශීය මිලදී ගැනීම් වල සමස්ත වියදම

- ප්‍රාග්ධන නොවන අයිතම - රු. මිලියන 11,748.7
- ප්‍රාග්ධන අයිතම - රු. මිලියන 505.7

2023 වසරේ විදේශීය මිලදී ගැනීම් සඳහා සමස්ත වියදම

- පිරිවැය සහ භාණ්ඩ ප්‍රවාහන අගය

  ප්‍රාග්ධන නොවන භාණ්ඩ - රු. මිලියන 727
  ප්‍රාග්ධන භාණ්ඩ - රු. මිලියන 8,455

- විවෘත කරන ලද ණයවර ලිපි ගණන (D/A,D/P ඇතුළුව) - 90
- විවෘත කරන ලද ටෙලිග්‍රැෆික් හුවමාරු ඇණවුම් - 32

2023 වසරේ වාප්පු අංශය මගින් නිෂ්කාශනය කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු

- මුහුදු ප්‍රවාහනය - 67
- ගුවන් ප්‍රවාහනය - 59

2023.12.31 දිනට තොග වටිනාකම රු. 1,190,162,572.77

ප්‍රධාන ගබඩාව සහ තොග පාලනය

ගබඩාව වෙත ලැබූ භාණ්ඩවල වටිනාකම (2023 වර්ෂය තුළ (ප්‍රාග්ධන නොවන))	රු. 7,764,786,932.82
ගබඩාව වෙත ලැබූ භාණ්ඩවල වටිනාකම (2023 වර්ෂය තුළ (ප්‍රාග්ධන))	රු. 1,049,456,716.17
භාණ්ඩ භාවිතා කරන අංශ වෙත නිකුත් කරන ලද භාණ්ඩවල වටිනාකම (ප්‍රාග්ධන නොවන)	රු. 7,560,845,790.69

ආරක්ෂක කොට්ඨාශය

ආරක්ෂක කොට්ඨාශය වරාය අධිකාරිය තුළ ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සියළුම වරාය සේවාවන් සඳහා ආරක්ෂාව සැපයීම, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලනයට අයත් සියළුම වරායයන් සතු දේපළ හා මානව සම්පත ආරක්ෂා කිරීම, වරාය භාවිතා කරන්නන්, වරාය භූමිය හා මුහුදු සීමාවන් ආරක්ෂා කිරීම මෙන්ම මෙහෙයුම් කරනු ලබන භාණ්ඩ හා සේවාලාභී යාත්‍රා වෙත ආරක්ෂාව සැපයීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන වගකීම් වේ. මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභිලාශයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ආරක්ෂක කටයුතු ඉතා ප්‍රශස්ථ මට්ටමින් සැපයීමට මෙම කොට්ඨාශය බැඳී සිටින අතර එම කාර්යය ඉටු කිරීම සඳහා ගතයුතු සෑම පියවරක්ම ගනු ලබන අතර සපයනු ලබන වෙනත් විවිධ සේවාවන් මගින් ආදායම් ඉපයීමට ද මෙම කොට්ඨාශය සමත් වී ඇත.

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ කොට්ඨාශය මගින් පහත සඳහන් කටයුතු සිදු කරන ලදී.

වරාය ප්‍රවේශ ගේට්ටු නවීකරණය කිරීම

- ප්‍රවේශ ගේට්ටුවල පරීක්ෂා කිරීම් කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා අංක 01ඒ, 01,02,03,05,06 හා 08 යන ගේට්ටු ඇතුළුව ගේට්ටු ගණනාවක ආවේක්ෂණ කැමරා (CCTV) පද්ධති සාර්ථකව ස්ථාපිත කර ඇත.

- වරාය ප්‍රවේශ බලපත්‍ර පරීක්ෂා කිරීම සඳහා කේත පරිලෝකන යන්ත්‍ර හඳුන්වාදීම මූලික නියමු ව්‍යාපෘතියක් ලෙස ගේට්ටු අංක 1 හි සහ ගේට්ටු අංක 3 හි ක්‍රියාත්මක කර ඇති අතර, ඉදිරියේදී මෙම ක්‍රමය සියළුම වරාය ප්‍රවේශ ගේට්ටුවල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබේ.

ප්‍රවේශ දොරටුවලදී විකිරණශීලී නැව් භාණ්ඩ පරීක්ෂා කිරීම

- වරාය පිවිසුම් දොරටුවලින් ඇතුළුවන හා පිටවන සියළුම නැව් භාණ්ඩවල විකිරණශීලීතාවය මෙගාපෝට් පද්ධතිය මගින් පරීක්ෂා කරනු ලබන අතර, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආනයන, අපනයන හා ප්‍රතිඅපනයන බහළු හා සාමාන්‍ය නැව්බඩුවල හඳුනාගැනීමට හැකි වී ඇත.

- අධික විකිරණශීලීතාවයකින් යුත් නැව්භාණ්ඩ එකොළහක් වැඩි දුරු පරීක්ෂා කර නිදහස් කිරීම සඳහා පරමාණු බලශක්ති අධිකාරිය වෙත යොමු කර ඇත.

ආදායම් උත්පාදනය

- 2023 වර්ෂය තුළ විවිධ කාණ්ඩයන් යටතේ වරාය පිවිසුම් බලපත්‍ර නිකුත් කිරීම මගින් ආරක්ෂක කොට්ඨාශය රුපියල් මිලියන 463.78 ක ආදායමක් උපයා ඇත.

පුහුණුව හා සංවර්ධනය

- ආරක්ෂක නිලයින්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම සඳහා 2023 වර්ෂය තුළදී ආරක්ෂක පුහුණු පාසල මගින් විවිධ පුහුණු වැඩසටහන් 05 ක් යටතේ පුහුණු සැසිවාර 13 ක් සංවිධානය කරන ලදී. මෙම පුහුණු වැඩසටහන් මගින් ආරක්ෂක නිලයින් හා වෙනත් නිලධාරීන් 215 ක් වෙත පුහුණුව ලබා දී ඇත.

- ආරක්ෂක පුහුණු පාසලේ ස්ථාපිත කර ඇති වායු රයිෆල් වෙඩිපිටිය, මුදල් අය කිරීමේ පදනම මත බාහිර පාර්ශ්වයන් වෙතද ලබා දීමෙන් වෙඩිපිටි ගාස්තු වශයෙන් රුපියල් 156,600/- ක මුදලක් 2023 වර්ෂයේදී උපයා ඇත.

- සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය සමඟ එක්ව පවත්වාගෙන යන ලද ආරක්ෂක ඩිප්ලෝමා පාඨමාලාව නැවත ආරම්භ කිරීම සඳහා සාකච්ඡාවක් ආරම්භ කිරීම.

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් හා බාහිර ආයතන අතර පවතින සබඳතා ශක්තිමත් කරමින් හා ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා සන්නිවේදන හා මහජන සබඳතා කොට්ඨාශය එහි ආරම්භයේ සිටම කටයුතු කර ඇත.

ජනමාධ්‍ය ආයතන, සාමාන්‍ය ජනතාව, රජයේ දෙපාර්තමේන්තු හා නියෝජිතායතන සහ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය හා මහජන සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය වෙත පැවරී ඇති වගකීම් වලින් එකකි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී මාධ්‍යවේදීන්, විශ්ලේෂකයින්, රාජ්‍ය නිලධාරීන් හා වෙනත් ප්‍රබල පාර්ශ්වයන් සමඟ සම්බන්ධතා සහ සන්නිවේදනය කළමනාකරණය කිරීම සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ වැදගත් කාර්යභාරයක් වේ.

දේශීය හා විදේශීය මාධ්‍ය ආයතන, පාර්ශ්වකරුවන් සහ ක්ෂේත්‍රයේ අභිලාෂිය පාර්ශ්වයන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සඳහා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය පුළුල් පියවර ගෙන ඇත. 2022 වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද ක්‍රියාකාරකම් සහ වැඩසටහන් පිළිබඳව ප්‍රචාරණය කිරීම තුළින් තව තවත් නාලිකා ආකර්ෂණය කර ගැනීමට සහ ධනාත්මක ප්‍රචාරයක් ලබා ගැනීමට සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය නිර්මාණාත්මක ප්‍රවේශයකට අවතීර්ණ වී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජනප්‍රියත්වය හා ධනාත්මක කීර්තිනාමය ඉහළ නැංවීම සඳහා බහු මාධ්‍ය භාවිතයෙන් ප්‍රවෘත්ති හා විශේෂාංග ලිපි නිර්මාණය කර සන්නිවේදනය කිරීම, ඉලක්කගත ප්‍රේක්ෂකයන් වෙත තොරතුරු බෙදා හැරීම, සාම්ප්‍රදායික සහ සමාජ මාධ්‍ය මෙහෙයුම් සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා කොට්ඨාශයේ ප්‍රමුඛ වැඩසටහන් හා කාර්යයන් මගින් අවධානය යොමු කර ඇත. මාධ්‍ය සංචාර, පිළිගැනීමේ උත්සව සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම, මාධ්‍ය නිවේදන, වීඩියෝ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය කිරීම, ඡායාරූප ඇල්බම සහ වෙනත් ඉදිරිපත් කිරීම් සැලසුම් කිරීම, සංස්කරණය කිරීම එළිදැක්වීම මගින් හා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ කටයුතු හා කාර්යසාධනය පිළිබඳව වාර්තා සකස් කිරීම මගින් මෙය ඉටු කර ඇත.

කාර්යය නිපුණතාවය, ඵලදායීතාවය සහ ක්‍රියාත්මකව පවතින හා අනාගත සංවර්ධන කටයුතු පිළිබඳව අවධාරණය කිරීම සඳහා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය පසුගිය වසර ගණනාව තුළ වාර්තා චිත්‍රපට ගණනාවක් නිෂ්පාදනය කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය නියෝජනය කරමින් සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය සහභාගී වූ අධ්‍යාපනික ප්‍රදර්ශන මගින් සමුද්‍රීය ක්ෂේත්‍රය සහ ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනයෙහි වැදගත්කම, ශ්‍රී ලංකාවේ වරාය ක්ෂේත්‍රයේ අනාගත රැකියා අවස්ථා සහ වරාය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවද විශේෂයෙන්ම සාමාන්‍ය ජනතාව හා පාසල් ප්‍රජාව දැනුවත් කර ඇත.

තවද, සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැදගත් අවස්ථා නව මාධ්‍ය මගින් විකාශය කිරීමේ කටයුතු වල ද නියැලී සිටී.

අභ්‍යන්තර විගණන කොට්ඨාශය

අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ කටයුතු විගණන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම මත පදනම් වූ වාර්ෂික විගණන සැලසුම මගින් මෙහෙයවනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ වෙත සෘජුවම වාර්තාකරණ ප්‍රධාන අභ්‍යන්තර විගණක, මෙම කොට්ඨාශයේ ප්‍රධානියා වේ.

ආයතනයේ අවදානම් කළමනාකරණය, පාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලින් කාර්යක්ෂම ලෙස සිදු වන බවට ස්වාධීන සහතිකයක් ලබා දීමේ කාර්යයේදී මෙම කොට්ඨාශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය අවදානමට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කීර්තිනාමය, වර්ධනය, පාරිසරික බලපෑම සහ පාර්ශ්වකරුවන් සමඟ සබඳතා වැනි පුළුල් කරුණු පිළිබඳව ද මෙම කොට්ඨාශය විසින් ඇගයීමට ලක් කරනු ලැබේ.

විගණන සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය තුළ ප්‍රශස්ත පාලන පරිසරයක් නිර්මාණය කරමින් අභ්‍යන්තර විගණන කොට්ඨාශය සිය සම්පත් හා කාලය කළමනාකරණය කරයි. ආයතනයේ අවදානම් කළමනාකරණය, පාලනය හා අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යන බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් දායක වේ.

- දෝෂ, මගහැරීම්, වංචා ආදියෙන් පැන නගිනු ලබන වැරදි ප්‍රකාශ වැළැක්වීම, අනාවරණය කර ගැනීම සහ නිවැරදි කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිසි ලෙස සැලසුම් කර ඇති බව තහවුරු කිරීම.

- නිවැරදි හා සාධාරණ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා භාවිතා කරනු ලබන ගිණුම්කරණ ක්‍රම මගින් අවශ්‍ය තොරතුරු ලබා දෙන බවට සහතික කරමින් ගිණුම්කරණ වාර්තාවල විශ්වාසනීයභාවය තහවුරු කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය තක්සේරු කර වැඩි දියුණු කිරීම.

- රාජකාරී හා වගකීම් ඉටු කිරීමේදී සේවකයින්ගේ කාර්යසාධනය ඇගයීම.

- සේවා ස්ථානවලින් බැහැරව සිට හසුවන සේවකයන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා වාර්තා කිරීම, අධිකාරිය තුළ එවැනි සිදුවීම් පාලනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දේපොළ හා වත්කම් අස්ථානගත වීම් සහ අලාභ හානි වීම් වළක්වමින් ඒවා නිසි හා කාර්යක්ෂම ලෙස යොදවා ඇති බවට තහවුරු කිරීම.

- ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි සහ චක්‍රලේඛ අනුකූලව කටයුතු සිදුවනවාද යන්න විමර්ශනය කිරීම.

- වාර්ෂික තොග හා වට්ටෝරු භාණ්ඩ සත්‍යාක්ෂණ කටයුතු වලදී නිරීක්ෂකයින් ලෙස සහභාගී වීමට, සියළුම වරායයන් තුළ නිසි තොග කළමනාකරණයක් පවත්වා ගෙන යාමට සහ භාවිතා නොවන හා අඩු භාවිතයෙන් යුත් තොග අයිතම හඳුනා ගැනීමට නිලධාරීන් මෙහෙයවීම.

- මුදල් හා සුළු මුදල් අග්‍රිමය පිළිබඳ හදිසි පරීක්ෂා කිරීම් සිදු කිරීම සහ විෂමතාවයන් වාර්තා කිරීම.

- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ හා චක්‍රලේඛ හා අනුකූලව විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට සහාය වීම සහ මෙම රැස්වීම් වලදී එළැඹෙන තීරණ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

- ඉහළ කළමනාකාරිත්වය හා විගණන කමිටුවේ ඉල්ලීම මත විශේෂ විමර්ශන පැවැත්වීම.

2023

මූල්‍ය සමාලෝචනය

ආදායම (සියළු වරායයන්)

ආදායම
(වරාය කටයුතු සාරාංශය)
(රු. මිලියන)

විස්තරය	2023	2022	විස්තරය	2023	2022
වරාය කටයුතු වලින් ආදායම	63,261	68,696	නාවික	21,146	18,396
වෙනත් ආදායම්	29,560	30,666	නැව් භාණ්ඩ වාහක මෙහෙයුම්	27,400	28,900
			වාප්පු මෙහෙයුම්	8,000	8,015
			වරාය පහසුකම්	4,445	9,250
			වෙනත් සේවා මෙහෙයුම්	2,849	3,848
				63,840	**68,408**
මුළු ආදායම	**92,821**	**99,362**	**විදේශ විනිමය ලැබීම් / (පාඩු)**	**(579)**	**288**
				63,261	**68,696**

මෙහෙයුම් සහ වෙනත් වියදම් (සියළු වරායයන්)

රු. මිලියන


විස්තරය	2023 වියදම	2022 වියදම	(වැඩිවීම්)/ අඩුවීම්	%
වත්කම් නඩත්තුව	2,879	1,853	(1,026)	(55)
ඉන්ධන, විදුලිය, සහ ජලය	6,522	5,760	(762)	(13)
විදේශ ණය මත පොලිය	4,218	2,400	(1,818)	(76)
අතිකාල	6,320	6,425	105	2
ක්ෂය සහ ක්‍රමක්ෂය	5,303	4,120	(1,183)	(29)
වේතන, වැටුප් සහ දීමනා	19,833	19,585	(248)	(1)
වෙනත්	6,081	6,096	(15)	0
වියදම	**51,156**	**46,239**	**(4,917)**	**(11)**
විදේශ විනිමය පාඩු / (ලැබීම්)	1,305	(3,903)	(5,208)	(133)
විදේශ විනිමය (පාඩු)/ ලාභ ඇතුළුව මුළු වියදම	**52,461**	**42,048**	**(10,125)**	**(24)**

වරායයන් අනුව කාර්යසාධනය

කොළඹ වරාය

2023 වර්ෂයේදී කොළඹ වරාය රුපියල් මිලියන 36,189 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. 2023 වර්ෂයේ මුළු ආදායම රුපියල් මිලියන 88,818 ක් වූ අතර මෙය පෙර වසරේ ආදායම වූ රුපියල් මිලියන 95,183 ට සාපේක්ෂව රුපියල් මිලියන 6,366 ක අඩු වීමකි.


2023 වසරේදී විදේශ විනිමය පාඩුව වූ රුපියල් මිලියන 1,449 ඇතුළුව බදු වලට පෙර මුළු වියදම රුපියල් මිලියන 50,270 ක් විය. විදේශ විනිමය ලැබීම් සඳහා වූ රුපියල් මිලියන 4,237 ක් ද ඇතුළත් වන 2022 වසර සඳහා වූ රුපියල් මිලියන 39,870 ක වියදමින් 26% ක වැඩි වීමක් මෙමඟින් නිරූපනය කෙරේ.



ගාල්ල වරාය

2023 වර්ෂයේදී ගාල්ල වරාය රුපියල් මිලියන 339 ක මෙහෙයුම් පාඩුවක් අත් විඳින ලදී. එනමුත්, පෙර වසරේ ආදායම වූ රුපියල් මිලියන 1,470 ට සාපේක්ෂව රුපියල් මිලියන 42 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් වසරේ මුළු ආදායම රුපියල් මිලියන 1,512 ක් විය.


2023 වර්ෂයේදී බදු වලට පෙර මුළු වියදම රුපියල් මිලියන 843 ක් වූ අතර එයට රුපියල් මිලියන 144 ක් වූ විදේශ විනිමය ලැබීම් ද ඇතුළත් විය. මෙය 2022 වසරේ වියදම වූ රුපියල් මිලියන 1,320 න් 36% ක කැපී පෙනෙන අඩු වීමක් පෙන්නුම් කළ අතර එයට රුපියල් මිලියන 335 ක විදේශ විනිමය ලැබීම් ද ඇතුළත් විය.



ත්‍රිකුණාමල වරාය

ත්‍රිකුණාමල වරාය 2023 වර්ෂයේදී රුපියල් මිලියන 479 ක මෙහෙයුම් ලාභයක් අත්කර ගන්නා ලදී. කෙසේ නමුත්, 2022 වසරේ රුපියල් මිලියන 2,709 ට සාපේක්ෂව වසර සඳහා වූ සමස්ත ආදායම රුපියල් මිලියන 2,491 ක් දක්වා අඩු වූ අතර මෙය රුපියල් මිලියන 218 ක අඩු වීමකි.

2023 වසරේ බදු වලට පෙර මුළු වියදම රුපියල් 1,348 ක් ලෙස පැවති අතර මෙය 2022 වසරේ වියදම වූ රුපියල් මිලියන 1,146 ට සාපේක්ෂව 18% ක වැඩි වීමක් පෙන්නුම් කරන ලද අතර මෙයට රුපියල් මිලියන 2 ක විදේශ විනිමය ලැබීම් ඇතුළත් විය.



මානව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් නිසියාකාරව පවත්වාගන යාමේදී මානව ප්‍රාග්ධනය මගින් ඉටු කරනු ලබන වැදගත් කාර්යභාරය නිරන්තරයෙන්ම ඇගයීමට ලක් කරනු ලබයි. අපගේ සේවකයන්ගේ කුසලතාවයන් ඔප්නැංවීමට ගනු ලබන ප්‍රයත්නයන් සමඟ ඇඳුනු සමෘද්ධිමත් සේවා පරිසරයක් තුළින් විවිධ හැකියාවෙන් යුතු මානව ප්‍රාග්ධනයක් බිහි කිරීමට ගන්නා අපගේ කැපවීම පිළිබිඹු කෙරෙන සාක්ෂියකි. අපගේ සාර්ථකත්වයට මධ්‍යය වී ඇත්තේ අපගේ තිරසර ක්‍රමෝපායේ මුල්ගල වන සේවකයාගේ අභිවෘද්ධිය කෙරෙහි යොමු කර ඇති නොසැලෙන අවධානයයි.

2023 වර්ෂය දෙසැම්බර් මාසය වන විට ශ්‍රී ලංකා වරාය අධිකරියේ ආසන්න සේවක සංඛ්‍යාව 8050 ක් වන බව වඩා සාඩම්බරයෙන් යුතුව සඳහන් කර සිටී. උපරිම ඵලදායීතාවය අත්කර ගැනීමට සේවකයින්ට හැකියාව ලබා දෙන ප්‍රශස්ථ මට්ටමේ මානව සම්පත් කාර්ය රාමුවක් ඇති කිරීමට අපි අපේක්ෂා කරමු. ක්ෂේත්‍ර ප්‍රමිතීන්ට සමාන්තර වන ආයතනික අවශ්‍යතාවයන්ගේ විස්තීර්ණ සමාලෝචනයක් මගින් සැලසුම් කළ සේවකයින් 6,687 ක අනුමත සේවක සංඛ්‍යාවක් පිළිගෙන අනුමත කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟපෙන්වනු ලැබ ඇත. තවද, වත්මන් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියේ පවතින අඩුපාඩු පිළිබඳ ගැටළුවට පිළියම් යොදමින් විධායක හා විධායක නොවන සේවකියන් දෙපාර්ශ්වය සඳහාම එකඟවිය හැකි සංශෝධිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් පිළියෙළ කරනු ලබමින් පවතී.

වර්ෂය තුළදී, විශ්‍රාම ගැන්වීමේ අනිවාර්යය වයසට එළඹීම හේතුකොටගෙන සේවකයින් 390 ක් විශ්‍රාම ගිය අතර දක්ෂතාපිරි පුද්ගලයින් 86 දෙනෙකු සේවය බඳවා ගන්නා ලදී. ස්ත්‍රී /පුරුෂ, ජාති, ආගම් බේද නොසලකා සියළුසම සේවකයින් අධිකාරියේ එක් මූලධර්මයක් වේ.

සේවක දුක්ගැනවිලි විසඳීම සඳහා සියළුම සේවකයින්ට ප්‍රවේශ විය හැකි ප්‍රතිපත්තියකින් අනුපූර්ණය වූ මානව සම්පත් කමිටුව සහ අභියාචනා කමිටුව පත් කරනු ලැබ ඇත. සේවකයින්ගට සිය දුක්ගැනවිලි පිළිබඳව කරුණු ඉදිරිපත් කර විසඳුම් ලබා ගැනීමට මෙම යාන්ත්‍රණය මගින් ප්‍රමාණවත් අවස්ථා සැලසී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනුම් කේන්ද්‍රය වන මහපොළ අභ්‍යාස ආයතනය, සේවකයින්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප ඔප් නැංවීම සඳහා සුවිශාල කාර්යභාරයක් ඉටු කරයි. වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ වැඩසටහන් සේවකයින්ගේ දැනුම සංවර්ධනය කිරීමට දායක වේ.

නොමිලේ ආහාර, නිවාස ණය පහසුකම්, අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදාන, සුභසාධක ප්‍රවාහන පහසුකම්, වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීම, නේවාසික වෛද්‍ය ප්‍රතිකාර, ක්‍රීඩා කටයුතු හා රක්ෂණ යෝජනා ක්‍රම ඇතුළු පහසුකම් රාශියක් ප්‍රදානය කිරීම මගින් සේවකයින්ගේ අගය කිරීමට කටයුතු කරමින් සිටී.

සේවකයින්ගේ සෞඛ්‍යය සහ ශාරීරක පැවැත්ම නිසි ලෙස පවත්වාගෙන යාමේ වගකීම වෛද්‍ය කොට්ඨාශය වෙත පැවරී ඇත. ක්‍රමානුකූල අධීක්ෂණය හා ප්‍රතිකාර ලබා දීම තුළින් අන්ධභාවය, අංශභාගය, වකුගඩු ආබාධ, ශරීරයේ ඔඩු දිවූ ගෙඩි ආදී බරපතල රෝගී තත්ත්වයන් වළක්වාලීම අරමුණු කෙරේ. එපමණක් නොව, සේවා ස්ථානවල සිදු වන අනතුරු වැළැක්වීමට සහ එමඟින් සිදුවන අලාභහානි අවම කිරීම සඳහා සේවකයින් මත්පැන් පානය කර සිටීද යන බව පරීක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

සේවක සුභසාධනයට ප්‍රමුඛතාවය දෙමින් සේවක සංවර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යන, සංස්කෘතිය සමානත්වයේ සහ සහයෝගයේ සංස්කෘතියක් නගාසිටුවන කාර්යක්ෂම සේවා ස්ථානයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැපවී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා අනු කමිටු

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබිය යුතුය. එනම්;

(අ) පුළුල් අත්දැකීම් ඇති වරාය මෙහෙයුම් සංවර්ධනය පිළිබඳව හෝ නෛතික හෝ මූල්‍ය කරුණු හෝ නාවික, වාණිජ හෝ ඉංජිනේරු කටයුතු හෝ පරිපාලනමය හෝ කම්කරු සබඳතා පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත සභාපතිවරයෙකු, උප සභාපතිවරයෙකු සහ තවත් අධ්‍යක්ෂවරු හතරදෙනෙකු (04) විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

(ආ) ප්‍රවීණ හා පළපුරුද්ද සහිත පුද්ගලයෙකු කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කළ යුතුය.

(ඇ) මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම සඳහා මහා භාණ්ඩාගාර නිලධාරියෙකු අධ්‍යක්ෂ මණ්ඩල නියෝජිතයා මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් වශයෙන් පත් කළ යුතුය.

(ඈ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(ඉ) ධීවර විෂය සඳහා නියෝජිතයෙකු ධීවර විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කළ යුතුය.

සමාලෝචනයට යටත් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ඔවුන්ගේ වෘත්තීය විස්තර පිටු අංක 18 සිට 24 දක්වා සඳහන් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රධාන වගකීම් වන්නේ:

- ක්‍රමෝපායික අරමුණු, ප්‍රතිපත්ති හා ඉලක්ක ස්ථාපනය කිරීම තුළින් මඟ පෙන්වීම.
- ඉල්ක්ක හා අරමුණු අරභයා සිදු කෙරෙන කාර්යසාධනය අධීක්ෂණය කිරීම.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන රටාවක් හා උපරිම ආචාර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාමට වගබලා ගැනීම.
- අරමුණු ඉටු කිරීම පිණිස මාර්ගෝපදේශ සකස් කර ඒවාහි කාලසීමාව තහවුරු කිරීම.
- සියළුම ප්‍රධාන ව්‍යාපාරික අවදානම් හඳුනා ගැනීම සහ ඒවා පිළිබඳව කටයුතු කිරීම සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පාලන, අධීක්ෂණ හා වාර්තාකරණ යාන්ත්‍රණ පවතින බවට තහවුරු කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරීත්වය පහත දැක්වෙන ආකාරයට වේ.

සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම සාමාජිකයින් සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙළ කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිතිපතා පවත්වනු ලබන අතර, සමාලෝචනයට යටත් වර්ෂය තුළ සාමාන්‍ය පරිදි පැවැත්වීමට නියමිත හා විශේෂ රැස්වීම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 17 ක් පවත්වනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත, අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ, පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ වල ප්‍රගති වාර්තාව, මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනයේ දර්ශක, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති හා යෝජනා ආදිය අතුළත් වන Board PAC නමින් පරිගණක යෙදවුමක් නිර්මාණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් තොරතුරු වෙත පිවිසීමේ අවස්ථාව ලැබේ.

අවසන් අනුමැතිය හා/හෝ නිර්දේශ ලබා දීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතැම් වගකීම් ප්‍රධාන වශයෙන් ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව (TLMC), විගණන කමිටුව හා අභ්‍යන්තර පාලන හා අවධානම් කළමනාකරණ කමිටුව වැනි අනු කමිටු ගණනාවක් වෙත විමධ්‍යගත කර ඇත.

ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව (TLMC)

ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුව එහි ලේකම් වශයෙන් කටයුතු කරන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ඇතුළුව සාමාජිකයින් දහ හතර (14) දෙනෙකුගෙන් සමන්විත වේ. එනම්;

(අ) සභාපති, උප සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකු (03).

(ආ) පූර්ණ කාලීන අධ්‍යක්ෂවරු එකොළොස් දෙනෙකු (11) එනම්;
- අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)
- අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (පරිපාලන/මානව සම්පත් කළමනාකරණ)
- අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ (තාක්ෂණ)
- අධ්‍යක්ෂ (මෙහෙයුම්)
- අධ්‍යක්ෂ (තාක්ෂණ)
- අධ්‍යක්ෂ (මුදල්)
- අධ්‍යක්ෂ (සංවර්ධන)
- අධ්‍යක්ෂ (අළෙවි)
- අධ්‍යක්ෂ (සේවා සැපයුම්/මානව සම්පත් හා පරිපාලන)
- අධ්‍යක්ෂ (ආරක්ෂක)
- හාබර් මාස්ටර්

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට පෙර මාසයකට එක් වරක් ඉහළ මට්ටමේ කළමනාකාර කමිටුවේ රැස්වීම් පැවැත්වේ. සමාලෝචනයට යටත් වර්ෂය තුළ මෙම රැස්වීම් දහසයක් (16) පැවැත්විණ.

ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවේ ප්‍රධාන කාර්යභාරය

(අ) ප්‍රතිපත්තිමය ගැටළු සම්බන්ධයෙන් අවසන් අනුමැතිය/ නිර්දේශ ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම ඒවා සමාලෝචනය කර සාකච්ඡා කිරීම.

(ආ) වරාය පරිශීලකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ සේවා තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා සම්පත් වල උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම, ඵලදායීතාවය ඉහළ දැමීමට අදාළ සාමාන්‍ය පරිපාලන හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම.

(ඇ) වාණිජමය වශයෙන් සාධ්‍ය ආයතනයක්ව පවතින අතරතුරදීම සාමාන්‍ය වගකීම් දරණ රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස කටයුතු කිරීමේ තීරණ ගැනීම.

1505 පෘතුගීසීන් විසින් නාවික කඳවුරක්/වරායක් ලෙස භාවිතයට ගැනීම ආරම්භ කිරීමෙන් පසුව කොළඹ වරාය අපරදිග රටවල ප්‍රසිද්ධියට පත්විය.

1875 VII එඩ්වඩ් රජු විසින් දෙසැම්බර් 09 වන දින නිරිත දිග දියකඩනයට මුල් ගල තබන ලදී.

1882 කොළඹ වරාය පරිපාලනය කිරීම සඳහා වරාය මණ්ඩලය පිහිටුවන ලදී.

1885 මීටර් 1285 ක් දිග නිරිත දිග දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1898 මීටර් 335 ක් දිග ඊසාන දිග දියකඩනයේ ඉදිකිරීම නිම කරන ලදී.

1899 වියළි තටාකාංගයේ ඉදිකිරීම් ආරම්භ කිරීම.

1906 මීටර් 814 ක් දිග අයිලන්ඩ් දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1906 වියළි තටාකාංගනයේ ඉදිකිරීම නිම කිරීම.

1909 වියළි තටාකාංගය සඳහා මීටර් 250 ක් දිග නියමු පාලම ඉදිකර නිමකිරීම (පළමු වැනි ගැඹුරු දිය අද්දර නැංගුරම් පොළ).

1912 වත්මන් ජයබහළු පර්යන්තය පිහිටි ස්ථානයේ ගල් අඟුරු ජැටි 18 ක් ඉදිකර නිමකිරීම.

1912 නිරිත දිග දිය කඩනයේ මීටර් 550 ක් දිග දිගුව ඉදිකර නිමකිරීම.

1913 වරාය සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභාව පිහිටුවීම.

1922 ඛනිජ තෙල් මෙහෙයුම් පහසුකම් සැලසීමේ කාර්යය නිම කිරීම.

1950 මීටර් 9-11 දියඹක් සහිත අද්දර නැංගුරම්පළවල් පහළොවක් සහ මීටර් 7.5 ක දියඹක් සහිත වෙරළාසන්න යාත්‍රා නැංගුරම් පොළවල් දෙකක්ද, වර්ග මීටර 55.800ක යාබද මාර්ගස්ථ බඩු ගබඩා සහ ගුදම් ඉඩ පහසුකම් ඉදිකිරීම ආරම්භ කිරීම.

1954 නිරිතදිග දිය කඩනයෙහි ඉදිකර නිමකළ අද්දර නැංගුරම්පළවල් II වැනි එළිසබෙත් මහ රැජිණ විසින් විවෘත කිරීම සහ එය ‘‘එළිසබෙත් රැජින ජැටිය’’ යනුවෙන් නම් කිරීම. (‘‘ගොතික්’’ රාජකීය රුවල් යාත්‍රාව එළිසබෙත් රැජිණ ජැටියෙහි නැංගුරම් ලෑ පළමු යාත්‍රාව විය)

1956 අද්දර නැංගුම්පළවල් 17 ක්, මාර්ගස්ථ බඩු ගබඩා හා ගුදම් තනා නිම කිරීම.

1958 කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කර වරාය (නැව්බඩු) සංස්ථාව පිහිටුවීම.

1964 ගාලු වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1967 වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව පිහිටුවීම.

1967 ත්‍රිකුණාමලය වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1979 කොළඹ වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංස්ථාව සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීම.

1980 කොළඹ වරාය සඳහා ප්‍රධාන සැලැස්ම ජපන් රජයේ සහයෝගය ඇතිව පිළියෙළ කිරීම.

1980 එළිසබෙත් රැජිණ ජැටියේ නව පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

1982 පළමු වැනි ග්‍රැන්ට් දොඹකරය - ටැන්ගෝ 80 සේවය සඳහා යෙදවීම.

1982 නව බහළු පර්යන්ත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ජපානයේ පෙන්ටා ඕෂන් වකවිකු ඒකාබද්ධ සමාගම සමඟ අත්සන් කිරීම.

1983 සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ I වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

1984 සම්පූර්ණ උපකරණ සහිත අංග සම්පූර්ණ බහළු පර්යන්තයේ II වැනි අදියරෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

1984 එළිසබෙත් රැජිණ ජැටියේ බහළු නැංගුරම්පොළෙහි ‘‘හිටාචි’’ හුවමාරු දොඹකර හතරක් (04) සේවය සඳහා යොදා ගැනීම.

1985 ජයබහළු පර්යන්තයේ 1 වැනි අදියර උත්සවාකාරයෙන් විවෘත කිරීම.

1987 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කිරීම.

1987 ජයබහළු පර්යන්තයේ II වැනි අදියර විවෘත කිරීම.

1988 වෙරළෙන් ඔබ්බෙහි ඒක ලක්ෂිත බෝයා නැංගුරම්පළ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.

1994 නව වරාය ප්‍රවේශ මාර්ගය තනා නිම කිරීම.

1995 ජයබහළු පර්යන්තයේ III වැනි අදියර විවෘත කිරීම.

1996 ජයබහළු පර්යන්තයේ IV වැනි අදියර විවෘත කිරීම.

1998 සමඟි බහළු පර්යන්තය ආරම්භ කිරීම.

1998 අනුබද්ධිත වරාය සමුළුව පැවැත්වීම.

1999 නැගෙනහිර වෙරළ තීරයෙහි ඔලුවිල් ප්‍රදීපාගාරය ක්‍රියාත්මක කිරීම සහ ඔලුවිල් සමුද්‍රීය අභ්‍යාස පුහුණු ආයතනය විවෘත කිරීම.

1999 රැජිණ බහළු පර්යන්තයේ සවුත් ඒෂියා ගේට්වේ ටර්නමිල් (SAGT) සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

1999 ත්‍රිකුණාමල වරායේ අද්දර නැංගුරම්පළ ව්‍යාපෘතියේ ඉදිකිරීම ආරම්භ කිරීම.

2000 දකුණු කොළඹ වරාය ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කිරීම.

2000 ගාලු වරායේ නව නැංගුරම්පොළක් ආරම්භ කිරීම.

2000 පෑලියගොඩ බහළු නැව්බඩු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2000 කළාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම.

2000 උතුරු පාලම සංවර්ධන ව්‍යාපෘතියෙහි II වැනි අදියර ආරම්භ කිරීම.

2000 තනි-නැවතුම් ලේඛණ කටයුතු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2001 ගාලු වරායේ නව ජැටිය ආරම්භ කිරීම.

2003 ඔලුවිල් වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ආරම්භ කිරීම.

2003 අර්ධ පූර්ණ බහළු (LCL) සහ තොග-කඩන නැව්බඩු සඳහා ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

2003 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමුද්‍රීය කෞතුකාගාරය විවෘත කිරීම.

2003 සිවිල් වැඩ කටයුතු සම්පූර්ණ වීමත් සමඟ සමඟි බහළු පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2004 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 25 වන සංවත්සරික උත්සවය පැවැත්වීම.

2004 මහා පරිමාණ සේවා අංශයේ ජාතික ඵලදායීතා සම්මානය ජයබහළු පර්යන්තය විසින් දිනා ගැනීම.

2004 කොළඹ වරායේ බහළු දසලක්ෂ 2 ක් (මිලියන 02 ක්) මෙහෙයවීම.

2005 ඔලුවිල්හි වරාය හා නිවාස යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

2005 මධ්‍යම පරිමාණ සේවා අංශය යටතේ කුසලතා සහතිකයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය වෙත ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කිරීම.

2006 කොළඹ වරායේ බහළු ආරක්ෂක උපනයනයන් සහ මෙගා පෝර්ට් උපනයනයන් ක්‍රියාත්මක කිරීම.

2006 කොළඹ දකුණු වරාය ඉදිකිරීම සඳහා යෝජිත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

2006 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි අදියර I සඳහා විස්තරාත්මක සැලසුම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

2007 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම හා මූල්‍ය ගිවිසුම අත්සන් කිරීම.

2008 ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම.

2008 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරිම් කටයුතු ආරම්භ වීම.

2008 හම්බන්තොට වරායෙහි නැව් තෙල් සැපයීමේ පහසුකම් සැලසීම සඳහා සහ තෙල් ටැංකි සංකීර්ණය ඉදිකිරිම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරිම.

2009 හම්බන්තොට වරායේ නැව්තෙල් සැපයීමේ පහසුකම හා තෙල් ටැංකි ව්‍යාපෘතිය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

2009 ජයබහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය "NAVIS" පද්ධතිය දක්වා වර්ධනය කිරිම.

2010 2010.08.15 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ වරාය ද්‍රෝණියට මුහුදු ජලය පිරවීමේ උත්සවය.

2010 2010.11.18 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය උත්සවාකාරයෙන් විවෘත කිරිම.

2010 ජයබහළු පර්යන්තයේ බහළු මිලියන 02 ක් මෙහෙයුම් කිරීම.

2010 කොළඹ වරායේ බහළු මිලියන 04 ක් මෙහෙයුම් කිරීම.

2011 නව ග්‍රෑන්ටි දොඹකර 06 ක් සහ හුවමාරු දොඹකර 30 ක් වරායට ගෙන ඒම.

2011 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ පිහිටි තෙල් පර්යන්තයේ ධාරිතාවය වැඩිකිරීම.

2011 පර්යන්ත ට්‍රැක්ටර් 50 ක් වරායේ සේවය සඳහා යෙදවීම.

2011 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සඳහා ගිවිසුම අත්සන් කිරීම.

2011 නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2011 දකුණු බහළු පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2012 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ රෝ - රෝ නෞකා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

2012 බිලුමැන්ඩල් තෙල් ටැංකි සංකීර්ණයේ සිට කොළඹ වරාය දක්වා වූ ඉතා අබලන් තත්ත්වයේ පවතින ඉන්ධන නළ මාර්ගය නැවත එලීම.

2013 කිලෝ මීටර් 6.8 අතිවිශාල දියකඩනය සහ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමඟ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 ඔලුවිල් වරාය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 නැව්බඩු කළමනාකරණ පද්ධතියේ ආනයන පූර්ණ බහළු පැටවුම් මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

2013 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පරිපාලන ගොඩනැගිල්ල උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ නැව් තෙල් සැපයීමේ පහසුකම් සහ තෙල් ටැංකි සංකීර්ණය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

2015 නැගෙනහිර බහළු පර්යන්තය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2015 තත්ත්ව කළමනාකරන පද්ධතිය සඳහා ISO 9001 – 2008 තත්ත්ව සහතිකය ලබා ගැනීම.

2015 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය දෙවන අදියරෙහි වරාය ද්‍රෝණියේ කරදියවර පිරවීමේ මංගල්‍යය පැවැත්වීම.

2015 කොළඹ වරාය තුල බහළු විස්සේ සම ඒකක මිලියන 05 මෙහෙයවීම.

2016 CFS 1මෙහෙයුම් මධ්‍යස්ථානය ප්‍රති ස්ථාපිත කිරීම. (2016.08.10)

2016 යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය මගින් ජයබහළු පර්යන්තයේ උසින් අඩු නව ට්‍රෙලරයක් නිෂ්පාදනය කිරීම. (2016.08.31)

2016 විශාලතම බහළු නෞකාව වන MSC Maya කොළඹ වරායේ, කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය වෙත පැමිණීම. (2016.09.16)

2017 පූර්ණ වශයෙන් නැවත ඉදි කරන ලද බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේ 01-(CFS-01) මෙහෙයුම් ආරම්භ කිරීම (2017.05.31).

2017 හම්බන්තොට වරායේ වරාය මෙහෙයුම් සඳහා චීනය සහ ශ්‍රී ලංකාව අතර සහන ගිවිසුම අත්සන් කිරීම (2017.07.29).

2017 19 වැනි Internaltional Network of Affliated Ports (INAP) සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනුග්‍රහය දැක්වීම. (2017.11.07-08).

2017 හම්බන්තොට වරායේ කොටස්කරුවන්ගේ ගිවිසුම (Shareholders Agreement) සහ ඉඩම බදු දීමේ ගිවිසුම (Land Lease Agreeement) අත්සන් කිරීම (2017.12.08).

2017 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් සමාගම අතර හම්බන්තොට වරාය සහන ගිවිසුම යටතේ පළමු ගෙවීම සිදු කිරීම (2017.12.09).

2017 කොළඹ වරාය විසින් විස්සේ සම ඒකක මිලියන 06 ක් මෙහෙයවීම (2017.12.20).

2018 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සී/ස චයිනා මර්චන්ටස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කරගත් හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ 02 වන ගෙවීම උත්පාදනය කිරීම.

2018 කොළඹ වරාය සාමූහිකව සංවර්ධනය කිරීම සඳහා සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අවබෝධතා ගිවිසුමකට එළඹීම.

2018 2018 වසරේ හොඳම වරායට හිමි සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෝලීය වරාය සංසදයේදී (Global Ports Forum) දිනා ගැනීම.

2018 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට්ස් පෝට් හෝල්ඩිංග්ස් සමාගම අතර ඇති කර ගන්නා ලද හම්බන්තොට වරාය අනුග්‍රාහක ගිවිසුම යටතේ ගෙවිය යුතු අවසන් කොටස (last tranche) උත්පාදනය කිරීම.

2018 කොළඹ වරාය විසින් ප්‍රථම වරට පවත්වන ලද " Colombo Port Award Night" සම්මාන ප්‍රදානෝත්සව රාත්‍රිය සංවිධානය කිරීම.

2018 2018 වසරේ පළමු භාගයේදී ලෝකයේ වැඩිම බහළු ප්‍රමාණයක් මෙහෙයවන වරාය ලෙස කොළඹ වරාය ශ්‍රේණිගත කිරීම - ඇල්ෆාලයිනර් ශ්‍රේණිගත කිරීමට අනුව.

2018 කොළඹ වරාය විස්සේ සම ඒකක මිලියන 7ක් මෙහෙයවීමට සමත්වීම.

2019 ගෝලීය වරාය සංසදය විසින් පවත්වන ලද සම්මාන උළෙලේදී "2019 වසරේ වරාය අධිකාරිය" ට හිමි සම්මානය දෙවන වරටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජයග්‍රහණය කිරීම.

පසු පැවරුම් මගින් සමූහයේ ලාභයේ හෝ පාඩුවේ කොටස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගන්නා අතර ආදායමෙහි පසු පැවරුම් කොටස්හි යෙදවුම් ආයෝජනයේ ධාරණ අගයට කරන අනුරූපී ගැලපුම් සහිතව වෙනත් විස්තීර්ණ ආදායම් මගින් හඳුනාගනු ලැබේ.

ආශ්‍රිත සමාගමේ ආයෝජනය හානිකරණය වී ඇත්ද යන බව සනාථ වන විෂයානුබද්ධ සාක්ෂි තිබේ ද යන්න, සමූහය විසින් සෑම වාර්තා කරන දිනයකදීම නිශ්චය කරනු ලබයි. එසේ වී ඇත්නම් හානිකරණ අගය ආශ්‍රිත සමාගමෙන් ලැබිය යුතු මුදලේ සහ එහි ධාරණ අගය අතර පවතින වෙනස

ලෙස සමූහය විසින් ගණනය කරන අතර, එම මුදල් ආශ්‍රිත සමාගමෙහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආසන්න ලාභ/(පාඩු) කොටස වශයෙන් හඳුනාගනු ලැබේ

2.4 විදේශ මුදල් පරිවර්තනය

2.4.1 ව්‍යවහාරික මුදල් හා ඉදිරිපත් කරන මුදල්

සමූහයේ එක් එක් ඒකක වල මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වන ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ එම ඒකකය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාරයේ පවතින මුදල් වර්ගය භාවිතා කරමිනි. ඒකාබද්ධ මුදල් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ සමූහය ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.4.2 ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් මගින් කෙරෙන ගනුදෙනු, ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කරනු ලබන්නේ ගණුදෙනු සිදු කරන දිනයන්හි පවත්නා විනිමය අනුපාතය භාවිතා කරමිනි. මෙවැනි ගණුදෙනු පියවීමේ ප්‍රතිඵලයක් ලෙස හා විදේශ මුදල් මගින් දක්වන වර්ෂාවසාන මූල්‍ය විදේශ විනිමය ලාභ සහ පාඩු, විදේශ මුදල් ඒකක වත්කම් සහ වගකීම් වලින් විනිමය අනුපාත පරිවර්තනය සවිස්තරාත්මකව ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනු ලැබේ.

ක්‍රමක්ෂ පිරිවැය විචල්‍යතාවයට අදාළ පරිවර්තන වෙනස්කම් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගනු ලැබේ.

2.5 දේපල, පිරියත සහ උපකරණ

2.5.1 අදාළ දෙපාර්තමේන්තු විසින් වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කිරීමෙන් පසු නොනිමි වැඩ ගිණුම් වල පවතින පිරිවැය ප්‍රාග්ධනීත කරනු ලැබේ.

2.5.2 සමූහයේ කළමනාකාරිත්වය නිගමනය කරන පරිදි මෙහෙයුම් කිරීම සඳහා වත්කම් ස්ථානගත කිරීමට දරණ පිරිවැයක් ඇත්නම් එයද ඇතුළත් කර දේපළ, පිරියත හා උපකරණ මූලිකව පිරිවැයට ඇතුළත් කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසුවය. වෙනත් දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසුවය.

පසුකාලීන පිරිවැය වත්කම්හි ධාරණ අගයෙහි ඇතුළත් කිරීම හෝ වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම වත්කම හා බැඳුනු ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ලැබී වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කිරීමට හැකියාව ඇතිවීමෙන් පසුව පමණි. අනෙකුත් සියළු අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඒවා වැය කරන මූල්‍ය වර්ෂය තුළ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

ඉඩම්වල අගය ක්ෂය නොකෙරේ. අනෙකුත් වත්කම් වල ක්ෂය ගණනය කරනු ලබන්නේ සරල රේඛීය ක්‍රමය මගින් ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය මත ප්‍රතිපාදන සැලසීම සඳහා අනෙකුත් වත්කම් වන ක්ෂය සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ.

වත්කම් කාණ්ඩය		ප්‍රතිශතය
මෙහෙයුම් ගොඩනැඟිලි හා ව්‍යුහ	වසර 2 – 115 දක්වා	0.86% - 50%
පාවෙන උපකරණ	වසර 1 – 22 දක්වා	4.5% - 100%
මෙහෙයුම් උපකරණ	වසර 2 - 23 දක්වා	4% - 50%
යන්ත්‍ර හා උපකරණ	වසර 1 – 25 දක්වා	5% - 100%
කාර්යාල හා සුභසාධක ගොඩනැඟිලි	වසර 2 – 73 දක්වා	1.36% - 50%
පරිගණක උපාංග	වසර 1 – 15 දක්වා	6.6% - 100%
මෝටර් රථ	වසර 1 – 15 දක්වා	5.5% - 100%
විදුලි හා විද්‍යුත් උපකරණ	වසර 1 – 12 දක්වා	8.33% - 100%
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	වසර 1 – 15 දක්වා	6.6% - 100%
සේවක නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි	වසර 13 – 43 දක්වා	2.32% - 7.69%
වෙනත් වත්කම්	වසර 1 – 20 දක්වා	5% - 100%

වත්කමක ධාරණ අගය, එහි ප්‍රතිලාභය ඇස්තමේන්තුගත අගයට වඩා වැඩි නම් එම වත්කමේ ධාරණ අගය එහි ඇස්තමේන්තුගත ප්‍රතිලාභ්‍ය අගයට ලියා තබනු ලැබේ..

නොනිමි වැඩ ප්‍රතිපත්තිය වන්නේ "අදාළ දෙපාර්තමේන්තුව විසින් වැඩ නිම කිරීමේ සහතිකය නිකුත් කල පසු නොනිමි වැඩ ගිණුමේ පවතින පිරිවැය ප්‍රාග්ධනිත කිරීමයි".

2.5.3 අස්පෘශ්‍ය වත්කම්

ලබාගෙන ඇති පරිගණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති ප්‍රාග්ධනිත කරනු ලබන්නේ ඒවා සපයා ගැනීමට වැය කල පිරිවැය හා අදාළ මෘදුකාංග හා පද්ධති භාවිතා කිරීමට පදනම් වූ හේතුව පදනම් කරගෙනය. පසුකාලීනව ලබා ගන්නා අස්පෘශ්‍ය වත්කම් සටහන් කරනු ලබන්නේ ඒවාහි සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩුකිරීමෙන් පසුව සහ පිරිවැයටය. එම වත්කම් වල ඇස්තමේන්තුගත ජීව කාලය ඉක්මවා පහත දැක්වෙන පරිදි ක්‍රමක්ෂය කෙරේ.

පරිගණක මෘදුකාංග	වසර 1 – 17 දක්වා	5.88% - 100%

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය, යෙදවූ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

2.5.4 ආයෝජන දේපළ

කුලී අයකිරීම මගින් ආදායම් ඉපැයීම සඳහා යොදවන ආයෝජන දේපල, මූලිකව පිරිවැයට ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, 2011 දෙසැම්බර් 31 දිනට පෙර පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ප්‍රත්‍යාගණනය කරන ලද අගයට ආයෝජන දේපළ පවත්වාගෙන යන ලදී. ආයෝජන දේපලවල විකුණුම් අගය සාධාරණ අගයට පුළුල්ව සැසඳුන බැවින්, ආයෝජන දේපල වල ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම ප්‍රත්‍යාගණනය කල දිනට උපකල්පිත පිරිවැයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ආයෝජන දේපල සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු සමුච්චිත හානිකරණ තුළින් පැන නගින

අදේශිත පිරිවැයක් වශයෙනි. ඉන් අනතුරුව අනෙකුත් ආයෝජන දේපළ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩුකළ පිරිවැයක් ලෙස ඇතුළත් කර ඇත.

ඉඩම්වල ක්ෂය ගණනය කරනු නොලැබේ. ගොඩනැගිලි වල ක්ෂය අස්තමේන්තුගත පිරිවැයට හෝ උපකල්පිත පිරිවැයට ප්‍රතිපාදන සැලසීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරනමින් පහත දැක්වෙන ආකාරයෙන් ගණනය කරනු ලැබේ.

ආයෝජන දේපළ	වසර 05 - 100	11% - 20%

2.5.5 වත්කම් සමාලෝචනය කිරීමේ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි අංක 51 දරණ ඡේදයට අනුව (දේපළ, පිරියත හා උපකරණ) "වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී හෝ සමාලෝචනය කළ යුතු වේ" ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ වටිනාකම සමාලෝචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය නැවත සමාලෝචනය කරන අතර, සමාලෝචනය කරන ලද ආයුකාලය පදනම් කරගෙන වත්කම මිලදී ගත් දින සිට ආයතනය මගින් ක්ෂය වීම් ගණනය කළේ නම්, මූල්‍ය වර්ෂය අවසාන දිනට පැවතිය යුතු වත්කමේ මුළු සමුච්චිත ක්ෂය සහ දැනට පවතින මුළු සමුච්චිත ක්ෂය අතර වෙනස ස්කන්ධය වෙනස් වීම යටතේ ගලපනු ලබයි.

2.5.6 කල්බදු වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (කල්බදු) ප්‍රකාරව, කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී, කොන්ත්‍රාත්තුව කල්බදු වත්කමක් ද එසේ නොමැතිනම් එයට කල්බදු වත්කමක් ඇතුළත් වන්නේද යන්න පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තක්සේරුවක් කරනු ලැබේ. ගිවිසුමෙහි කිසියම් කාලසීමාවක් සඳහා භුදුනාගත් වත්කමක් පාලනය කිරීමේ අයිතියක් දැක්වෙන්නේනම් එය කල්බදු වත්කමක් ලෙස සලකනු ලැබේ. කොන්ත්‍රාත්තුවෙහි නියමයන් හා කොන්දේසි වෙනස් වේ නම් පමණක් කොන්ත්‍රාත්තුව කල්බදු වත්කමක්ද, එසේ නොමැතිනම් එහි කල්බදු වත්කමක් ඇතුළත් වේද යන බව හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එය ප්‍රති තක්සේරු කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ බදු ගැණුම්කරු ලෙස සමූහය

කල්බදු ගිවිසුමක් ආරම්භයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එම වත්කමෙහි භාවිත අයිතියක් හා කල්බදු වගකීමක් පවතීද යන්න හඳුනාගනු ලබයි. භාවිත අයිතිය ඇති වත්කම මූලිකව එහි මූලික වගකීම් තක්සේරුව, ලබාගත් බදු දීමනාව හැර ආරම්භක දිනයේදී හෝ ඊට ප්‍රථම කල ගෙවීම්, බදු ගැනුම්කරු විසින් වැය කරන ලද සෘජු වියදම් හා පිරිවැය, වට්ටෝරු භාණ්ඩ ලේඛන නිපැයීමට නොගන්නේනම් වත්කම දේපළ විභේදනය කර ඉවත් කිරීම සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කල මුදල ඇතුළත් පිරිවැයට ගණනය කරනු ලැබේ.

ආරම්භක දිනයේදී බදු ගැනුම්කරුවකු බදු වගකීම එදිනට නොගෙවන කල්බදු ගෙවීම් වත්මන් වටිනාකමට තක්සේරු කල යුතුය. තක්සේරු අනුපාතය කෂ්ණිකව තීරණය කල හැකි නම්, කල්බදුයේ සඳහන් පොලී අනුපාතය භාවිතා කරමින් කල්බදු ගෙවීම් වට්ටම් කල යුතුය. අනුපාතය ක්ෂණිකව තීරණය කල නොහැකි නම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි ණය ගැණුම් වර්ධක අනුපාතය භාවිතා කරයි.

වත්කම් භාවිත අයිතිය හා එහි කල්බදු වගකීම පිළිබඳ පසු තක්සේරුව

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 ට අනුව, වත්කම් පිරිවැය අඩු කිරීමෙන් පසු සමුච්චිත තක්සේරු පිරිවැය ආකෘතිය අදාළ කරගනිමින් වත්කම් භාවිත අයිතිය තක්සේරු කිරීමද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ට අනුව දේපළ, පිරියත හා උපකරණ හා ඒවාහි සමුච්චිත හානිකරණ ආලභ තක්සේරු කිරීම හා කල්බදු වගකීම් වල ප්‍රති තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ගැලපුම් ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉන් පසුව, ගිණුම් වල විශේෂයෙන් සඳහන් කර ඇති ප්‍රතිගණනය කිරීමක් හෝ බදු විකරණයක් කර ඇත්නම් ඒවා ප්‍රතිවර්තනය කිරීමට හෝ ප්‍රතිශෝධිත ස්ථාවර කල්බදු කුලිය ගෙවීම් ප්‍රතිවර්තනය කිරීමට බදු වගකීම් මත ලැබෙන පොලිය ප්‍රතිවර්තනය කිරීමට බදු වගකීම් මත ලැබෙන පොලිය ප්‍රතිවර්තනය කිරීම සඳහා ධාරණ අගය වැඩි කිරීම මගින් සහ ගෙවන ලද කල්බදු ගෙවීම් ප්‍රතිවර්තනය කිරීම සඳහා ධාරණ අගය අඩු කරමින් කල්බදු වගකීම් තක්සේරු කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය බදු දීමනාකරු ලෙස

කල්බදු ගිවිසුම මෙහෙයුම් කල්බදුකරයක් ලෙස වර්ගීකරණය නොකරන්නේ නම් එමෙන්ම උපකල්පිත වත්කමක අවදානම් හා ප්‍රතිලාභ හිමිකාරීත්වයට පැවරේනම් කොන්ත්‍රාත්තුව ආරම්භයේදී උපකල්පිත අගය මූල්‍ය කල්බදුකරයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වර්ගීකරණය කරයි. එවැනි වර්ගීකරණයක් රඳා පවතිනුයේ කාර්යයේ ද්‍රව්‍යය මත මිස කොන්ත්‍රාත්තුවේ ස්වභාවය මත නොවේ. බදු විකරණයක් ඇත්නම් පමණක් බදු වර්ගීකරණය පසුව ප්‍රතිගණනය කරනු ලැබේ.

මූල්‍ය කල්බදු

ආරම්භක දිනයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය කල්බදු යටතේ පවත්වාගෙන යන වත්කම් හඳුනාගෙන ඒවා කල්බදුකරයේ ශුද්ධ අයෝජනයට සමාන ලැබිය යුතු මුදලක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ. කල්බදුයේ අන්තර්ගත අනුපාතිකය කල්බදුයේ ශුද්ධ ආයෝජනය තක්සේරු කිරීමට භාවිතා කරනු ලැබේ.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කල්බදුකරයේ පවතින ශුද්ධ ආයෝජන මත ලැබෙන නිත්‍ය කාලානුරූපී ආදායම් අනුපාතිකයක් ප්‍රතිවර්තනය වන රටාවක් පදනම් කරගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය කල්බදු කාලපරිච්ඡේදය මත ලැබෙන මූල්‍ය ආදායම හඳුනාගනී. කල්බදුකරයේ කාලීන මූල්‍ය අදායම ක්‍රමවත් හා ප්‍රමාණුකූල පදනමක් මත වෙන්කර, ආයෝජිත මුල් මුදල හා නොඉපැයූ මූල්‍ය ආදායම අඩු කිරීමට කල්බදුකරයේ දළ ආයෝජනයේ කාලය සඳහා ගෙවීම් කිරීමට අදාළ කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි දැක්වෙන හඳුනාගැනීම් අත්හැරීමේ හා හානිකරණ අවශ්‍යතා කල්බදුකරයේ ශුද්ධ ආයෝජනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ කර ගනී.

මෙම පිරිවැය පහත පරිදි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

කල්බදු මෝටර් රථය	අවු 8 – 15	6.66% - 12%

මෙහෙයුම් කල්බදු

මෙහෙයුම් කල්බදු සඳහා ගෙවිය යුතු කල්බදු ගෙවීම් සෘජු රේඛීය පදනම මත ලැබෙන ආදායමක් ලෙස හෝ වෙනත් විධිමත් ආකාරයට එනම්, පාදක වත්කම් භාවිතයෙන් ලැබෙන ප්‍රතිලාභ වල අඩු වීම මෙම පදනමින් පෙන්නුම් කරන්නේ නම් හෝ ඒවා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුනාගනු ලැබේ. ක්ෂය වීම ඇතුළුව කල්බදු ආදායම ඉපැයීමේදී වැය වන ඕනෑම පිරිවැයක් වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. මෙහෙයුම් කල්බදු ලබා ගැනීමේදී වැය වන ඕනෑම මූලික ඍජු පිරිවැයක් පාදක වත්කමේ ධාරණ අගයට එකතු කරනු ලබන අතර කල්බදු ආදායම් පදනම මත කල්බදු කාලසීමාව පුරා දිවෙන වියදම් ලෙස මෙම පිරිවැය හඳුනාගනු ලැබේ.

මෙහෙයුම් කල්බදු වලට යටත් ක්ෂය විය හැකි පාදක වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඒ හා සමාන වෙනත් සාමාන්‍ය ක්ෂය ප්‍රතිපත්ති වලට සමානුයෝග වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුව ක්ෂය ගණනය කර මෙහෙයුම් බදුකරයකට යටත් පාදක වත්කමක් හානිකරණය වී ඇත්ද යන්න තීරණය කිරීමට සහ හානිකරණ ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 අදාළ කර ගනු ලැබේ.

2.5.7 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය

සෑම ගිණුම් වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදී, සමූහයේ වත්කම් හානිකරණය වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත හා උපකරණ, ආයෝජන දේපළ වල සහ අස්පෘෂ්‍ය වත්කම් වල ධාරණ අගය සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. හානිකරණයක් සිදු වී ඇත්නම්, හානිකරණ අලාභයේ (ඇත්නම්) ප්‍රමාණය තීරණය කිරීම සඳහා වත්කමේ ප්‍රතිලාභ්‍ය අගය ඇස්තමේන්තු කරනු ලැබේ. තනි වත්කමක ප්‍රතිලාභ්‍ය මුදල ඇස්තමේන්තු කිරීමට නොහැකි වේ නම්, සමූහය විසින් මුදල් ජනන ඒකකය නිශ්චය කර වත්කම අයත් වන මුදල් ජනන ඒකකයේ ප්‍රතිලාභ්‍ය අගය ඇස්තමේන්තුගත කරනු ලැබේ.

ප්‍රතිලාභ්‍ය වටිනාමක යනු වත්කමේ සාධාරණ අගයෙන් ඇස්තමේන්තුගත විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන අගයත් වත්කම භාවිතා කිරීමෙන් ලැබෙන අගයහිත් වැඩි අගය වේ. වත්කම භාවිතයෙන් ලැබෙන අගය තක්සේරු කිරීමේදී, අනාගතයෙහි ජනනය වන ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය ගණනය කිරීම සඳහා බදු අඩු කිරීමට පෙර වට්ටම් අනුපාතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කර, වත්කම භාවිතයෙන් ලැබෙන අගය තක්සේරු කරනු ලැබේ. වත්කම භාවිතයෙන් ලැබෙන අගය තක්සේරු කිරීමේදී වර්තමාන තත්ත්වය පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරන අතර, අනාගතයෙහි ඇති වන්නා වූ අවදානම් සැලකිල්ලට නොගනී.

වත්කමක ප්‍රතිලාභ්‍ය මුදල (මූල්‍ය උත්පාදන ඒකකය) එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇස්තමේන්තුගත කර ඇත්නම් වත්කමේ ධාරණ අගය (මූල්‍ය උත්පාදන ඒකකය) අයකර ගත හැකි අගය දක්වා අඩු කෙරේ. හානිකරණ පාඩුවක්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් ක්ෂණිකව හඳුනාගනු ලැබේ.

2.6 මූල්‍ය වත්කම්

2.6.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය සිය මූල්‍ය වත්කම් පහත සඳහන් ගණනය කිරීමේ කාණ්ඩ යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

- ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරන මූල්‍ය වත්කම්
- වෙනත් විස්තීරණ ආදායම මත සාධාරණ අගයට තක්සේරු කරන මූල්‍ය වත්කම්
- ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට තක්සේරු කරන මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් කළමනාරණය හා මූල්‍ය ප්‍රවාහයේ ගිවිසුම් ප්‍රකාර කොන්දේසි මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහයේ ව්‍යාපාර ආකෘතිය වර්ගීකරණය මත රඳා පවතී.

සාධාරණ අගය මත තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කම්, ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හෝ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශන වල වාර්තා කරනු ලැබේ. විකිණීම සඳහා නොවන ස්කන්ධ උපකරණ මත කරන ආයෝජන සම්බන්ධයෙන් නම් මෙය රඳපවතිනුයේ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් අදාළ ස්කන්ධ ආයෝජනය ගිණුම්ගත කිරීමට හඳුනාගන්නා මුල් අවස්ථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය විසින් වෙනස් කළ නොහැකි තෝරා ගැනීමක් සිදු කර ඇද්ද යන කරුණ මතය. ආයතනය සහ සමූහය මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එහි ව්‍යාපාරික ආකෘතිය එම වත්කම් කළමනාකරණය කිරීම සඳහා වෙනස් වන අවස්ථාවලදී පමණි.

2.6.2 හඳුනාගැනීම සහ මූලික තක්සේරුව

අධිකාරියෙහි හා සමූහයෙහි මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී, සාධරාණ අගයට හඳුනා ගන්නා අතර, මූල්‍ය වත්කම්හි සාධාරණ අගය ලාභ පාඩු ගිණුම හරහා සටහන් කරන මූල්‍ය වත්කම්, මූලිකව හඳුනා ගැනීමේදී සාධාරණ අගය හා මූල්‍ය වත්කම අත්පත් කරගැනීමට ගිය හුවමාරු පිරිවැය යන දෙකෙහිම එකතුව සැලකිල්ලට ගනී.

2.6.3 අපර තක්සේරුව

- **ණය ලේඛන වල ආයෝජනය**

ණය ලේඛන මත සිදුකරන අපර තක්සේරු රඳාපවතිනුයේ වත්කම් කළමනාකරණය සඳහා වූ සමූහයේ ව්‍යාපාර ආකෘතිය සහ වත්කමෙහි ගති ස්වභාවයේ මුදල් ප්‍රවාහය මතය. ණය ලේඛන වර්ගීකරණය කරන තක්සේරු කාණ්ඩ තුනක් ඇත.

ක්‍රමක්ෂය පිරිවැය

මුල් මුදල හා පොළී ගෙවීම සඳහා පමණක්ම වන කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන වත්කම්, ක්‍රම ක්ෂය පිරිවැයට තක්සේරු කරනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ක්‍රියාත්මක පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. හඳුනා ගැනීම අත්හැර දැමීම හේතුකොට ගෙන පැන නගින කිසියම් ලාභයක්

හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් වාර්තා මගින් සෘජුවම හඳුනාගනු ලබන අතර, එම විදේශ විනිමය ලාභ හා පාඩු සමඟ එක්ව ඉදිරිපත් කරනු ලැබේ.

සාධාරණ වටිනාකම වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ගැලපීම (FVOCI)

මුල් මුදල හා පොලී ගෙවීම් සඳහා පමණක්ම නියෝජනය වන වත්කම් වල මුදල් ප්‍රවාහයන් කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ හා මූල්‍ය වත්කම් විකුණුම් සඳහා මූල්‍ය ප්‍රවාහ සඳහා පවත්වාගෙන යනු ලබන වත්කම්, වෙනත් විස්තීර්ණ ආදායම් වල සාධාරණ අගය මත තක්සේරු කරනු ලැබේ. විස්තීරණ ආදායම්හි හඳුනා ගනු ලබන හානිකරණ ලැබීම් සහ පාඩු, පොලී ආදායම සහ විදේශ විනිමය ලැබීම් සහ පාඩු හඳුනාගැනීම සඳහා මිස, අගයේ වෙනස් වීම් වෙනත් විස්තීර්ණ ආදායම් මගින් පිළිගනු ලැබේ. මූල්‍ය වත්කම හඳුනානොගන්නා විටදී වෙනත් විස්තීර්ණ ආදායමෙහි පූර්වයේදී හඳුනාගන්නා ලද සමුච්චිත ලාභ හෝ පාඩු ස්කන්ධ ආදායමේ සිට විස්තීර්ණ ආදායම දක්වා ප්‍රතිවර්ගීකරණය කර වෙනත් විස්තීර්ණ ආදායමෙහි ලාභ හෝ පාඩු ලෙස හඳුනාගනු ලැබේ. විදේශ විනිමය ලාභ සහ පාඩු වෙනත් ලැබීම්/(පාඩු) සහ හානිකරන වියදම් ලෙස වෙනම රේඛීය අයිතම ලෙස විස්තීර්ණ ආදායමෙහි ගෙනහැර දක්වනු ලැබේ.

සාධාරණ අගය ලාභ අලාභ ගිණුම තුළින් ගැලපීම (FVTPL)

ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් මත සාධාරණ අගය සඳහා වූ නිර්ණායකයන්ට අනුගත නොවන වත්කම් ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට තක්සේරු කරනු ලැබේ. ලාභ හෝ පාඩු මත සාධාරණ අගයට පසුකාලීනව තක්සේරු කරන ණය ආයෝජනයක ලාභය හෝ අලාභය විස්තීර්ණ ආදායම තුළින් හඳුනාගෙන එය පවතින කාලසීමාව තුළ වෙනත් ලාභ/ (පාඩු) ගිණුම ඇතුළත ශුද්ධ ආදායමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

- **ස්කන්ධ උපකරණ වල ආයෝජන**

සියළුම ස්කන්ධ ආයෝජන ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය විසින් පසුකාලීනව සාධාරණ අගයට තක්සේරු කරනු ලැබේ. සමූහයේ කළමනාකාරීත්වය විසින් සාධාරණ අගයේ ලාභ සහ පාඩු වෙනත් විස්තීර්ණ ආදායමෙහි ස්කන්ධ ආයෝජන වල ඉදිරිපත් කිරීමට තෝරාගෙන ඇති බැවින් ආයෝජන හඳුනාගැනීම හේතුකොට ගෙන පසුව විස්තීර්ණ ආදායම සඳහා සාධාරණ අගයේ ලාභ සහ පාඩු ප්‍රති වර්ගීකරණය කරනු නොලැබේ.

ගෙවීම් ලබා ගැනීම සඳහා සමූහයේ අයිතිය තහවුරු වූ විට විස්තීර්ණ ආදායමෙහි වෙනත් ආදායම් ලෙස පවතින ආයෝජන වලින් ලැබෙන ලාභාංශ අඛණ්ඩව හඳුනා ගනු ලැබේ. ලාභ හෝ පාඩු මත මූල්‍ය වත්කම් සාධාරණ අගයට තක්සේරු කිරීම මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ලාභ / (පාඩු) අදාළ පරිදි හඳුනාගනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායම්හි සාධාරණ අගයට තක්සේරු කරනු ලබන ස්කන්ධ ආයෝජන වල හානිකරණ පාඩු (සහ හානිකරණ පාඩු වල ප්‍රතිවර්තනය) සාධාරණ අගයේ වෙනත් මාරු කිරීම් මගින් වෙන් වශයෙන් වාර්තා කරනු නොලැබේ.

2.6.4 හානිකරණය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා සමූහය විසින් ඒවාහි ක්‍රමක්ෂය පිරිවැය හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සාධාරණ අගය මත ධාරණය වන ණය උපකරණ ආශ්‍රිතව සිදු විය හැකි බැර අලාභ තක්සේරු

කරනු ලබයි. මේ සඳහා අදාළ කර ගනු ලබන හානිකරණ ක්‍රමවේදය රඳාපවතිනුයේ ණය අවදානමෙහි විශාල වැඩිවීමක් සිදු වී ඇත්ද යන සාධකය මතය.

වෙළඳ ලැබීම් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ කරගනු ලබන්නේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි ඇති වෙළෙඳ ලැබීම් වල මූලික හඳුනාගැනීම් වල අපේක්ෂිත දිගු කාලීන අලාභ හඳුනාගැනීමට අවශ්‍ය කරනු ලබන මූල්‍ය උපකරණ මගින් අනුමත කර ඇති සරල ප්‍රවේශය වේ. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ ලැබීම් වල මූලික හඳුනාගැනීම මගින් අපේක්ෂිත ජීව කාල පාඩු හඳුනාගැනීම වේ. අපේක්ෂිත පාඩු වල අනුපාතය ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් විස්තර හා ලබා ඇති පෙර අනුරූපී බැර පාඩු මත පදනම්ව ගණනය කරනු ලබයි. පෙර අලාභ අනුපාත, සාර්ව ආර්ථික සාධක වල වත්මන් හා ඉදිරි තොරතුරු වල පිළිඹිබු වනසේ ගලපනු ලැබේ. (කළමනාකරණ තීරණ මත වෙනස් විය වේ.

හඳුනාගැනීමෙන් ඉවත් කිරීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය;

- මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහයට කොන්ත්‍රාත්තුමය අයිතීන් වල කාලය ඉක්මයාම, හෝ
- මූල්‍ය වත්කම් මාරු කිරීමෙන් පසු එම මාරු කිරීම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන අවස්ථාවලදී පමණක්,

මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

සාධාරණ අගය ගණනය කිරීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 13 ප්‍රකාරව කිසියම් වත්කමක් විකිණීමට නියම කරන මිල හෝ වෙළඳපොල හවුල්කරුන් අතර විධිමත් ගනුදෙනුවකදී කිසියම් වගකීමක් පැවරීමට තක්සේරුකරන දිනයේදී ගෙවන මිල, සාධාරණ අගය යනුවෙන් හඳුන්වනු ලැබේ. වත්කමක් විකිණීම සඳහා වන ගණුදෙනුව හෝ වගකීමක් පැවරීම සිදු වනුයේ වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළඳපොළ තුළ හෝ ප්‍රධාන වෙළඳපොළක් නොමැති විටකදී, වත්කම හෝ වගකීම සඳහා වඩාත් වාසිදායක වෙළඳපොළ තුළ බව සාධාරණ අගය ගණනය කිරීම මගින් උපකල්පනය කෙරේ.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගයේ ප්‍රමාණය හා එය භාවිතා කිරීම මගින් වෙළෙඳපොළ හවුල්කරුවෙකුහට එම වත්කම උපරිම ප්‍රයෝජනයට ගත හැකි ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන එය වෙනත් වෙළෙඳපොළ හවුල්කරුවෙකු වෙත විකිණීම මගින් එහි උපරිම හා හොඳම ප්‍රයෝජනය ගැනීමේ හැකියාව නිගමනය කරනු ලැබේ.

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සමූහය සුදුසු තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතා කරන අතර, නිරීක්ෂණය කල හැකි අදාළ යෙදවුම් වල භාවිතය උපරිම කරමින් හා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වල භාවිතය අවම කරමින් ඇගයීම් කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත අධිකාරිය සහ සමූහය සතුව පවතී. ඒ සඳහා පහත සඳහන් යෙදවුම් භාවිතා කරනු ලැබේ.

පළමු වන මට්ටමේ යෙදවුම් : තක්සේරු කරනු ලබන දිනයට ස්ථිතියට ප්‍රවේශ විය හැකි අනන්‍ය වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපොළෙහි පවතින මිල (ගැලපුම් නොකල)

දෙවන මට්ටමේ යෙදවුම් : වත්කම් හෝ වගකීම් සඳහා සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පළමු මට්ටමේ දත්ත වල ඇතුළත්ව පවතින මිල හැර වෙනත් යෙදවුම්

තෙවන මට්ටමේ යෙදවුම් : වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කල නොහැකි යෙදවුම්

සාධාරණ අගයට ගණනය කරන වත්කම්

වත්කම් කාණ්ඩය	සටහන් අංකය	2023.12.31 දිනට අගය	01 මට්ටම	02 මට්ටම	03 මට්ටම
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම්					
ලැයිස්තුගත ආයෝජන					
කොළඹ ඩොක්යාඩ් (පුද්.) සමාගම	8.1	110,402,646	110,402,646	-	-
ලැයිස්තුගත නොකල ආයෝජන					
කළමිබු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම	8.2	14,532,400,732	-	-	14,532,400,732
සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් සමාගම	8.2	3,555,074,222	-	-	3,555,074,222
හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෘප් (ප්‍රයිවට්) ලිමිටඩ්	8.2	52,363,280,963			52,363,280,963
ලංකා කෝල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්	8.2	11,950,000			11,950,000
කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ්	8.2	4,616,470,105			4,616,470,105
දකුණු ආසියා වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍ර සමාගම	8.2	1,778,288,708			1,778,288,708
		76,967,867,376	**110,402,646**	**-**	**76,857,464,730**

2.7 තොග

තොග තක්සේරු කරන්නේ තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට වේ. පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය අනුගමනය කරමිනි. වට්ටෝරු භාණ්ඩ නෞකා සහ නැව් බඩු මෙහෙයුම් උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් සහ පරිභෝජ්‍ය භාණ්ඩ හා ඉන්ධන සහ ලිහිසි තෙල් වලින් සමන්විත වේ. වට්ටෝරු භාණ්ඩ පවත්වාගෙන යනු ලබන්නේ පරිභෝජනය සඳහා මිස ප්‍රති විකිණීම සඳහා නොවේ.

2.8 වෙළඳ සහ වෙනත් ලැබීම්

වෙළඳ ලැබීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ඉටුකරන සේවා වෙනුවෙන් පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු හිඟ මුදල්ය. සාමාන්‍ය ව්‍යාපාර පවත්වාගෙන යාමේ මෙහෙයුම් චක්‍රය අනුව ලැබීම් අපේක්ෂා කරන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වෙළෙඳ ලැබීම් සාධාරණ අගයට හඳුනාගැනීමේදී විශේෂ මූල්‍ය සංරචක ඇතුළත් වේ නම් වෙළඳ

ලැබීම් එහි සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර එසේ නොමැති නම් වෙළඳ ලැබීම් මූලිකව ගනුදෙනු මිලට හඳුනාගනු ලැබේ.

කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහයන් ලබාගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරින් වෙළඳ ලැබීම් රඳවා ගන්නා අතර පසුව සළුල පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ඒවා ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

වෙනත් ලැබීම් සාමාන්‍ය වශයෙන් පැන නගිනු ලබන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් වලට පරිබාහිරව සිදු වන මෙහෙයුම් වලිනි.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ප්‍රකාරව, වෙළඳ ලැබීම් මත හානිකරණ අලාභයේ ප්‍රමාණය තක්සේරු කර හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අපේක්ෂිත ණය අලාභ ආකෘතිය Expected Credit Losss Model (ECL) භාවිතා කරනු ලැබේ.

සරල ප්‍රවේශය (Simplified Approach)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි වෙළෙඳ ලැබීම් වල හානිකරණ හඳුනාගැනීම සඳහා සරල ප්‍රවේශය අනුගමනය කරයි. සරල ප්‍රවේශය අනුගමනය කිරීම හේතුකොට ගෙන බැර අවදානම් වෙනස්වීම නිරීක්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍යතාවයක් ඇති නොවේ. මූලික පිළිගැනීමේ අවස්ථාවේ සිටම එක් එක් ගිණුම් වාර්තාකරණ දිනයට අපේක්ෂිත ණය අලාභ ආයුකාලය මත පදනම්ව හානිකරණ අලාභ එමගින් හඳුනාගනු ලැබේ.

ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, වෙළඳ ලැබීම් වල හානිකරණ අලාභ නිගමනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රතිපාදන න්‍යායක් (Provision Matrix) භාවිතා කරනු ලබයි. වෙළඳ ලැබීම් වල අපේක්ෂිත ආයු කාලය මත පෙර නිරීක්ෂණය වූ ගෙවීම් පැහැර හැරීමේ අනුපාතය ප්‍රතිපාදන න්‍යාය (Provision Matrix) මත පදනම් වන අතර ඉදිරි වාර්තාකරණ දිනයකදීම, පෙර නිරීක්ෂණය කරන ලද ගෙවීම් පැහැර හැරීම් වල අනුපාතය යාවත්කාලීන කරන අතර ඉදිරි කාලීන ඇස්තමේන්තු විශ්ලේෂණය කරනු ලැබේ. මෙම පදනම මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිණුම් වාර්තාකරණ දිනයට වෙළඳ ලැබීම් මත ප්‍රතිපාදන ඇස්තමේන්තු කරනු ලැබේ. කාලසීමාව තුළ හඳුනාගත් හානිකරණ අලාභ සීමා ගාස්තු අය කිරීම (හෙවත් ගෙවීම් ප්‍රතිවර්තනය) ආදායම් / වියදම් ලෙස හඳුනාගැනේ.

		පදනම	
1	ශ්‍රී ලංකා යුධ හමුදා ප්‍රතිපාදන	මාස 12 දක්වා	නැත
		මාස 12කට පසු	50%
2	රජයේ ආයතන ප්‍රතිපාදන	මාස 12 දක්වා	නැත
		මාස 12කට පසු	100%
3	අධිකරණමය කටයුතු වලට ලක් වූ නැව් නියෝජිතයන්		100%
	නැව් නියෝජිතයින් - අතිහිටුවා ඇති සහ අක්‍රිය නැව් නියෝජිතයන්		100%
	විශාල මුදල් ප්‍රමාණයන් ගෙවීමට ඇති නැව් නියෝජිතයින් (මිලියන 1කට වැඩි)	මාස 12 දක්වා	නැත
		මාස 12න් පසු	50%

2.9 මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ, මුදල් සහ මුදල් හා සමාන දෑට අයත් වන්නේ අත ඇති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු හා මූලික කල් පිරීමේ කාල සීමාව තෙමසක් හෝ ඊට අඩු කාලයක් සහිත කෙටි කාලීන ඉහළ මට්ටමේ ද්‍රවශීලතා ආයෝජනයන් ය.

2.10යෙදවූ ප්‍රාග්ධනය

මෙයට කොළඹ වරාය කොමිසන් සභාව, වරාය නැව් බඩු සංයුක්ත මණ්ඩලය, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව යන ආයතන වලින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරන ලද සියළු දේපළ වලට අදාළ අරමුදල් වලට අයත් සියළුම ණය, වගකීම් සහ බැඳීම් ඇතුළුව චංචල සහ නිශ්චල දේපළ මෙයට ඇතුළත් වේ.

2.11මූල්‍යමය වගකීම්

සමූහය විසින් මූල්‍යමය වගකීම් වෙනත් මූල්‍යමය වගකීම් වලට වර්ගීකරණය කරනු ලබයි. සමූහයේ වෙනත් මූල්‍ය වගකීම් වලට අයත් වන්නේ ණය ගැනීම්, වෙළඳ හා වෙනත් ගෙවීම් ඇතුළත් වේ. වෙනත් මූල්‍ය වගකීම් මූලිකව තක්සේරු කරනු ලබන්නේ වෙළඳ පිරිවැය සඳහා ඍජුවම අදාළ මුදල සහ සාධාරණ අගයේ එකතුවෙනි. මූලිකව හඳුනාගැනීමෙන් අනතුරුව මෙම මූල්‍යමය වගකීම්, සඵල පොළී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂ පිරිවැය ලෙස තක්සේරු කරනු ලැබේ. කොන්ත්‍රාත්තුමය වගකීම් නිදහස් කර අවලංගු කර හෝ අවසන් කර ඇති විට සමූහය විසින් මූල්‍ය වගකීම හඳුනාගැනීම අත්හරිනු ලැබේ.

2.12වෙළඳ හා වෙනත් ගෙවීම්

වෙළඳ සහ වෙනත් ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ හා සේවා සම්බන්ධ ගෙවීම් සඳහා ඇති වගකීම් වේ. ව්‍යාපාරයක සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක මෙන් වෙළඳ හා අනෙකුත් ගෙවීම් ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

වෙළඳ හා අනෙකුත් ගෙවීම් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයටය. මෙය ගණුදෙනු මිල වන අතර පසුව තක්සේරු කිරීමේදී මුල් ඉන්වොයිසියේ අගයට තක්සේරු කරන අතර, කෙටි කාලයක් තුළදී ගෙවීම් කිරීම කරන බැවින් මුදල් වල කාලයේ වටිනාකම වැදගත් නොවේ.

2.13 ණය ලබාගැනීම්

සමූහයේ ණය ගැනීම් වල ශ්‍රී ලංකා රජයෙන් හා වෙනත් මූල්‍ය ආයතන වලින් වරාය සංවර්ධන කටයුතු සඳහා ලබාගනු ලබන ණය ඇතුළත් වේ. ණය ගැනීම් මූලිකව වැය කළ ශුද්ධ ගනුදෙනුපිරිවැයේ සාධාරණ අගයට හඳුනාගනු ලැබේ. ඉන් පසුව ණය ගැනීම් පසුව ඵලදායී පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට තක්සේරු කරනු ලැබේ. ගිණුම් වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී පවතින පාවෙන පොළී අනුපාතිකය (ඵලදායී පොළී අනුපාතිකය) භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය ලෙස අස්ථිර අනුපාත ණය ගැනීම් තක්සේරු කරනු ලැබේ.

ණය ගැනීමේ පහසුකම් වෙනුවෙන් ගෙවන ලද ණය මුදල පිළියෙළ කිරීමේ ගාස්තුව, ව්‍යුහාත්මක ගාස්තුව, සැකසීමේ ගාස්තුව සහ කළමනාකරණ ගාස්තුව ණය මුදලේ ගනුදෙනු පිරිවැයට හඳුනාගනු ලැබේ.

ක්‍රමක්ෂ පිරිවැයට ණය මුදලේ ධාරණ අගය තක්සේරු කිරීමේදී ඇති වන විදේශ විනිමය ලාභ සහ පාඩු එක් එක් ගිණුම් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශ මගින් හඳුනාගනු ලැබේ.

2.14 ණය ගැනීමේ පිරිවැය

ණය ලබාගැනීමේ පිරිවැය සෘජුවම සම්බන්ධ වන්නේ පවරාගැනීම සහ සුදුසු වත්කම් ඉදිකිරීම් වෙනුවෙනි. මෙම වත්කම් ඒවාහි අපේක්ෂිත කාර්යය සඳහා සූදානම් කිරීමට සැලකිය යුතු කාලයක් ගතවේ. එම වත්කම් භාවිතා කිරීමට අදහස් කරන කාර්යය සඳහා සූදානම් කරන තෙක් එකී වත්කම් ඒවාහි පිරිවැයට එකතු කරනු ලැබේ.

අනෙකුත් සියළුම ණය ගැනුම් පිරිවැය ඒවා යොදවනු ලබන කාලපරිච්ඡේදය තුළ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් හඳුනාගනු ලැබේ.

2.15 රජයේ ප්‍රදාන

මූල්‍යමය නොවන ප්‍රදාන ඇතුළු රජයෙන් ලැබෙන ප්‍රදානයන් නිසැකවම ලැබෙන බවට හා ඒවාට අදාළ කොන්දේසි වලට සමූහය විසින් අනුකූල වන බවට ප්‍රමාණවත් සහතික වීමක් ලැබුණු විට ඒවා සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් පිළිගනු ලැබේ. මෙය වන්දි ගෙවීම් සඳහා අදහස් කරන පිරිවැයට සරිලන පරිදි අවශ්‍ය කාලයේදී සළකා බලනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා අදාළ රජයේ ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම් වල ඇතුළත් කර ඇති අතර, ඒවා අදාළ වත්කම් වල අපේක්ෂිත ආයු කාලය අනුව සරල රේඛීය පදනම මත සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගනු ලැබේ.

මූල්‍යමය නොවන ප්‍රදාන, මූල්‍යමය නොවන වත්කම් වල සාධාරණ අගයට තක්සේරු කරනු ලබන අතර ප්‍රදාන සහ වත්කම් වල සාධාරණ අගයට ගිණුම්ගත කරනු ලැබේ.

2.16 ජංගම සහ විලම්භිත බදු

අදාළ කාලසීමාව සඳහා බදු වියදම් ජංගම සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. වෙනත් සවිස්තරාත්මක ආදායම් වල හඳුනාගනු ලබන කරුණු වලට අදාළ ප්‍රමාණය හැර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ බදු හඳුනාගනු ලැබේ. මෙම අවස්ථාවේ දී, වෙනත් සවිස්තරාත්මක ආදායම සඳහා ද බදු හඳුනාගනු ලැබේ.

ජංගම ආදායම් බදු ගෙවීම ගණනය කරනු ලබන්නේ වරාය අධිකාරියට, එහි පරිපාලිත සමාගම් වලට අදාළ ගිණුම් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී පනවනු ලබන ගෙවිය යුතු බදු මුදල පදනම් කර ගෙනය. ගෙවිය යුතු බදු මුදල පදනම් කරගෙන කළමනාකාරීත්වය විසින් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

වත්කම් වල හා වගකීම් වල සහ මූල්‍ය ප්‍රකාශන වල ධාරණ අගය අතර පැනනගින තාවකාලික විචල්‍යතාවයන් මත විලම්භිත බදු හඳුනාගනු ලැබේ. ගණුදෙනුව සිදුවන කාල වකවානුවේදී ගිණුම්වලටවත්, බදු ගෙවිය යුතු ලාභයටවත් හෝ අලාභයටවත් බල නොපවත්වන ව්‍යාපාරයකදී ඍජුවම මූලික හඳුනාගැනීම සම්බන්ධයෙන් විචල්‍යතාවයක් පැන නගින්නේ නම් විලම්භීත බදු සැලකිල්ලට ගනු නොලැබේ. වාර්තාකරණ කාලසීමාවේ අවසන් දිනයට පනවා ඇති බදු අනුපාතය උපයෝගී කරගනිමින් විලම්භිත බදු ප්‍රමාණය තීරණය කර, එම විලම්භීත බදු උපලබ්ධි වූ විට හෝ විලම්භිත ආදායම් බදු වගකීම නිරවුල් වූ විට ඒවා අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

තාවකාලික විචල්‍යතාවයන් සඳහා උපයෝගී කිරීමට අනාගත බදු අයකල යුතු ලාභ පැවතිය හැකි ප්‍රමාණය අනුව පමණක් විලම්භීත බදු හඳුනාගනු ලැබේ.

ජංගම බදු වගකීම් වලට බදු වත්කම් හා වගකීම් හිලව් කිරීම සඳහා නීතිමය අයිතිය බලාත්මක කර ඇති අවස්ථාවක සහ එම බදු අයකිරීම් අධිකාරිය මගින්ම පනවා ඇති විලම්භිත බදු වත්කම් සහ වගකීම් සඳහා ආදායම් බදු හිලව් කරනු ලැබේ.

2.17 සේවක ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සහ නිශ්චිත දායකත්ව සැළසුම් සමූහය සතුව ඇත.

(අ) නිශ්චිත දායකත්ව සැළසුම

නිශ්චිත දායකත්ව සැලැසුමක් යනු සමූහය විසින් වෙනම ස්ථිතියක් වෙත නොවෙනස්වන දායකත්වයක් යටතේ ගෙවන ස්ථිර සේවක ප්‍රතිලාභයකි. ඊට වැඩිමනත් ගෙවීමක් කිරීමට නීතිමය හෝ සම්මුතික බැඳියාවක් සමූහයට නොමැත. ගෙවිය යුතු කාලය වනවිට සේවක ප්‍රතිලාභ ලෙස මෙම ගෙවීම් පිළිගනු ලැබේ.

සේවකයාගේ දළ වැටුපෙන් 15%ක් සේවක අර්ථ සාධක අරමුදලට ද 3%ක් සේවක භාරකාර අරමුදලට ද සමූහය විසින් හඳුනාගනු ලැබේ.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම සම්බන්ධව සමූහයේ වගකීම වන්නේ ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ පවත්නා නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වත්මන් වටිනාකමය. නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ආයු ගණක ක්‍රමය මගින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම සේවකයා විසින් වර්තමාන සහ පූර්ව කාල පරිච්ඡේදය සඳහා සේවාවන් වෙනුවෙන් උපයාගත් ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභ අඩුකරමින් නිර්ණය කරනු ලැබේ.

ආයු ගණක උපකල්පනයන් වල කර ඇති ගැලපුම් වෙනස්කම් වලින් මතුවන ආයු ගණක ලැබීම් සහ පාඩු ඒවා පැන නගින කාල සීමාව තුලදී සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙන් හඳුනාගනු ලැබේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිර වශයෙන් අරමුදල් යොදවනු නොලැබේ.

(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයා විසින් ඉටුකරනු ලබන සේවය වෙනුවෙන් ගෙවීමට අපේක්ෂා කරනු ලබන අඩු නොකරන ගෙවීම් මත කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් ගණනය කරනු ලැබේ.

2.18 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වත්මන් නීතිමය බැඳීමක් හෝ සම්මුතික බැඳීමක් ඇති අවස්ථාවක පරිමා ප්‍රතිදාන, නෛතික හිමිකම් පෑම් සහ වෙනත් වියදම් හඳුනාගනු ලැබේ. ආර්ථික වත්කම් පිටාර ගලනයක් සමූහයෙන් අපේක්ෂා කිරීමට ඉඩ ඇති අතර වටිනාකම් විශ්වාසනීයත්වයෙන් යුතුව ඇස්තමේන්තුගත කළ හැක.

වර්තමාන වගකීම හා බැඳුනු අවදානම් සහ අවිනිශ්චිතතාවයක් ඇතුළත් ගිණුම්, වාර්තාකරණ දිනයට ලබා ගත හැකි වඩාත් විශ්වසනීය සාක්ෂි මත පදනම් ව වත්මන් වගකීම් පියවීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් මත ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් පිටාර යෑමේ සම්භාවිතාවය දුරස්ථ නොවේනම් සියළුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

2.19 ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්තු වලට එළැඹීමෙන් ලබන ආදායම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ගනුදෙනුකරුවෙකු සමඟ කොන්ත්‍රාත්තුවට එළඹෙනු ලබන්නේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 හි දැක්වෙන නිර්ණායක සපුරා ඇති අවස්ථාවලදීය. කොන්ත්‍රාත්තුව ආරම්භයේදී ගනුදෙනුකරු සමඟ ඇති කරගන්නා ගිවිසුම් වලට අනුකූලව සමූහය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිවිසුම්ගත භාණ්ඩ හෝ සේවා තක්සේරු කරන අතර ගනුදෙනුරුහට පැවරීම සඳහා ගිවිස ගනු ලැබූ එක් එක් කාර්යසාධන වගකීම් පැවරීම සඳහා පහත සඳහන් කාර්යසාධන වගකීම්වලින් එකක් හඳුනාගත යුතුය.

(අ) නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් (හෝ භාණ්ඩ හෝ සේවා ගණනාවක්); හෝ

(ආ) ගනුදෙනුකරුහට පවරනු ලබන ආකාරයට බෙහෙවින් සමාන ආකාරයේ හෝ එකම ආකාරයේ නිශ්චිත භාණ්ඩ හෝ සේවා ගණනාවක්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආදායම් හඳුනාගනු ලබන්නේ සේවාලාභියෙකු වෙත ගිවිසගත් භාණ්ඩයක් හෝ සේවයක් (එනම් වත්කමක්) පැවරීම මගින් ආයතනය කාර්යසාධන වගකීම පිළිබඳ සෑහීමකට පත්වන කල්හිය. වත්කමක් පවරනු ලබන්නේ සේවා ලාභියා එම වත්කමෙහි පාලනය තමන් සතු කර ගන්නා විටදීය.

නියමිත කාලයෙන් පසු භාණ්ඩ වල හා සේවා වල පාලනය පවරනු ලබන විට සහ කාර්යසාධන වගකීම් පිළිබඳව සෑහීමට පත්වූ පසුව ආදායම හඳුනාගනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය කාර්යසාධන වගකීම් ඉලක්කගත කාලයක් තුළ ඉටු කරන ලබන්නේ, කාර්යසාධන වගකීම් නිශ්චිත කාලයක් තුළ ඉටු කරන අවස්ථාවකදීය.

ආදායම ගණනය කිරීම

කාර්යසාධන වගකීම ඉටු වූ පසු, එම කාර්යසාධන වගකීම සඳහා වෙන් කරන ගනුදෙනු මිල ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආදායම ලෙස පිළිගනු ලබයි. ගනුදෙනු මිල තීරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ නියමයන් සහ භාවිතා කරනු ලබන ව්‍යාපාර පරිචයන් ද සලකා බලනු ලැබේ. ගනුදෙනු මිල යනු තුන්වන පාර්ශ්වයන් වෙනුවෙන් අය කරනු ලබන මුදල අත්හැර, ගිවිසුම් ගත භාණ්ඩ හා සේවා ගනුදෙනුකරුවකු වෙත ලබා දීම වෙනුවට ස්ථිතිය විසින් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභය වේ. ගනුදෙනු මිල තීරණය කිරීමේදී පහත සඳහන් සියළුම කරුණු ශ්‍රී ලංකා වරාය අධිකාරය සහ සමූහය විසින් සලකා බලනු ලැබේ.

- විචල්‍ය ප්‍රතිශ්ඨාව
- විචල්‍ය ප්‍රතිශ්ඨාවේ සංරෝධක ඇස්තමේන්තුව
- කොන්ත්‍රාත්තුවේ පවතින විශේෂිත මූල්‍ය සංරචකයන් පැවතීම
- මූල්‍යමය නොවන ප්‍රතිශ්ඨාව
- ගනුදෙනුකරුවෙකුහට ගෙවන ප්‍රතිශ්ඨාව

ඉටුකරන ලද හඳුනාගත හැකි එක් එක් ප්‍රධාන පෙලේ සේවාවන් හඳුනාගැනීම සඳහා සමූහය විසින් පහත සඳහන් නිර්ණායක අදාළ කර ගනු ලැබේ.

(අ) ගොඩබෑම් හා භාරදීමේ සේවා

ආනයන අපනයන නැව්බඩු මෙහෙයුම් සම්බන්ධයෙන් නැව්බඩු පැටවීම්, ගොඩබෑම් හා ගබඩා කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම ආදී සේවාවන් සමූහය විසින් සපයනු ලැබේ. මෙම විකුණුම් සේවා සඳහා කාර්යය හෝ ගනුදෙනු සම්පූර්ණ කිරීම පදනම්ව සේවා සපයන අතර, සපයන ලද සත්‍ය සේවා පදනම් කොට අය කිරීම් තක්සේරු කරනු ලැබේ.

(ආ) නාවික හා ආශ්‍රිත සේවා

ප්‍රදීපාගාර ගාස්තු ප්‍රවේශ ගාස්තු හා අධිපැය ගාස්තු සහ නියමු ගාස්තු, ඒවා ලැබීමට නියම වන අවස්ථාවේදී, එනම් නෞකා පැමිණෙන අවස්ථාවේදි නියම කරනු ලැබේ. නාවික හා අදාළ සේවාවන්ගෙන් ලැබෙන ආදායම එම සේවාව සැපයූ කාලසීමාව තුළ හඳුනාගනු ලබන අතර, අදාළ කාර්යය හෝ ගනුදෙනුව සම්පූර්ණ කිරීමේ පදනම මත සහ සත්‍ය වශයෙන්ම සපයන ලද සේවාවන් මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

(ඇ) නැව් භාණ්ඩ වාහක සේවා

බහළු මෙහෙයුම් සහ සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් වලට අදාළව නැව් භාණ්ඩ වාහක සේවාවන්ගෙන් ලැබෙන ආදායම සේවාව සැපයූ කාලසීමාව තුළ හඳුනාගනු ලබන අතර කාර්ය හෝ ගනුදෙනුව සම්පූර්ණ කිරීමේ පදනම සහ සත්‍ය වශයෙන්මසපයන ලද සේවාව මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

පොලී ආදායම

ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ. ප්‍රදානය කල ණය මුදලක් හෝ ලැබිය යුතු ආදායමෙන් ණය මුදලක් හානිකරණය සිදු වූ විට, ශ්‍රී ලංකා වරාය අධිකාරි එහි

ධාරණ අගය ප්‍රතිලාභ්‍ය අගයට අඩු කරන අතර එය ලේඛනයේ මූලික ක්‍රියාකාරී පොලී අනුපාතයට අඩුකල අනාගත මුදල් ප්‍රවාහය වශයෙන් එහි ධාරණ අගය ලැබිය යුතු අගයට අඩුකර පොලී අනුපාතිකය වශයෙන් වට්ටම අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. හානිකරණ ණය මත පොලී ආදායම හා ලැබීම් මූලික ක්‍රියාත්මක පොලී අනුපාතය භාවිතා කරමින් හඳුනාගනු ලැබේ. බැංකු ශේෂ හා බැංකු තැන්පතු මත ලැබෙන පොලිය උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

බදු කුලී ආදායම

මෙහෙයුම් කල්බදු යටතේ ලැබෙන බදු ආදායම, අසම්භාව්‍ය බදු ආදායම ලැබෙන අවස්ථාවලදී හඳුනාගන්නා බදු ආදායම හැර, බදු කාලසීමාව මත ඍජු රේඛීය පදනම මත හඳුනාගනු ලැබේ. බදු කාලසීමාව යනු බදු ගිවිසුමේ දක්වා ඇති ස්ථාවර කාලසීමාව සහ එය තවදුරටත් දීර්ඝ කල හැකි කාලසීමාව වන අතර ඒ සඳහා බදුකරුහට මෙම බදු ගිවිසුව අඛණ්ඩව පවත්වා ගෙන යෑමේ විකල්පය පවතින අතර, කල්බදු ගිවිසුම ආරම්භයේදී බදුකරු විසින් මෙම විකල්පය භාවිතයට ගනු ලබන බවට අධ්‍යක්ෂකරුන් හේතු සහිතව සහතික වේ. බදු ගිවිසුම් අවසන් කිරීම සඳහා ලැබෙන වාරික ලැබෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මගින් හඳනාගනු ලැබේ.

ලාභාංශ ආදායම

ලාභාංශ ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ ස්ථිතිය වෙත ලැබී, ලාභාංශයේ මුදල් ප්‍රමාණය විශ්වාසනීයත්වයෙන් යුතුව ගණනය කිරීමේ ප්‍රවාණතාවයක් ඇති වී ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

රාජ්‍යභාග ආදායම

ආදාළ ගිවිසුමේ අඩංගු කරුණු ප්‍රකාරව, සහ රාජ්‍ය භාග ආදායමට අදාළ ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ලැබීමේ සම්භාවිතාවක් ඇති බව සහ ආදායම විශ්වාසනීය ලෙස ගණනය කල හැකි වීම අනුව රාජ්‍ය භාගය හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ විකුණා බැහැර කිරීමෙන් ලබන ලාභ සහ පාඩු

දේපළ, පිරියත හා උපකරණ විකුණා බැහැර කිරීමෙන් ලබන ශුද්ධ ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කර ඇත්තේ විකුණා බැහැර කිරීමෙන් ලබන ආදායම, වත්කම්හි ධාරණ අගය සහ අදාළ විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය.

2.20 වියදම්

මෙහෙයුම් සඳහා දරණු ලබන සියළුම වියදම් ගිණුම් වාර්තාකරණ කාල පරිච්ඡේදයේ ආදායමට එකතු කර ඇත.

2.21 වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසුව සිදුවන කරුණු.

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදු වූ සියළුම ප්‍රමාණාත්මක කරුණු සැලකිල්ලට ගෙන සුදුසු ගැලපුම් / හෝ අනාවරණ, මූල්‍ය ප්‍රකාශණයේ අදාළ සටහන් වල දක්වා ඇත.

2.22 වගකීම්

වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී සියළුම ප්‍රමාණාත්මක වගකීම් හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශනයේ සටහන් මගින් අනාවරණය කර ඇත.

2.23 විශේෂ ගිණුම් ඇස්තමේන්තු සහ නිගමන

මූල්‍යමය ප්‍රකාශන සකස් කිරීමේ දී, කළමනාකාරීත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම පිළිබඳව නිගමන, ඇස්තමේන්තු සහ උපකල්පනයන් ගණනාවක් පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රථම වරට විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත15,09 සහ 16 භාවිතා කර ඇත. නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත භාවිතා කිරීම හේතුකොට ගෙන සිදු වී ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල ස්වභාවය සහ වෙනස් වීම් පහත විස්තර කර ඇත.

සංක්‍රමණික මාර්ගෝපදේශ වලට අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 හි අනුගමනය කල හැකි වෙනස්කම් ප්‍රත්‍යෝක්ෂණව අනුගමනය කර ඇත. ඒ අනුව, ආරම්භක යෙදවුම් දිනය ඇතුළත් වන වාර්ෂික ගිණුම් වාර්තාකරණ කාලසීමාවේ ස්කන්ධ ප්‍රාග්ධනයේ රඳවාගත් ඉපැයීම් වල සමුච්චිත ශේෂය (සුදුසු පරිදි) ගැලපුම් කරනු ලැබේ. මෙම සංක්‍රමණික ක්‍රමවේදය යටතේ, මූලික යෙදවුම් දිනය වන විට අවසන් නොවූ කොන්ත්‍රාත්තු සඳහා පමණක් ප්‍රත්‍යෝක්ෂණව යෙදවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම ප්‍රමිතිය තෝරාගෙන ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 සංක්‍රාන්ති ප්‍රතිපාදන වල දක්වා ඇති පරිදි හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂ වල වෙනස්කම් වලට අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකාරණ ප්‍රමිත 09 ප්‍රත්‍යෝක්ෂණ වශයෙන් භාවිතා නොකෙරේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ට අනුව, වර්ගීකරණය සහ ගණනය කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ සමූහයේ ශේෂයන්ට අතිවිශාල බලපෑමක් ඇති නොකරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි ද දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 389 යටතේ සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය ලේඛන ගණනය කිරීම අඛණ්ඩව සිදු කර ඇත. මූල්‍ය ලේඛන වර්ගීකරණය පහත පරිදි දැක්විය හැක.

- පූර්වයෙහි ගණනය කරන ලද කල්පිරීමෙන් පසු රඳවාගන්නා රජයේ සුරැකුම්පත් සහ තැන්පතු වල ආයෝජනයන් වර්ගීකරණය කර ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ.
- කල් පිරීමේදි රඳවාගෙන වර්ගීකරණය කරන ණය ලේඛන ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය සහ ගණනය කරනු ලැබේ.
- පෙර ණය සහ ලැබීම් ලෙස ගණනය කරන ලද වෙළෙඳ ලැබීම් සහ වෙනත් ලැබීම් ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කර ගණනය කරනු ලැබේ.
- "විකිණීම සඳහා ඇති" වශයෙන් වර්ගීකරණය කර ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකල සමාගම් වල ස්කන්ධ ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කර ගණනය කරනු ලැබේ.

2.23.1 මූල්‍යමය ප්‍රකාශන වලට වඩා වැදගත් බලපෑමක් සිදු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අදාළ කර ගැනීමේදී ගනු ලබන විශේෂ විනිශ්චයන් පහත දැක්වෙන අයුරු වේ.

(අ) විලම්භීත බදු වත්කම් හඳුනාගැනීම

විලම්භීත බදු වත්කම් හඳුනාගත හැකි ප්‍රමාණය කොතෙක්ද යන්න, අනාගත බදු අයකල හැකි ආදායමෙහි සම්භාවිතාවය මත පදනම් වේ.

2.23.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම මත විශේෂ බලපෑමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත:

(අ) ක්ෂය කළ හැකි වත්කම් වල ඵලදායී ජීවකාලය

එක් එක් වාර්තාකරණ දිනයේදී වත්කම් වල අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත පදනම්ව ක්ෂය කළ හැකි වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ ඇස්තමේන්තුව කළමනාකරණය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව, මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණික උපකරණ වල උපයෝගීතාව වෙනස් කළ හැකි තාක්ෂණික යල් පැනීම් වලට අදාළව සිදු වේ.

(ආ) සේවක ප්‍රතිලාභ සැලැස්ම

සේවක ප්‍රතිලාභ සැළැස්මේ වගකීම් වල වර්තමාන වටිනාකම සාධක ගණනාවක් මත රඳා පවතී. මෙය නිර්ණය කරනු ලබන්නේ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් කරනු ලබන ආයුගණක පදනම මත ය. වට්ටම් ඇතුළුව සේවක ප්‍රතිලාභ සැලැස්මෙහි ශුද්ධ පිරිවැය සහ වගකීම නිර්ණය කිරීමේදී මෙම උපකල්පනයන් භාවිතා කෙරේ. මෙම උපකල්පනයන්ගේ යම් වෙනස් වීමක් සේවක ප්‍රතිලාභ වගකීමේ ධාරණ අගයට බලපෑමක් ඇති වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

3 දේපළ, පිරියත සහ උපකරණ

සමූහය	2023 ජනවාරි 01 දිනට	එකතු කිරීම්	(බැහැර කිරීම්)	ප්‍රතිවර්ගීකරණය/ගැලපුම්	2023 දෙසැම්බර් 31 දිනට
3.1 පිරිවැයට					
ඉඩම්	117,266,033,792	20,102,218	(90,296)	(20,301,949,647)	96,984,096,068
මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ	114,382,811,987	1,773,747,479	(16,300,000)	20,058,679,316	136,198,938,782
පාවෙන උපකරණ	7,550,011,189	1,499,256,925	-	-	9,049,268,114
මෙහෙයුම් උපකරණ	27,779,988,818	174,624,443	(34,896,145)	-	27,919,717,116
පිරියත හා යන්ත්‍රෝපකරණ	1,038,431,120	217,360,523	(41,206,539)	(18,985,000)	1,195,600,104
කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි	1,026,423,320	431,533,781	-	-	1,457,957,100
කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි	454,737,739	6,400,978	(90,000)	-	461,048,717
පරිගණක දෘඩාංග	576,275,382	201,744,441	(462,230)	3,330,000	780,887,593
විදුලි හා විද්‍යුත් උපකරණ	2,740,279,857	500,768,507	(1,879,366)		3,239,168,998
කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ	223,868,785	22,491,119	(1,573,778)	(3,387,960)	241,398,167
මෝටර් රථ	979,715,530	286,221,180	(7,060,957)	18,985,000	1,277,860,753
වෙනත් වත්කම්	526,282,643	35,549,703	(76,500)	-	561,755,846
	274,544,860,162	**5,169,801,297**	**(103,635,810)**	**(243,328,291)**	**279,367,697,358**

3.1.1 ක්ෂය	2023 ජනවාරි 01 දිනට	වර්ෂය තුළ වෙනස් වීම්	(බැහැර කිරීම්)	ප්‍රතිවර්ගීකරණය/ගැලපුම්	2023 දෙසැම්බර් 31 දිනට
මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ	34,390,145,503	1,793,524,655	(11,398,590)	6,878,685,997	43,050,957,565
පාවෙන උපකරණ	7,068,725,272	302,025,019	-	(1,314,686,797)	6,056,063,495
මෙහෙයුම් උපකරණ	17,608,581,329	1,265,690,070	(34,861,248)	(1,313,338,959)	17,526,071,192
පිරියත හා යන්ත්‍රෝපකරණ	729,558,807	88,025,129	(41,165,337)	57,390,602	833,809,201
කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි	404,724,914	70,412,191	-	5,676,671	480,813,776
කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි	284,313,696	16,915,343	(89,910)	(5,458,787)	295,680,343
පරිගණක දෘඩාංග	411,029,139	72,228,994	(437,555)	3,356,107	486,176,686
විදුලි හා විද්‍යුත් උපකරණ	2,370,913,612	131,480,224	(1,882,909)	79,989,947	2,580,500,874
කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ	173,326,552	18,735,074	(1,571,631)	(3,080,367)	187,409,628
මෝටර් රථ	837,474,730	67,114,422	(7,034,057)	(64,403,871)	833,151,224
වෙනත් වත්කම්	426,429,488	25,449,780	(76,424)	-	451,802,845
	64,705,223,043	**3,851,600,901**	**(98,517,660)**	**4,324,130,543**	**72,782,436,827**

3.1.2 ඉදිරියට ගෙන යන ලද ශුද්ධ වත්කම්	2023 දෙසැම්බර් 31 දිනට	2022 දෙසැම්බර් 31 දිනට
දේපළ, පිරියත සහ උපකරණ		
ඉඩම්	96,984,096,068	117,266,033,792
මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ	93,147,981,217	79,992,666,484
පාවෙන උපකරණ	2,993,204,619	481,285,917
මෙහෙයුම් උපකරණ	10,393,645,925	10,171,407,489
පිරියත හා යන්ත්‍රෝපකරණ	361,790,903	308,872,313
කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි	977,143,325	621,698,406
කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි	165,368,375	170,424,043
පරිගණක දෘඩාංග	294,710,908	165,246,243
විදුලි හා විද්‍යුත් උපකරණ	658,668,124	369,366,245
කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ	53,988,538	50,542,234
මොටර් රථ	444,709,529	142,240,799
වෙනත් වත්කම්	109,953,001	99,853,154
	206,585,260,530	**209,839,637,119**
නොනිමි ප්‍රාග්ධන වැඩ (සටහන 3.3)	65,507,364,120	41,381,934,801
	272,092,624,650	**251,221,571,920**

සමූහය	2023 දෙසැම්බර් 31 දිනට	2022 දෙසැම්බර් 31 දිනට
දේපළ, පිරියත හා උපකරණ නිරවුල් කිරීමේ ගිණුම	113,401,865	500,852,270
	113,401,865	**500,852,270**
	272,206,026,515	**251,722,424,190**

1. නිරවුල් කිරීමේ ගිණුමෙහි රු. 113,159,199.33 ක ඉඩම්, රු.49,436.11 විදුලි හා විද්‍යුත් උපකරණ හා ගෘහ රු. 193,230.00 ගෘහ භාණ්ඩ කාර්යාල උපකරණ ඇතුළත් වේ.
2. රු. 65,062,022.07 ක වත්කම් ආගමික ස්ථානවල භාවිතා කෙරේ.
3. වත්කම් ලේඛනයට අනුව 2023.12.31 දින වන භාවිතයේ පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්වල මුළු වටිනාකම රු. 32,263,644,209.01
4. අත්කර් වරාය වත්කම් පැවරුම් වල විස්තර පහත දැක්වේ.

වත්කම් වර්ගය	කොළඹ	ත්‍රිකුණාමලය	ගාල්ල
ඉඩම්	(3,000,000.00)	-	3,000,000.00
පාවෙන උපකරණ	(53,000,000)	53,000,000	-
මෙහෙයුම් උපකරණ	4,700,000	(4,700,000)	-
පරිගණක දෘඩාංග	(2,054,987)	353,700	1,701,287
කාර්යාල ගෘහ භාණ්ඩ හා උපකරණ	(18,745)	-	18,745
මෝටර් රථ	(1,864,433)	1,864,433	-
එකතුව	**(55,238,165)**	**50,518,133**	**4,720,032**

5. සමීක්ෂණ මණ්ඩලය ගණිත වත්කම් නිරවුල් කිරීම් සඳහා පත් කරන ලද කමිටුව විසින් ගන්නා ලද තීරණය පරිදි වර්ෂය තුළ මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ, කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි, කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු. 1,083,705,500 , රු. 431,656,035.00 හා රු. 3,500,000.00 ක් (මීලඟදී ගැනුම් පිරිවැය) වටිනා ගොඩනැගිලි ප්‍රාග්ධනීත කරන ලදී. පෙර කාලයට වලංගු වන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තු වෙනස් වීම් සහ දෝෂයන්ට අනුකූලව ගැලපුම් සිදු කරන ලදී. ගොඩනැගිලිවල වටිනාකම්, අදාළ විෂයභාර නිලධාරීන්ද ඇතුළත් වන වත්කම් යාවත්කාලීන කිරීමටුව විසින් තීරණය කරන ලදී.

6.වත්කම් ප්‍රතිවර්ගීකරණ විස්තර පහත දැක්වේ.

වත්මන් කාණ්ඩය	ප්‍රතිවර්ගීකරණය කරන ලද්දේ	මුදල (රු.)
පිරියත හා යන්ත්‍රෝපකරණ	මෝටර් රථ	18,985,000
ඉඩම්	මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ	20,049,269,315
	ආයෝජන දේපළ ඉඩම්	260,945,331
ආයෝජන දේපළ	මෙහෙයුම් ගොඩනැගිලි හා ව්‍යුහ	9,410,000
	ඉඩම්	8,265,000
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ	පරිගණක දෘඩාංග	3,330,000

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

3 දේපළ, පිරියක සහ උපකරණ

ශ්‍රීලවඅ	2023 ජනවාරි 01 දිනට	වර්ෂය තුළ වෙනස් වීම්	(බැහැර කිරීම්)	ප්‍රතිවර්ගීකරණය/ගැලපුම්	2023 දෙසැම්බර් 31 දිනට
3.1 පිරිවැය					
ඉඩම්	117,266,033,792	20,102,218	(90,296)	(20,301,949,647)	96,984,096,068
මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ	114,380,201,693	1,773,747,479	(16,300,000)	20,058,679,316	136,196,328,488
පාවෙන උපකරණ	7,550,011,189	1,499,256,925	-	-	9,049,268,114
මෙහෙයුම් උපකරණ	27,779,988,818	174,624,443	(34,896,145)	-	27,919,717,116
පිරියන හා යන්ත්‍රෝපකරණ	960,887,209	206,808,779	(41,206,539)	(18,985,000)	1,107,504,449
කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි	1,026,423,320	431,533,781	-	-	1,457,957,100
කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි	454,737,739	6,400,978	(90,000)	-	461,048,717
පරිගණක දෘඩාංග	569,591,235	199,718,141	(462,230)	3,330,000	772,177,146
විදුලි හා විද්‍යුත් උපකරණ	2,740,279,857	500,768,507	(1,879,366)	-	3,239,168,998
කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ	206,065,918	9,257,761	(1,573,778)	(3,387,960)	210,361,941
මොටර් රථ	917,552,101	286,221,180	(7,060,957)	18,985,000	1,215,697,324
වෙනත් වත්කම්	526,282,643	35,549,703	(76,500)	-	561,755,846
	274,378,055,515	**5,143,989,895**	**(103,635,810)**	**(243,328,291)**	**279,175,081,307**

3.1.1 ක්ෂය	2023 ජනවාරි 01 දිනට	වර්ෂය තුළ වෙනස් වීම්	(බැහැර කිරීම්)	ප්‍රතිවර්ගීකරණය/ගැලපුම්	2023 දෙසැම්බර් 31 දිනට
මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ	34,390,145,503	1,793,475,786	(11,398,590)	6,878,685,997	43,050,908,696
පාවෙන උපකරණ	7,068,725,272	302,025,019	-	(1,314,686,797)	6,056,063,495
මෙහෙයුම් උපකරණ	17,608,581,329	1,265,690,070	(34,861,248)	(1,313,338,959)	17,526,071,192
පිරියන හා යන්ත්‍රෝපකරණ	700,396,085	80,999,148	(41,165,337)	57,390,602	797,620,498
කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි	404,724,914	70,412,191	-	5,676,671	480,813,776
කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි	284,313,696	16,915,343	(89,910)	(5,458,787)	295,680,343
පරිගණක දෘඩාංග	405,860,385	71,248,193	(437,555)	3,356,107	480,027,130
විදුලි හා විද්‍යුත් උපකරණ	2,370,913,612	131,480,224	(1,882,909)	79,989,947	2,580,500,874
කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ	162,256,976	15,676,572	(1,571,631)	(3,080,367)	173,281,551
මොටර් රථ	810,341,812	62,908,828	(7,034,057)	(64,403,871)	801,812,711
වෙනත් වත්කම්	426,429,488	25,449,780	(76,424)	-	451,802,845
	64,632,689,074	**3,836,281,154**	**(98,517,660)**	**4,324,130,543**	**72,694,583,110**

3.1.2 ශුද්ධ ධාරණ අගය		2023 දෙසැම්බර් 31 දිනට	2022 දෙසැම්බර් 31 දිනට
දේපළ, පිරියක සහ උපකරණ			
ඉඩම්		96,984,096,068	117,266,033,792
මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ		93,145,419,791	79,990,056,190
පාවෙන උපකරණ		2,993,204,619	481,285,917
මෙහෙයුම් උපකරණ		10,393,645,925	10,171,407,489
පිරියන හා යන්ත්‍රෝපකරණ		309,883,950	260,491,124
කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි		977,143,324	621,698,406
කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි		165,368,375	170,424,043
පරිගණක දෘඩාංග		292,150,016	163,730,850
විදුලි හා විද්‍යුත් උපකරණ		658,668,124	369,366,245
කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ		37,080,391	43,808,942
මොටර් රථ		413,884,613	107,210,289
වෙනත් වත්කම්		109,953,001	99,853,154
		206,480,498,196	**209,745,366,440**
නොනිමි ප්‍රාග්ධන වැඩ	**(සටහන 3.3)**	65,507,364,120	41,381,934,801
		271,987,862,316	**251,127,301,242**

ශ්‍රීලවඅ	2023 දෙසැම්බර් 31 දිනට	2022 දෙසැම්බර් 31 දිනට
දේපළ,පිරියන හා උපකරණ නිරවුල් කිරීමේ ගිණුම්	113,401,865	500,852,270
	113,401,865	**500,852,270**
	272,101,264,181	**251,628,153,512**

1. රු. 113,159,199.33 ක ඉඩම්, රු. 49,436.11 ක විදුලි හා විද්‍යුත් උපකරණ, රු. 193,230.00 ක ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ නිරවුල් කිරීමේ ගිණුමට ඇතුළත් වේ.
2. රු. 65,062,022.07 ක වත්කම් ආගමික ස්ථානවල භාවිතා කෙරේ.
3. වත්කම් ලේඛනයට අනුව 2023.12.31 දින වන භාවිතයේ පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්වල මුළු වටිනාකම රු. 32,263,644,209.01
4. අන්තර් වරාය වත්කම් පැවරුම් වල විස්තර පහත දැක්වේ.

වත්කම් වර්ගය	කොළඹ	ත්‍රිකුණාමලය	මාල්ඩ
ඉඩම්	(3,000,000)	-	3,000,000
පාවෙන උපකරණ	(53,000,000)	53,000,000	-
මෙහෙයුම් උපකරණ	4,700,000	(4,700,000)	-
පරිගණක දෘඩාංග	(2,054,987)	353,700	1,701,287
කාර්යාල ගෘහ භාණ්ඩ හා උපකරණ	(18,745)	-	18,745
මෝටර් රථ	(1,864,433)	1,864,433	-
එකතුව	**(55,238,165)**	**50,518,133**	**4,720,032**

5. සමීක්ෂණ මණ්ඩලය සහිත වත්කම් නිරවුල් කිරීම සඳහා පත් කරන ලද කමිටුව විසින් ගන්නා ලද තීරණය පරිදි වර්ෂය තුළ මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ, කාර්යාල හා සුභසාධන ගොඩනැගිලි, කාර්යමණ්ඩල නිල නිවාස හා වෙනත් ගොඩනැගිලි ඉවතලීම් සඳහා රු. 1,083,705,500 , රු. 431,656,035.00 හා රු. 3,500,000.00 ක් (මිලදී ගැනුම් පිරිවැය) වටිනා ගොඩනැගිලි ප්‍රාග්ධනික කරන ලදී. පෙර කාලයට වලංගු වන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තු වෙනස් වීම් සහ දෝෂයන්ට අනුකූලව ගැලපුම් සිදු කරන ලදී. ගොඩනැගිලිවල වටිනාකම්, අදාළ විෂයභාර නිලධාරීන්ද ඇතුළත් වන වත්කම් යාවත්කාලීන කමිටුව විසින් තීරණය කරන ලදී.

6.වත්කම් ප්‍රතිවර්ගීකරණ විස්තර පහත දැක්වේ.

වත්මන් කාණ්ඩය	ප්‍රතිවර්ගීකරණය කරන ලද්දේ	මුදල (රු.)
පිරියන හා යන්ත්‍රෝපකරණ	මෝටර් රථ	18,985,000
ඉඩම්	මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ	20,049,269,315
	ආයෝජන දේපළ ඉඩම්	260,945,331
ආයෝජන දේපළ	මෙහෙයුම් ගොඩනැගිලි හා වියුහ	9,410,000
	ඉඩම්	8,265,000
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ	පරිගණක දෘඩාංග	3,330,000

3.2 කල්බදු වත්කම්	2023 ජනවාරි 01 දිනට	එකතු කිරීම්	(බැහැර කිරීම්)	2023 දෙසැම්බර් 31 දිනට
සමූහය /ශ්‍රීලවඅ				
පිරිවැය	95,948,157	-		95,948,157
ක්ෂය	26,130,459	11,332,228		37,462,687

	2023 දෙසැම්බර් 31 දිනට	2022 දෙසැම්බර් 31 දිනට
ශුද්ධ ධාරණ අගය	**58,485,470**	**69,817,698**

වසර 05 ක් සඳහා මූලික කල්බදු යටතේ ලබා ගන්නා ලද වත්කම් ඉහතින් නිරූපනය වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

3.3 නොනිමි ප්‍රාග්ධන වැඩ

	ශ්‍රීලවඅ				සමූහය			
සමූහය /ශ්‍රීලවඅ	2023 ජනවාරි 01 දිනට	වර්ෂය තුළ වැය කරන ලද	මාරු කිරීම්	2023 දෙසැම්බර් 31 දිනට	2023 ජනවාරි 01 දිනට	වර්ෂය තුළ වැය කරන ලද	මාරු කිරීම්	2023 දෙසැම්බර් 31 දිනට
ගිණුම් වාර්තා කිරීමේ කාලසීමාවේ අවසන් වන විට, ගිවිසුම් ප්‍රකාරව කල් පිරෙන දිනය දක්වා ඇති ඉතිරි කාලසීමාව මත පදනම්ව අධිකාරියේ මූල්‍ය වගකීම් වල කල්පිරීමේ විශ්ලේෂණ පහත වගුවෙන් නිරූපණය කෙරේ. වට්ටම් නොලැබූ ගිවිසුම් ප්‍රකාර මුදල් ප්‍රවාහයන් වගුවේ අගයන්ගෙන් පෙන්නුම් කෙරේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇත

මූල්‍ය වගකීම්	2023 දෙසැම්බර් 31			2022 දෙසැම්බර් 31		
	වසරකට වඩා අඩු	වසරකට වඩා වැඩි	එකතුව	වසරකට වඩා අඩු	වසරකට වඩා වැඩි	එකතුව
ණය ගැණුම් / රජය	7,821,252,838	63,279,672,079	71,100,924,917	8,924,559,413	78,885,991,365	87,810,550,778
ණය ගැණුම්/ මූල්‍ය ආයතන	329,238,237	2,469,286,799	2,798,525,036	3,612,798,808	2,798,525,037	6,411,323,845
වෙළඳ සහ වෙනත් ණය හිමියන්	4,249,855,218	-	4,249,855,218	3,883,020,370	-	3,883,020,370
එකතුව	**12,400,346,293**	**65,748,958,878**	**78,149,305,171**	**16,420,378,591**	**81,684,516,402**	**98,104,894,993**

සමූහය

මූල්‍ය වගකීම්	2023 දෙසැම්බර් 31			2022 දෙසැම්බර් 31		
	වසරකට වඩා අඩු	වසරකට වඩා වැඩි	එකතුව	වසරකට වඩා අඩු	වසරකට වඩා වැඩි	එකතුව
ණය ගැණුම් / රජය	7,821,252,838	63,279,672,079	71,100,924,917	8,924,559,413	78,885,991,365	87,810,550,778
ණය ගැණුම්/ මූල්‍ය ආයතන	9,928,025,014	2,543,183,809	12,471,208,823	13,211,585,585	2,883,723,647	16,095,309,232
වෙළඳ සහ වෙනත් ණය හිමියන්	4,077,185,148	-	4,077,185,148	3,719,561,731	-	3,719,561,731
එකතුව	**21,826,463,000**	**65,822,855,888**	**87,649,318,888**	**25,855,706,729**	**81,769,715,012**	**107,625,421,741**

3. වෙළඳපොළ අවදානම

අධිකාරියේ ආදායමට හෝ මූල්‍ය ලියකියවිලි වල ඉදිරියට ගෙන ගිය රඳවාගත් අගයට බලපෑමක් ඇති කරනු ලබන, විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත වැනි වෙළඳපොළ මිළ වෙනස්වීමේ අවදානමක් සහිත දෑ වෙළඳපොළ අවදානම ලෙස සැලකේ.

3.1 විනිමය මුදල් අවදානම

ගිණුම් වාර්තාකරණ කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය නිදහසේ පාවීමට ඉඩහැරීමෙන් පසුව, ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇ.එ.ජ.ඩොලරයේ වටිනාකම උච්චාවචනය වීම මගින් අධිකාරියේ මූල්‍ය අවදානම පැනනගියි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුදල් ගණුදෙනු වලින් වැඩි කොටසක් සඳහා භාවිත කරන මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වේ. කෙසේ නමුත්, වරාය පුළුල් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති හා ඇතැම් බැංකු ශේෂ සහ නාවික නියෝජිත ලැබීම් (උදා: APL ලංකා පුද්ගලික සමාගම ආදිය) වලට අදාළ පොළී සහිත ණය ගැණුම් විදේශ මුදල් ඒකක මගින් දක්වා ඇත. (ජපන් යෙන් සහ ඇ.එ.ජ. ඩොලර්) ඇ.එ.ජ.ඩොලරය සහ ජපාන යෙන් නිදහසේ පාවීමේ ප්‍රතිඵලයක් ලෙස ණය ගැණුම් නැවත ගෙවීම් සහ නැව් නියෝජිතයින්ට (උදා: APL ලංකා පුද්ගලික සමාගම ආදිය) සැපයූ සේවාවන් ඉන්වොයිස්ගත කිරීම මගින් පැන නැගුණු රු.1,883,874,738.12 ක මුදල, ඇ.එ.ජ. ඩොලරයට/ ජපන් යෙන් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමෙන් 2023 වර්ෂයේ ගිණුම් වාර්තා කරන කාල සීමාව සඳහා මෙහෙයුම් ප්‍රතිඵල මත බලපෑමක් එල්ල කරන ලදී. කෙසේ නමුත්, එකම මුදල් ඒකකයක් මගින් පවත්වාගෙන යන මුදල් තැන්පතු හරහා ප්‍රති ගෙවීම් සහ ලබාගත් ණය ප්‍රති ගෙවීම සිදුකිරීමට හා මුදල් සංචලනයේ බලපෑම අවම කිරීමට අධිකාරිය විසින් එකම මුදල් ඒකකයක් භාවිතා කරනු ලැබේ.

පොලී සහිත ණය හා විදේශ විනිමය මගින් පාලනය දක්වා ඇති ණය ගැනීම් පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 24 හා 25 බලන්න.

3.2 පොලී අවදානම

බැංකු තැන්පතු, රාජ්‍ය සුරැකුම්පත් සහ ස්ථාවර හා සංචරණ පොලී අනුපාත සමඟ පොලී සහිත ණය ගැනීම් හා සම්බන්ධ වෙළඳපොළ පොලී අනුපාතයේ වෙනස්කම් අධිකාරියේ පොලී අවදානමට හේතු වේ.

රු. 69,270,504,631 (2022 : රු. 86,402,873,460) වන අධිකාරියේ පොලී සහිත ණය සහ ලබාගැනීම් වල පොලී වල අනුපාතයට අනුව ගණනය කෙරෙන අතර අනෙකුත් මුදල වන රු. 4,628,945,322 (2022: රු.7,819,001,164) හි අඩංගු පොලිය ස්ථාවර අනුපාතයට අනුව ගණනය කරනු ලැබේ.


රජයේ සහ රාජ්‍ය බැංකු වල ඇති තැන්පතු ඇතුළුව මුදල් හා බැංකු ශේෂයන් අධිකාරිය සතුව පවතී. අධිකාරිය විසින් ක්‍රියාකාරී ලෙස පොලී අනුපාත චලනයන් අධීක්ෂණය කිරීම තුළින් පොලී අනුපාත අවදානම අධීක්ෂණය කරනු ලබයි.

ණය	2023 (රු.)	2022 (රු.)
වල අනුපාතය		
කොළඹ වරාය පුළුල් කිරීම (දකුණු වරාය)	66,471,979,594	79,991,549,615
නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කිරීම (ලංකා බැංකුව)	-	3,118,941,452
සූරියවැව ක්‍රීඩාංගනය ඉදිකිරීම (මහජන බැංකුව)	2,798,525,037	3,292,382,393
ස්ථාවර අනුපාතය		
කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය	4,331,336,962	7,482,624,777
කන්කසන්තුරය වරායේ ප්‍රතිසංස්කරණය කිරීමේ ණය	297,608,360	336,376,387


2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා


ණය ලබා ගැනීමේ පහසුකම් වල කොන්දේසි

ණය මුදලේ නම	ණය ලබා දෙන ආයතනය	මුදල් ඒකකය	පොලී අනුපාතිකය	ණය මුදල (ණය ලබාදෙන මුදල් ඒකක වලින්)	**2023.12.31** දිනට හිඟ ශේෂය (රු.)	ණය ගැනීමේ පිරිවැය (රු.)
JBIC ණය SLP-41		ජපන් යෙන්	2.60%	4,878,185,478	555,774,705	
SLP-46		ජපන් යෙන්	2.60%	2,644,187,565	1,958,127,335	
SLP-67 i		ජපන් යෙන්	1.80%	1,354,512,318	1,106,794,128	
SLP-67 ii		ජපන් යෙන්	0.75%	217,445,997		
SLP-85		ජපන් යෙන්	0.30%	14,495,000,000	679,606,278	
කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ණය	ඉන්දියාවේ එක්සිම් බැංකුව	USD	1.75%	45,270,000	297,608,360	8,461,906
ADB-2319	ආසියානු සංවර්ධන බැංකුව	ඇ.එ.ජ.ඩොලර්	Libor+0.6%	300,000,000	64,910,180,707	
සූරිය වැව ක්‍රීඩාංගනය ඉදිකිරීම	මහජන බැංකුව	ශ්‍රී ලංකා රුපියල්	AWPLR+2.5%	3,950,858,870	2,798,525,037	
නැගෙනහිර බහළු පර්යන්තය	ලංකා බැංකුව	ඇ.එ.ජ.ඩොලර්	6 Months Libor+4.25%	80,000,000	Fully Settled	
			එකතුව		**72,306,616,550**	**8,461,906**
		උපචිත පොළිය			1,592,833,405	
					73,899,449,955	
		සටහන 24	ණය ලබා ගැනීම් -ශ්‍රී ලංකා රජයෙන්		71,100,924,918	
		සටහන 25	ණය ලබා ගැනීම් -මූල්‍ය ආයතනයන්ගෙන්		2,798,525,037	
					73,899,449,955	


2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මෙහෙයුම් හා වෙනත් වියදම්
60,000
50,000
40,000
30,000
20,000
10,000
-
(10,000)
රු. මිලියන
වියදම් රුපියල් මිලියන 2023
වියදම් රුපියල් මිලියන 2022
වැඩි වීම/ (අඩු වීම)
%
Wages, Salaries & Allowances
Overtime
Fuel, Electricity, Water
Maintenance of Assets
Others
Interest on Foreign Loans
Foreign Exchange Fluctuation
Depreciation
Total Expenses before Taxation
වියදම්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා





ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිඒඑස්/ඒ/එස්එල්පිඒ/01/2023/1 මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 28 දින

සභාපති

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්හි **2023** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - (1) ලේකම් - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

(2) ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පිඒඑස්/ඒ/එස්එල්පිඒ/01/2023/1 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 මැයි 28 දින

සභාපති

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ("අධිකාරිය") සහ එහි පරිපාලිත සමාගම්හි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි 4 වන පරිච්ඡේදයේ 4.3 සිට 4.6 දක්වා වගන්ති ප්‍රකාරව ආයතනයක් විසින් වත්කම් හඳුනාගැනීමේදී එම වත්කම්වලින් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදුවිය යුතු හා එම වත්කම් පොත්වලට ගැනීමට හිමිකමක් පැවතිය යුතුය. එසේම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 7(අ) වන වගන්තිය අනුව දේපළ පිරියත උපකරණ වත්කම් ලෙස හඳුනාගැනීමට වත්කම සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම සිදුවිය යුතු නමුත් වරාය අධිකාරියට අනාගත ආර්ථික ප්‍රතිලාභ සහ හිමිකමක් නොමැති රු.මිලියන 947.5 ක් වූ අක්කර 02 ක රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ ඉඩම, රු.මිලියන 628.5 ක් වූ අක්කර 2 රූඩ් 3 පර්චස් 9.61 ක් වූ නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා පවරාගෙන තිබූ ඉඩම, රු.මිලියන 83.7 ක් වූ අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9 ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිවෙත පවරාගෙන තිබූ ඉඩම සහ රු.මිලියන 19.8 ක් වටිනා අක්කර 4 රූඩ් 3 පර්චස් 3.2 ක් වූ කිඹුලාවල ඉඩමෙහි අධිකාරියට අයත් නොවන කොටසෙහි වටිනාකම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සඳහා සංකල්පනාත්මක රාමුවෙහි QC 22 වගන්තිය ප්‍රකාරව සමාන අයිතම සඳහා සමාන ක්‍රමවේදයක් භාවිතාකළ යුතු වුවද, 2023 වර්ෂය සඳහා ලාභාංශ ආදායම වූ රු.මිලියන 2,058.5 තුළ ආයෝජිත සමාගමක් වන දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම (SAGT) විසින් ගෙවූ රදවාගැනීමේ බද්ද සහිත දළ ලාභාංශය වූ රු.මිලියන 1,479 ක ආදායම ගිණුම්ගතකර තිබූ අතර පරිපාලිත සමාගමක් වන ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT Ltd) විසින් ගෙවූ ශුද්ධ ලාභාංශය ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව ලාභාංශ ආදායම රු.මිලියන 221 ක් කින් අධිගණනයවී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 9 හි 5.1.1 වගන්තිය අනුව වෙළඳ ණයගැතියන් හැර අනෙකුත් මූල්‍ය වත්කම් සාධාරණ අගයට හඳුනාගත යුතු අතර ප්‍රමිතයේ B 5.1.2 A හි b අනුව මුල්වරට හඳුනාගැනීමෙන් පසු ආයතනය විසින් මූල්‍ය වත්කම්වල විලම්බිත වෙනස (Deferred difference) ගිණුම්ගත කළ යුතු වුවද, අධිකාරිය විසින් රු.මිලියන 6,299 ක් වූ සේවක ණය සම්බන්ධයෙන් විලම්බිත වෙනස වාර්ෂිකව ගිණුම්වල ගැලපීම්කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 9 හි 5.4.1 වගන්තිය අනුව සහ අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්ති 2.6.3 ප්‍රකාරව පොලී ආදායම සඵල පොලී අනුපාතයට හඳුනාගත යුතු නමුත් අධිකාරියේ ස්ථාවර තැන්පතු පොලී ආදායම සඵල පොලී අනුපාතය වෙනුවට වෙළඳපොල පොලී අනුපාතයට ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 10 හි B 92 අනුව සමූහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා මව් සමාගම හා එහි පරිපාලිත සමාගම එකම මූල්‍ය වාර්තාකරණ දිනයට පවතින මූල්‍ය ප්‍රකාශන භාවිතා කළ යුතු අතර B 93 වගන්තිය ප්‍රකාරව මව් සමාගමේ මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ දිනට වෙනස්වූ මූල්‍ය වාර්තා දිනයකට පරිපාලිත සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි නම්, වැදගත් ගනුදෙනු හා සිදුවීම (Significant Transaction and events) සඳහා ගැලපිම් කළ ආසන්නතම මූල්‍ය ප්‍රකාශන යොදාගත යුතු නමුත් අධිකාරිය විසින් සමූහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ සමාගමෙහි (MPMC) ආයෝජන ගිණුම්ගත කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන පැවතියද 2022 දෙසැම්බර් 15 දිනට විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන භාවිතාකර තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 27 වගන්තියට අනුව අස්ථිත්වයක් මුදල් ප්‍රවාහ තොරතුරු හැරෙන්නට එහි මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කළ යුතු බව සඳහන් වුවද, අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්ති අංක 52 අනුව නිශ්කාෂණය කර නොගත් ආනයනික බහාලුම්/ වාහන නිශ්කාෂණය කරගන්නා තෙක් ලැබිය යුතු ආදායමක් සේ හඳුනා නොගන්නා බව සඳහන් වන අතර 2023 වර්ෂය සඳහා පූර්ණ බහාලුම් සඳහා ලැබිය යුතු බිම් කුලී ආදායම් ලෙස රු.මිලියන 1,672 ක වටිනාකමක්ද අර්ධ බහාලුම් (වාහන) සඳහා ලැබිය යුතු බිම් කුලිය ආදායම ලෙස රු.මිලියන 1,102 ක වටිනාකමක්ද 2023 මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමක් පමණක් සිදුකර තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 7 වන වගන්තියට අනුව කෙටි කාලීනව පරිනත වන මුදල් සමාන දෑ ආයෝජන යටතේ හඳුනානොගෙන මුදල් හා මුදල් සමාන දෑ යටතේ හඳුනාගත යුතු වුවත් අධිකාරිය විසින් රු.මිලියන 7,102 ක් වටිනා පරිනත කාලය මාස 03 ට අඩු තැන්පතු, අනෙකුත් මූල්‍ය වත්කම් යටතේ හඳුනාගෙන තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 16 වන වගන්තිය අනුව මූල්‍ය අයිතම (Monetary Items) යනු ස්ථාවරව හඳුනාගත හැකි විදේශ මුදල් ඒකක ගණනක් ලැබීමට හිමිකම් ඇති හා ගෙවීමට බැඳීමක් ඇති අයිතම වන අතර එම ප්‍රමිතයෙහි 23 (අ) වගන්තිය අනුව එක් එක් වාර්තාකරණ අවසන් දිනට විදේශ මුදල් ඒකකවලින් පවතින මූල්‍ය අයිතම අවසන් අනුපාතය (Closing Rate) යටතේ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකයට පරිවර්තනය කළ යුතුය. එසේම ප්‍රමිතයේ 8 වන වගන්තිය අනුව අවසන් අනුපාතය යනු වාර්තාකරණ දිනට පවතින එතැන් විනිමය අනුපාතය (Spot Rate) වේ. නමුත් අධිකාරිය විසින් පවතින එතැන් විනිමය අනුපාතය භාවිතා නොකිරීම හේතුවෙන් වාර්තාකරන දිනට ඌන ගණනය වූ නැව් නියෝජිත ණයගැති ශේෂය රු.මිලියන 45 ක් ද ලැයිස්තුගත නොකළ සමාගම්වල ආයෝජන රු.මිලියන 1,141 ක් ද ලැබිය යුතු පුරස්කාරය SAGT සමාගමෙන් රු.මිලියන 2.4 ක් ද හම්බන්තොට ජාත්‍යන්තර

වරාය සමූහය (HIPG) සමාගමෙන් රු.මිලියන 0.94 ක් ද කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (CICT) සමාගමෙන් රු.මිලියන 4.3 ක් ද මුදල් හා මුදල් සමාන දෑ රු.මිලියන 70 කින් සහ ස්ථාවර තැන්පතු රු.මිලියන 1,319 ක් වූ අතර වාර්තාකරණ දිනට අධිගණනය වූ විදේශ ණය වටිනාකම රු.මිලියන 626 ක් විය.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 21 වන වගන්තිය අනුව විදේශ මුදල් ඒකකයන් සහිත ගනුදෙනු මුල්වරට හඳුනාගැනීමේදී (Initial Recognition) ආයතනය විසින් ගනුදෙනුව සිදුකරන දිනට පැවති එතැන් විනිමය අනුපාතය (Spot rate) භාවිතාකළ යුතු වුවද,

i. 2023 වර්ෂය සඳහා CICT සමාගමෙන් සහ SAGT සමාගමෙන් අයවිය යුතු පුරස්කාර ආදායම ගිණුම්ගත කිරීමේදී එතැන් විනිමය අනුපාතය භාවිතා නොකිරීම හේතුවෙන් පුරස්කාර ආදායම පිළිවෙලින් රු.මිලියන 91.86 කින් සහ රු.මිලියන 42.72 කින් අධිගණනය වී තිබුණි.

ii. අධිකාරිය විසින් ආදායම් හඳුනාගැනීමේදී එතැන් විනිමය අනුපාතය (Spot Rate) හෝ මිලට ගැනුම් අනුපාතය (Buying Rate) යොදාගැනීම වෙනුවට, වැඩි අගයක් සහිත විකුණුම් අනුපාතය (Selling Rate) යොදාගෙන තිබීම නිසා එම වෙනසට සමාන වටිනාකමකින් අධිකාරියේ ආදායම අධිතක්සේරු වී තිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 හි 14 (ඇ) වගන්ති ප්‍රකාරව මෙහෙයුම් ලාභයෙහි සැලකිය යුතු පහලයාමක් වත්කමෙහි හානිකරණය සම්බන්ධව අභ්‍යන්තර හැඟවීමක් (Indication) වන අතර පරිපාලිත සමාගමක් වන MPMC වර්ෂ 2015 සිට 2022 දක්වා පිළිවෙලින් රු.මිලියන 7,602 ක මෙහෙයුම් අලාභ සහ රු.මිලියන 7,527 ක සෘණ ශුද්ධ වත්කම් ලබා තිබූ අතර එය ආයෝජන හානිකරණය සඳහා අභ්‍යන්තර තොරතුරු මූලාශ්‍රයක් වන අතර ප්‍රමිත අංක 36 හි 9 වන වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් එක් එක් මූල්‍ය වාර්තාකරණ දිනයට වත්කම් හානිකරණය තක්සේරු කළ යුතු නමුත් අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශනවල MPMC හි ආයෝජන වටිනාකම රු.මිලියන 75 ක් ලෙස වාර්තාකර තිබුණ ද සමාගම සම්බන්ධව හානිකරණ වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 හි 118 (ආ) වන ඡේදය අනුව සීමිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව්කළ යුතු වුවත් අධිකාරියේ 2023 වර්ෂයේ අවසන් ගිණුම්හි 2.5.3 අනුව අස්පෘශ්‍ය වත්කම් එහි ඵලදායී ජීවකාලය තුළ වසර 1 සිට වසර 17 ක් දක්වා වූ වර්ෂ ගණනකින් හෝ සියයට 5.88 සිට සියයට 100 දක්වා වූ ප්‍රතිශතයකින් ක්‍රමක්ෂය කළ යුතුය යන්න සඳහන් වුවද, ක්‍රමක්ෂය ක්‍රමවේදය හෙළිදරව්කර නොතිබුණි.

(ඕ) විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

මුළු වටිනාකම රු.මිලියන 422.6 ක් වන අධිකාරියේ ගාලු වරාය ව්‍යාපෘතිය හා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල වෙනුවෙන් වැය කරනු ලැබූ නොනිමි වැඩ තුළ අන්තර්ගතව පැවති පිළිවෙලින් රු.මිලියන 418 සහ රු.මිලියන 4.6 වටිනාකම් පෙර වර්ෂයේ ගැලපුම් (Prior Year Adjustment) ලෙස ගිණුම්වලින් ඉවත්කර තිබූ නමුත් ඊට අදාල අනුමැතිය ලබාගැනීමට කටයුතුකර නොතිබුණි.

(ක) නැව් නියෝජිත ආයතනයකින් ලැබිය යුතු ශේෂය ලෙස රු.මිලියන 2,204 ක් අධිකාරියේ ගිණුම්වල දක්වා තිබුණ ද නැව් නියෝජිත ආයතනයෙන් ලබා දුන් ශේෂ සනාථ අනුව එම වටිනාකම රු.මිලියන 595 ක් විය. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ රු.මිලියන 1,609 ක වෙනසක් පැවතුණ අතර අදාල සමාගම සමඟ මෙම වෙනසට හේතු සොයාබලා ඊට අදාල සැසඳුම් කර නොතිබුණි.

(ග) හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ (අදියර I) විවල්‍ය නියෝගය අංක 06 යටතේ හම්බන්තොට සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීමට මහජන බැංකුවෙන් ලබාගත් ණය සඳහා පොළී සහ ප්‍රාග්ධනය ආපසු ගෙවීමට හා ගෙවීමට අදාළ ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් අධිකාරිය ඉල්ලා සිටින විට සැපයිය යුතු නමුත් මෙම රු මිලියන 2,798.5 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ශේෂ සනාථ මගින් තහවුරු කර නොතිබූ අතර තවදුරටත් මෙම ශේෂය මහා භාණ්ඩාගාරයේ පොත්පත්වල දක්වා නොතිබුණි. තවද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.මිලියන 2,798.5 ක් සහ බැංකුවෙන් ලැබුණු තහවුරු කිරීම අනුව ණය ශේෂය රු.මිලියන 2,963.1 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව සහ ශේෂ සනාථ අතර රු.මිලියන 164.6 ක වෙනසක් විය.

(ච) අධිකාරියේ මූල්‍ය කාර්යය පරිපාටි සංග්‍රහයේ 9.3.1 වගන්තිය අනුව අධිකාරියට ලැබිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සෘජුව හෝ අනියම් ලෙස වගකිව යුතු නිලධාරීන් ඒවා හිඟ මුදල් බවට පත්වීමට ඉඩ නොහරින බවට වගබලා ගැනීම සඳහා සෑම සැලකිල්ලක්ම දැක්විය යුතු බව සඳහන් වන අතර 2023 නොවැම්බර් 03 දිනැති අංක මුකො/මුගි/කො/41/2023 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 9.15 වගන්තියට අනුව ද බදු දී ඇති පරිශ්‍ර වෙනුවෙන් ලැබිය යුතු බදු මුදල් සහ විදුලි බිල් ප්‍රතිපූර්ණයන් නියමිත කාලය තුළ අප්‍රමාදව එකතුකර ගැනීමට ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ. එසේ වුවද, 2023 දෙසැම්බර් 31 දිනට මාස 6 ඉක්මවූ පරිශ්‍ර කුලී ණයගැතියන් රු.මිලියන 230.7 ක් වූ අතර එය මුළු පරිශ්‍ර කුලී ණයගැතියන්ගෙන් සියයට 93 ක් විය. තවද, කොළඹ වරායේ 2023 දෙසැම්බර් 31 දිනට පරිශ්‍ර අංශයේ උපලේඛන අනුව රු.මිලියන 61.71 ක හිඟ පරිශ්‍ර බදුකුලී ශේෂයක් පැවති අතර මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු බදුකුලී ආදායම රු.මිලියන 225.9 ක් විය. ඒ

අනුව මූල්‍ය ප්‍රකාශන හා පරිශ්‍ර අංශයේ තොරතුරු අතර රු.මිලියන 164.19 ක වෙනසක් විය.

(ජ) හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර රාජකාරී වෙනුවෙන් හා ඉඩම් එළිපෙහෙලි කිරීමට අදාලව 2014 වර්ෂයේදී රු.මිලියන 4.39 මුදලක් ද, ඉඩම් අහිමිවූවන්ට වන්දි ගෙවීම සඳහා 2015 සහ 2016 වර්ෂයන්හිදී රු.මිලියන 108.77 ක මුදලක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙවා තිබුණි. 2021 අප්‍රේල් 30 දින වන විට අදාල වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාව අධිකාරිය වෙත ලැබී තිබූ නමුත් වැය කරන ලද රු.මිලියන 113.16 ක මුදල ඉඩම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඣ) අධිකාරිය විසින් MV Jammi නෞකාව සඳහා ලබාදෙන ලද සේවා සඳහා අයවිය යුතු මුදල් වෙනුවෙන් කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර එහිදී ලද තීන්දුව අනුව රු.මිලියන 197.09 (ඇ.ඒ.ජ ඩොලර් 1,945,712) ක මුදලක් අදාල යාත්‍රාවෙන් අධිකාරිය වෙත ලැබිය යුතුව තිබුණි. අදාල නෞකාව වෙන්දේසියෙන් ලද මුදල අධිකරණයේ තැන්පත් කර තිබුණු බවත් එම මුදල් සඳහා නිම්කම් සහිත විවිධ පාර්ශවයන් වෙත අදාල මුදල් ප්‍රමාණයන් මුදාහැරීමෙන් පසුව ඉතිරි වූ මුදල වන ඇ.ඒ.ජ ඩොලර් 692,080 ක මුදල සම සමව බෙදා ගැනීමට පෙත්සම්කාර Sri Lanka Shipping Company Limited හා අධිකාරිය 2017 පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව එකඟතාවයකට පැමිණ තිබුණි. තවද, මහාධිකරණ රෙජිස්ට්‍රාර් විසින් මෙම නඩුවට අදාළ අනිකුත් ලිපිගොනුවලද මෙම යාත්‍රාවට අදාළ කිසිදු මුදලක් තැන්පත් වී නොමැති බවට පවසා සිටින ලද බව ප්‍රධාන නීති නිලධාරී දන්වා තිබුණි. ඒ අනුව ඉතිරි මුදලෙන් ඇ.ඒ.ජ ඩොලර් 346,040 හි රුපියල් අගය වූ රු.මිලියන 112.08 ක් ලැබිය යුතු ණයගැති වටිනාකම ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් ලැබිය යුතු මුළු මුදල වූ ඇ.ඒ.ජ ඩොලර් 1,945,712 හි රුපියල් වටිනාකම වූ රු.මිලියන 197.09 ක් ගිණුම් වල දක්වා තිබුණි. ඒ අනුව වත්කම් රු.මිලියන 85.01 කින් අධිගණනයවී තිබුණි.

(ට) 2010 වර්ෂයේදී SAGT සමාගම ආරම්භ කරන අවස්ථාවේදී අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණු බව මූල්‍ය ප්‍රකාශනවල 12.2 සටහනේ දක්වා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබූ මෙම මුදල හෝ කොටස්වල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අධිකාරිය වෙත ලබා දී නොතිබූ අතර අදාල සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට ශේෂ සනාථ මගින් ලබා දී තිබුණු අතර අධිකාරිය ඉහත ලැබිය යුතු කොටස් වටිනාකම සඳහා හානිකරණ වෙන්කිරීමක් ද සිදුකර නොතිබුණි.

(ඩ) 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 6(2) වගන්තිය අනුව ආදායම් බදු ගණනයේදී ප්‍රාග්ධන වත්කම් හා වගකීම් උපලබ්ධි කිරීම (Capital asset realization gain) මගින් ඇතිවන ලාභ සලකා බැලිය යුතු අතර බදු පනතේ 7 (2) b වගන්තිය අනුව ආයෝජිත වත්කම්

උපලබ්ධිය මගින් ලැබෙන ආදායමද බදු ගණනයේදී සලකා බැලිය යුතු වේ. මෙම ගණනයේදී මෙම වත්කම්වල 2017 සැප්තැම්බර් 30 දිනට පැවති වෙළඳපොල මිල පදනම් කරගත යුතු අතර මෙමගින් ආයෝජිත හා ප්‍රාග්ධන වත්කම්වලට ප්‍රත්‍යාගණන ලාභය මත විලම්බිත බදු වගකීම සඳහා වෙන්කිරීමක් සිදුකළ යුතුය. නමුත් අධිකාරිය විසින් විලම්බිත බදු වගකීම ගණනයේදී තම ප්‍රාග්ධන හා ආයෝජිත වත්කම්වලින් ප්‍රත්‍යාගණන ලාභ මත වන විලම්බිත බදු වගකීම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1. මාගේ වාර්තාවේ තාත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) **(iii)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 **(i)** (ඈ) **(iv)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද අංක 1.2 (එ)**(ii)**, (ජ), (ඤ), (ට), 2.3 (ඉ) යන ඡේද සඳහා වූ නිර්දේශ හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති/ විධානයට යොමුව	**නිරීක්ෂණය**
(අ)	මුදල් රෙගුලාසි අංක 1646 සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2003 අප්‍රේල් 25 දිනැති අංක 10/2003 චක්‍රලේඛය	ගමන් පිළිබඳ මාසික සාරාංශය වාහන භාර නිලධාරීන් විසින් වාර්තා ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථමයෙන් 26,8 (අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන්, විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.
(ආ)	1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතෙහි 39 වන වගන්තිය	"අධිකාරියේ යම් මාර්ගස්ථ මඩුවල තබන ලද බඩු කිසිවක්, ඒවා ඒ මඩුවල තබන ලද වේලාවේ සිට දින 21 ක කාලයක් තුළ මඩුවලින් ඒවා ඉවත්කර නොගන්නා ලද අවස්ථාවක ඒ වන තුරුත් ඒ මඩුවල තිබෙන ඒ බඩු සියල්ලම හෝ එකී බඩු අතුරින් යම් කිසිවක් හෝ ඒ කාලය ඉකුත් වූ විට 40 වන වගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව අධිකාරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකිය." ගාස්තු නිදහස්

		කාලසීමාව ඉක්මවා දින 2825 සිට දින 6922 දක්වා වූ කාල පරාසයක් වරාය පරිශ්‍රය තුළ පැවති බහාලුම් 08 ක අන්තර්ගත භාණ්ඩ/ ද්‍රව්‍ය කුමක්ද යන්න හඳුනාගැනීමට නොහැකිවී තිබුණු අතර දීර්ඝ කාලයක් ගතවී ඇතත් එම බහාලුම් සම්බන්ධයෙන් පනතෙහි 39 වන වගන්තිය ප්‍රකාරව අධිකාරිය කටයුතු කර නොතිබුණි.
(ඇ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 150 වගන්තිය යටතේ 1(අ)(ආ)(ඇ) ඡේද	සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍ර දිනට අදාළව සම්පූර්ණ කර ඇති බවත් මූල්‍ය ප්‍රකාශන පනතේ නියමයන්ට අනුව සහතික කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකු විසින් දින යොදා අත්සන් කර ඇති බවට හෝ සමාගමෙහි ඇත්තේ එක් අධ්‍යක්ෂවරයෙකු පමණක් නම් ඒ අධ්‍යක්ෂවරයා විසින් දින යොදා අත්සන් යොදා තිබිය යුතු නමුත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිපාලිත සමාගමක් වන ලංකා ගෑස් ටර්මිනල් සමාගම 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා විගණනය සඳහා ඉදිරිපත්කළ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂකවරුන්ගේ අත්සන් රහිත, පනත ප්‍රකාරව සහතික කළ මූල්‍ය ප්‍රකාශන නොවුණි. තවද, මෙහෙයුම් කටයුතු සිදු නොවන බවට මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව්කර තිබූ අතර විගණන කමිටුව මගින් එම සමාගම ඇවර කිරීමට යෝග්‍ය පියවර ගැනීමට යෝජනාකර තිබුණද, 2023 වර්ෂය අවසාන දින වන විටත් ඒ සම්බන්ධව අධිකාරිය කටයුතුකර නොතිබුණි.
(ඈ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3 වන වගන්තිය, 2009 ජූනි 17 දිනැති අංක 09/2009 (I) දරන චක්‍රලේඛය හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛය	සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා සියළුම නිලධාරීන් විසින් කාර්යාලයට පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සනාථ කිරීම සඳහා ඇඟිළි සලකුණු යන්ත්‍ර භාවිතා කර වාර්තා තබා ගැනීමට පියවර ගතයුතු වුවත් ඔලුවිල් සහ කන්කසන්තුරය වරායන්වල ඇඟිළි සලකුණු යන්ත්‍ර (Finger Scaner Machine) ස්ථාපිතකර නොතිබුණි.
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	

	සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත යහපාලන මාර්ගෝපදේශය	
	(i) වගන්තිය අංක 2.2.5 සහ 2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ වගන්ති අංක 2 හා 3	පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා එවැනි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර මව් සමාගම තම පරිපාලිත සමාගම්වල කාර්යයසාධනය අධීක්ෂණයට ක්‍රමවේදයක් සකස්කර තිබිය යුතු වුවද, එලෙස සිදුකර නොතිබුණි.
	(ii) වගන්ති අංක 4.3	අවදානම් කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂකවරු තිදෙනෙකු. (03) නියෝජනය කළයුතු අතර ත්‍රෛමාසිකව කමිටුව රැස්විය යුතු වුවද, 2023 මාර්තු 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සපයන ලද තොරතුරු අනුව 2022 පෙබරවාරි 25 දින පත්කරන ලද අවදානම් කමිටුවෙහි දැනට සාමාජිකයන් දෙදෙනෙකුගෙන් (02) පමණක් සමන්විත වී තිබූ අතර අවදානම් කමිටුව ත්‍රෛමාසිකව රැස් වී නොතිබුණි.
(ඊ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.10.2 වගන්තිය	(i) කොන්ත්‍රාත්තුවේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 250,000 ට වැඩි නම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම වැඩි වශයෙන් අලෙවි වන එක් ජාතික පුවත්පතක ද ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන වෙබ් අඩවියේද රජයේ ගැසට් පත්‍රයේද පලකිරීම අනිවාර්ය ලෙස දැක්වුවද ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 40,273.67 (වැට් රහිත) ක් වූ East Container Terminal Phase II Civil Works කොන්ත්‍රාත්තුව Acess – CHEC JV හට ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. (ii) 2021 ජූලි 07 වන දින පැවති අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ රැස්වීම් වාර්තාවේ 2.7 වගන්තිය අනුව ලංසු තැබීමේ කාලය සති 02 කින් දීර්ඝ කිරීමට තීරණය කිරීම සහ ඒ අනුව නව දිනය ලෙස ලංසු අවසන් කිරීම 2012 ජූලි 14 ලෙස තීරණය කර තිබූ අතර 2021 ජූනි 16 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම්

		වාර්තාවේ 2.3 වගන්තිය අනුව ලංසු අවසන් කිරීම 2021 ජූලි 14 දින ලෙසත්, ලංසු ලේඛන නිකුත් කිරීමේ කාලය 2021 ජූලි 12 වන දින දක්වා කල්දමන බවටත් තීරණය කර තිබුණි. 2021 ජුනි 07 සහ 2021 ජුනි 16 රැස්වීම් වාර්තාවල පිළිවෙලින් 2.8 සහ 2.4 වගන්ති අනුව මෙම කාලය වෙනස් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙබ් අඩවියේ සහ විදේශ දූත මණ්ඩලවල දැන්වීම් පල කිරීමට කටයුතු කර නොතිබුණි.
(උ)	2023 නොවැම්බර් 03 දිනැති අංක මුකො/මුගි/කො/41/2023 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 2.12 වගන්තිය	සියළුම කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් විසින් ලබාගත් අත්තිකාරම් මුදල් අදාල වර්ෂය අවසානයට පෙර නිරවුල් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ විවිධ කොට්ඨාශ විසින් අවස්ථා 35 ක දී ලබාගෙන තිබුණු රු.මිලියන 627.66 ක් වූ අත්තිකාරම් ශේෂයක් ගිණුම් අංක 142341 (FA0001) යටතේ පැවති අතර එම ශේෂය 2023 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3. වෙනත් කරුණු

(අ) විශාල නැව් මෙහෙයවීමෙන් ලැබෙන තරහකාරී වාසිය වරාය අධිකාරිය වෙත අත්පත්කර ගැනීමේ අරමුණින් ජය බහාලුම් පර්යන්තයේ (JCT) හි දිග මීටර් 120 කින් දීර්ඝ කිරීමට සහ ගැඹුර මීටර් 15 ක් ලෙස නැවතොට සකස් කිරීම සඳහා රු.මිලියන 5,035.30 (VAT රහිත) ක් වූ JCT-V ව්‍යාපෘතියට 2017 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ අතර එය ගිවිසුම් ප්‍රකාරව 2022 ජූලි 22 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද ඒ සඳහා 2023 දෙසැම්බර් 31 දක්වා තවත් අමතර කාල දිගුවක් ලබාදී තිබූ අතර එහි 2023 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 82.6 ක් විය.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ණය කාලසීමාව ඉක්මවූ මුළු නැව් නියෝජිත ණයගැති ශේෂය රු.මිලියන 1,791 ක් විය. එය මුළු නැව් නියෝජිත ණයගැති ශේෂයෙන් සියයට 41 ක් විය.

(ඇ) නැව් නියෝජිතයින් විසින් කලින් ගෙවන ලද අත්තිකාරම් පියවීමෙන් පසු, 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති ශේෂය රු.මිලියන 913.49 ක් වූ අතර එයින් රු.මිලියන 232.50 ක් මාස 06 සිට වර්ෂ 5 ඉක්මවා තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, එම නැව් නියෝජිතයින් විසින් ඉන්ධොයිස් වටිනාකමට වඩා වැඩියෙන් ගෙවන ලද රු.මිලියන 2,407 ක් නැව් නියෝජිත බැර ශේෂ (Shipping Agent Credit Balances) ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට එයින් රු.මිලියන 388 ක්, මාස 06 සිට වර්ෂ 5 ක කාල පරාසයක් දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඈ) 2023 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂ සම්බන්ධයෙන් නඩු කටයුතු ආරම්භ කර ඇති (Under Litigation) නැව් නියෝජිත ණයගැති වටිනාකම රු.මිලියන 439 ක් වූ අතර එයින් කොළඹ වරායට අදාල රු.මිලියන 406 ක ශේෂය සඳහා ණයගැතියන් 13 දෙනෙකු (Marshal of Admiralty High Court ඇතුළුව) මූල්‍ය කොට්ඨාශය මගින් දක්වා තිබුණ ද එම වටිනාකම තුළ වූ රු.මිලියන 65 ක ණයගැතියන් 6 දෙනෙකු සම්බන්ධයෙන් නඩු පවරා ඇති බවට නීති කොට්ඨාශය මගින් විගණනය වෙත සනාථ කර නොතිබුණි. තවද අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට වසර 5 ඉක්ම වූ නැව් නියෝජිත ණයගැති ශේෂය රු.මිලියන 369 ක් වූ අතර එයින් රු.මිලියන 358 ක් නීති කටයුතු සඳහා යොමු කළ ණයගැතියන් වුව ද රු.මිලියන 12 ක් සඳහා නීති කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) අධිකාරිය විසින් දීර්ඝ කාලීනව මුදල් අයකරගෙන නොතිබූ රු.මිලියන 42.25 ක වටිනාකමකින් යුත් නැව් නියෝජිත ණයගැතියන් 2 ක් සම්බන්ධයෙන් පවරන ලද නඩු කටයුතු වල නියෝග අධිකාරියට පක්ෂව තීන්දු කර ඇති බව නීති කොට්ඨාශය විසින් විගණනය වෙත දන්වා තිබුණි. කෙසේ වුවද, නියෝග දිනයේ සිට දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද එම තීන්දු ක්‍රියාත්මක කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අධිකාරිය විසින් දීර්ඝ කාලීනව මුදල් අයකරගෙන නොතිබූ රු.මිලියන 5.2 ක වටිනාකමකින් යුත් නැව් නියෝජිත හා පරිශ්‍ර කුලී ණයගැතියන් 4 ක් සම්බන්ධයෙන් පවරන ලද නඩු කටයුතුවල තීන්දුව අධිකාරියට පක්ෂව ලැබී තිබුණ ද ණයගැතියන්ගේ නිවැරදි ලිපිනයන් නොමැති වීම හේතුවෙන් අදාල මුදල් අයකර ගැනීමේ ඉදිරි පියවර ගෙන නොතිබුණ අතර අධිකාරියට අයවිය යුතු වරාය ගාස්තු රු.මිලියන 6.7 ක මුදල අයකර ගැනීම සඳහා පුද්ගලික ආයතනයකට විරුද්ධව නඩුවක් ගොනුකර තිබුණ ද වගඋත්තරකරුගේ නිවැරදි ලිපිනය නොමැතිව නොතීසි භාරදීමට නොහැකි වී තිබුණි.

(උ) 2023 දෙසැම්බර් 31 දිනට ආරවුල් සහිත ණයගැතියන් (dispute debtors) රු.මිලියන 53 ක් සහ නැවත විසඳීම සඳහා (re-dispute) යොමු කළ ණයගැතියන් රු.මිලියන 25 ක් පැවතුණි. ඉහත ආරවුල් සහිත ණයගැති ශේෂ තුළ මාස හයක්, වර්ෂයක් හා වර්ෂ 1 ත් 5 ත් අතර කාල පරිච්ඡේද

තුළ නොවිසඳුණු ශේෂ පිළිවෙළින් රු.මිලියන 18.8 ක්, රු.මිලියන 29.5 ක් හා රු.මිලියන 4.6 ක් වී තිබුණි. නැවත විසඳීම සඳහා යොමු කළ ණයගැති ශේෂ තුළ මාස හයක් හා වර්ෂයක් අතර කාල පරිච්ඡේද තුළ නොවිසඳුණු ශේෂ පිළිවෙලින් රු.මිලියන 22.23 සහ රු.මිලියන 2.4 ක් වී තිබුණි.

(උ) පරිශ්‍ර කුලී ණයගැති ශේෂය තුළ පවත්නා පුද්ගලික ආයතනයකට අදාල ණයගැති ශේෂය කල්බදු ගිවිසුම "දෙපාර්ශවය විසින්ම ගිවිසුම් කොන්දේසි කඩකිරීම" මත 2022 පෙබරවාරි 25 දිනැති PAM/42/2022 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව අවලංගු කර තිබුණු අතර 2022 නොවැම්බර් 30 දිනැති PAM/237/2022 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව අවලංගු කරන ලද කල්බදු ගිවිසුම නැවත ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් කටයුතු කර තිබුණි. එසේ වුවද, 2023 දෙසැම්බර් 31 දිනට එම ණයගැතියාගෙන් ලැබිය යුතු රු.මිලියන 77 ක ශේෂය අයකරගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ශේෂය තුළ මාස 06-12 අතර රු.මිලියන 11 ක් හා වර්ෂ 01 ඉක්මවූ වටිනාකම රු.මිලියන 66 ක් ව පැවතුණි. තවද මෙම ශේෂය කපාහැරීමට තීරණය කර තිබුණි.

(එ) කොළඹ 10 විජේවර්ධන මාවතේ සන්නිවේදන කුලුණ ඉදිකරන ස්ථානය අසල ඇති ඉඩම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබාදීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය වන රු.මිලියන 37.9 තුළ වර්ෂයක් හා වර්ෂ 1 ත් 5 ත් අතර කාල පරිච්ඡේද තුළ නිරවුල් නොවූ ශේෂ පිළිවෙලින් රු.මිලියන 8.2 ක්, රු.මිලියන 29.7 ක් පැවතුණි. අධිකාරිය විසින් අදාල ආයතනය වෙත දැනුවත් කිරීම් කර තිබුණ ද, විගණිත දින වන විටත් මෙම මුදල් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණු අතර අධිකාරිය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යන ආයතන දෙක කල්බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඒ) අධිකාරියේ මිලදී ගැනීම් වෙනුවෙන් විවිධ අවස්ථාවලදී සැපයුම්කරුවන් වෙත ගෙවූ රු.මිලියන 179.12 ක් වූ අත්තිකාරම් ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුළ ගෙවීම් කරන ලද රු.මිලියන 1.5 ක ශේෂයක් ද, මාස 2 ඉක්මවූ රු.මිලියන 160.6 ක් සහ වසර ඉක්මවූ රු.මිලියන 4.3 ක ශේෂයක් ද 2023 දෙසැම්බර් 31 දිනට නොපියවා පැවතුණි.

(ඔ) අධිකාරිය විසින් බාහිර පාර්ශවයන් සඳහා ආහාර සහ තේ සැපයීම වෙනුවෙන් අධිකාරිය වෙත ලැබිය යුතු රු.මිලියන 5.06 ක ශේෂයක් 2023 දෙසැම්බර් 31 දින වන විට නොපියවා පැවතුණි. තවද, එම ශේෂය තුළ වසර 5කට වැඩි කාලයක් නිරවුල් නොවී පැවති ශේෂය රු.611,847 ක ශේෂයක් ද, වසර 2 ඉක්මවූ රු.244,768 ක ශේෂයක් ද, වසර 1 ඉක්මවූ රු.මිලියන 1.4 ක ශේෂයක් ද පැවතුණි.

(ඕ) කන්කසන්තුරය වරායට අයත් රු.මිලියන 72 ක් වූ අක්කර 16 ක භූමි ප්‍රමාණය සඳහා මෙතෙක් අධිකාරියට අයිතිය පැවරී නොමැති අතර අදාල භූමිය සම්බන්ධයෙන් හිමිකමක් අධිකාරියට නොතිබුණි.

(ක) 2023 දෙසැම්බර් 31 දින වන විට බදු කාලසීමාව අවසන්ව තිබූ පර්චස් 31.67 ක් වන බදු ගිවිසුම් 03 ක් 2024 වර්ෂයේ මුල් කාර්තුව වන තෙක් යාවත්කාලීන කර නොතිබුණි.

(ග) අධිකාරිය සතුව පවතින අක්කර 03 රූඩ් 03 පර්චස් 24.47 ක ප්‍රමාණයක් සහිත ඉඩම් කැබලි 08 ක් කල්බදු ගැනුම්කරු සමග බදු ගිවිසුමක් රහිතව ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ච) අධිකාරිය විසින් බදු දීමට හෝ වෙනත් ඵලදායී කාර්යයකට යොදාගැනීමට අපේක්ෂිත වුවත්, රු.මිලියන 2,997 ක් වටිනා අක්කර 29 රූඩ් 03 පර්චස් 9.39 ක් වන ඉඩම් කැබලි 05 ක් මෙතෙක් අපේක්ෂිත අරමුණට යොදා නොගෙන පැවතුණි.

(ජ) උතුරු නැගෙනහිර පිවිසුම් කලාප සංකල්පය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ ඇ.ඒ.ජ ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට ගිවිසුම් ගත වී තිබුණි. නමුත් එම ණය මුදල ප්‍රමාණවත් නොවේ යැයි පුරෝකථනය කර ඇ.ඒ.ජ ඩොලර් මිලියන 16.23 ක අතිරේක මුදලක් සමඟ ඇ.ඒ.ජ ඩොලර් මිලියන 61.5 ක් දක්වා එම ණය මුදල ඉහළ නංවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ඉන්දියානු රජය එය අනුමත කර නොතිබුණි. එබැවින් වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් ඇ.ඒ.ජ ඩොලර් මිලියන 0.905 (ඇ.ඒ.ජ ඩොලර් 905,194.38) ක් පමණක් වැයකර තිබුණු අතර ලබා නොගත් ණය සඳහා කැපකිරීමේ ගාස්තු (Commitment charges) ලෙස ඇ.ඒ.ජ ඩොලර් 32,048.73 (රු.මිලියන 9.2) ක මුදලක් සහ ණය පොළිය ලෙස ඇ.ඒ.ජ ඩොලර් 37,042.48 (රු.මිලියන 11.14) ක මුදලක් ද අනාවරිත වියදමක් වී තිබුණි.

(ඣ) 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 2 (1) (අ) වගන්තිය අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රු.මිලියන 2000 ක් ඉක්මවනු ලබන තනි පුද්ගලයන්ගේ, හවුල් ව්‍යාපාර හෝ සමාගමක, බදු අය කළ හැකි ආදායම මත සියයට විසිපහක ප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතුය. 2020/21 වර්ෂයේ අධිකාරියේ බදු අයකළ හැකි ආදායම වන රු.මිලියන 4,787.77 මත ගණනය කළවිට අධිභාර බද්ද රු.මිලියන 1,196.94 වුවද, අධිකාරිය රු.මිලියන 1,952.2 ක් අධිභාර බදු ලෙස ගෙවා තිබුණි. තවද මෙලෙස වැඩිපුර ගෙවූ රු.මිලියන 755.33 ක මුදල 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ට) 2023 දෙසැම්බර් 31 දිනට පූර්ව වර්ෂවලට අදාලව ලද අනෙකුත් පර්යන්තයන් ද ඇතුලුව නිරවුල් නොකරන ලද මුළු වෙන්දේසි ආදායම රු.මිලියන 189.42 ක් විය. එම ශේෂය තුළ වෙනත් පර්යන්ත සහ ආයතනවලට ගෙවීමෙන් පසු අධිකාරියේ ආදායම් ලෙස හඳුනාගත යුතු වර්ෂ 2 ඉක්ම වූ වෙන්දේසි විකුණුම් මුදල් ලැබීම් රු.මිලියන 83.86 ක් වී තිබුණි.

(ඩ) ත්‍රිකුණාමලය වරායේ අළුත්වැඩියා කර භාවිතයට ගැනීම ආර්ථිකමය වශයෙන් ඵලදායී වන පිරිවැය රු.මිලියන 2.3 ක දියත් යාත්‍රා (Pilot launches) 03 ක් (රජරට, Pilot 01 හා Alphred) අළුත්වැඩියා කිරීමකින් තොරව දීර්ඝ කාලයක් තිස්සේ භාවිතයෙන් ඉවත්කර තිබූ අතර ගිනි නිවීමේ උපකරණයන් ද වරාය පරිශ්‍රයේ නිශ්කාර්‍යව පැවතුණි. මෙම වත්කම් ස්ථාවර වත්කම් රෙජිස්ටරයේ ඇතුළත්ව නොතිබුණි.

(ණ) ත්‍රිකුණාමලය වරායේ ඉඩම්වල 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අනවසර පදිංචිකරුවන්ට එරෙහිව 2023 ජූලි 10 දින වන විට පවරන ලද නඩු සංඛ්‍යාව 147 ක් වූ අතර කාලච්ඡේදය තුළ ඉවත් වූ පදිංචිකරුවන් ගණන 110 ක් විය. එසේම, ඉදිරියේදී නඩු පැවරීමට යෝජිත පිරිස 46 ක් වූ අතර අධිකරණයේ ඉවත්කිරීම් නියෝග ලබාදී තිබියදී ඉවත් නොවූ පිරිස 36 ක් ද විය. තවද, ත්‍රිකුණාමලය වරායට අයත් හෙක්ටයාර් 1,871 ක් වූ විශාල ඉඩම් කට්ටි 04 ක් ආර්ථිකමය වශයෙන් භාවිතයට නොගෙන පැවතුණි.

(ත) 2019 දෙසැම්බර් 04 වන දින නෞකාවක් කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්තයෙහි ගැටීම නිසා සිදුවූ අනතුර හේතුවෙන් ජය බහාලුම් පර්යන්තයේ ජල වාරකය (Caisson), වේග වළක්වනය (Fenders), වරාය වේදිකා බිත්තිය (Quay wall) යනාදියට හානි සිදුවී තිබුණි. එම හානිය රු.මිලියන 315.90 ක් ලෙස ඇස්තමේන්තුකර තිබුණි. එසේම ඉහත හානිය වෙනුවෙන් රු.මිලියන 384.42 ක මුදලක් 2019 දෙසැම්බර් 30 දින අධිකාරිය වෙත ලැබී තිබුණ ද වේග වළක්වනය හැර අනෙකුත් අළුත්වැඩියා කිරීමේ කටයුතු මෙතෙක් සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

නම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ව්‍යවස්ථානුකූල කාර්ය තත්ත්වය

1979 අංක 51 දරණ පාර්ලිමේන්තු පනතේ ප්‍රතිපාදන යටතේ කොළඹ වරාය කොමිසම, වරාය(නැව්බඩු) සංස්ථාව, වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට 1979 අගෝස්තු 1 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ථාපනය කරන ලදී.

අපගේ ආයතනික අගය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වූ කලී ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ප්‍රධාන දායකත්වය සපයන ආයතනයන්ගෙන් එකකි. ආදායම් උත්පාදනය කරන සහ සේවා සපයන ප්‍රමුඛ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය එමගින් සපයන සේවාවන්ගේ විශිෂ්ටත්වය සමඟ සෘජුවම බැඳී පවතී. මේ සම්බන්ධයෙන් ගත් කල අධිකාරියේ ඇගයීම් රටාව පරදුභාරකරුවන් සමඟ එහි ඇති මෙහෙයුම් සබඳතාවයේ සාර්ථකත්වයට පදනම වේ. මෙම අගයයන්/ වටිනාකම් පහත පරිදි වර්ග කල හැක.

- විශ්වාසය තැබිය හැකි බව
- කාලානුරූපී බව සහ නිවැරදි බව
- අත්කරගත් ජයග්‍රහණ සඳහා වගවීම
- කණ්ඩායම් හැඟීම
- කැපවීම
- ඵලදායීබව සහ පිළිගැනීම
- සෘජුව කටයුතු කිරීම

ඉහත සඳහන් වටිනාකම්/අගයයන් අධිකාරියේ සෑම මට්ටමකම ප්‍රගුණ කරවීම සභාපති/විධායක නිලධාරී, කළමනාකාර අධ්‍යක්ෂ සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලයේ වගකීම වනු ඇත.

ප්‍රධාන කාර්යාලය
කොළඹ වරාය

අංක 19, චෛත්‍ය පාර
කොළඹ – 01
දුරකථන: (+94 11) 2421201, 2421231
ෆැක්ස්: (+94 11) 2440651

ගාලු වරාය

ක්ලෝසන්බර්ග් ජැටිය
මාගාල්ල
ගාල්ල
දුරකථන: (+94 91) 2232213, 2234936

ත්‍රිකුණාමලය වරාය

නව ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල
චීන වරාය
ත්‍රිකුණාමලය
දුරකථන: (+94 26) 2222460

බැංකුකරුවන්

ලංකා බැංකුව (ප්‍රධාන බැංකුව)
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

විගණනකරුවන්

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක. 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

වෙබ් අඩවිය/ විද්‍යුත් තැපෑල

www.slpa.lk/ info@slpa.lk